ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අටවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සැසිවාරය)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 109

2015 පෙබරවාරි සිට 2016 මැයි මස දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව
විසින් සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලදී සිදුවී
ඇති මූල්‍ය අක්‍රමිකතා සොයාබැලීම සඳහා විශේෂ කාරක
සභාවක් වශයෙන් කටයුතු කළ

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ

# වාර්තාව

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති**
**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින්**

2016 ඔක්තෝබර් මස 28 වැනි දින
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා ( සභාපතිතුමා)
2. ගරු රවුෆ් හකීම් මහතා
3. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
4. ගරු දයාසිරි ජයසේකර මහතා
5. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
6. ගරු රවින්ද්‍ර සමරවීර මහතා
7. ගරු සුජීව සේනසිංහ මහතා
8. ගරු වසන්ත අලුවිහාරේ මහතා
9. ගරු ලසන්ත අලගියවන්න මහතා
10. ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා
11. ගරු අජිත් පී.පෙරේරා මහතා
12. ගරු රන්ජන් රාමනායක මහතා
13. ගරු අශෝක් අබේසිංහ මහතා
14. ගරු අනුර දිසානායක මහතා
15. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
16. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
17. ගරු බිමල් රත්නායක මහතා
18. ගරු වීරකුමාර දිසානායක මහතා
19. ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
20. ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
21. ගරු එස්. ශ්‍රීතරන් මහතා
22. ගරු එම් ඒ. සුමන්තිරන් මහතා
23. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
24. ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා
25. ගරු හර්ෂණ රාජකරුණා මහතා
26. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

# පටුන

1. **කාරක සභාවේ වාර්තාව**

2. **ඇමුණුම්**

2.1. ඇමුණුම 01 -

2.1.1. ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2015 පෙබරවාරි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු කර තිබුණු භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් පිළිබඳව, 2016 ජූනි 29 වන දින විශේෂ විගණන වාර්තාව.

2.1.2. එම වාර්තාව නිකුත් කිරීමෙන් අනතුරුව 2016 සැප්තැම්බර් 23 දක්වා කාලය තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සහ විගණකාධිපති විසින් අනාවරණය කරගත් තොරතුරු අනුව එම වාර්තාවට කරන ලද යාවත්කාලීන කිරීම් ඇතුලත් වාර්තාව.

2.1.3. යාවත්කාලීන විගණන වාර්තාවේ ඇතුලත් එකිනෙක ඡේදයන්හි නිරවද්‍ය තාවය පරික්ෂා කිරීමේ උපලේඛනය (පිටුව ........ සිට ......දක්වා)

2.2. ඇමුණුම 2 - මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත් කරන ලද ත්‍රි පුද්ගල කමිටුවේ වාර්තාව

2.3. ඇමුණුම 3 - 2016 .07.05 වන දින මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට කරන ලද පැහැදිලි කිරීම (Power Point Presentation) (පිටුව ....... සිට .......දක්වා )

2.4. ඇමුණුම 4 - 2016.ජුලි .07 දින මහ බැංකුවේ නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි (පිටුව ....... දක්වා)

2.5. ඇමුණුම 5 - 2016.අගෝස්තු.12 දින මහ බැංකුවේ නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි (පිටුව ........ දක්වා)

2.6. ඇමුණුම 6 - 2016 සැප්තැම්බර් 08 දින මහ බැංකු නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි (පිටුව ......... දක්වා)

2.7. ඇමුණුම 7 - 2008 ජනවාරි 07 හා 2008 ඔක්තෝබර්07 දිනයන්හි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල පත්‍රිකාව සහ මුදල් මණ්ඩල සටහන් පත්‍රය ( පිටුව ....... දක්වා)

2.8. ඇමුණුම 8 - මහ බැංකුවේ රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අත්පොතෙන් උපුටා ගන්නා ලද කොටස්.(පිටුව ....... දක්වා)

2.9. ඇමුණුම 9 - 2015- 2016 වසර වල මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන යෝජිත ඉදිරි වැඩ පිළිවෙල. (පිටුව ..... සිට ...... දක්වා )

2.10. ඇමුණුම 10 - 2015 පෙබරවාරි සිට 2016 මැයි දක්වා කාලය තුල ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විශේෂ වාර්තාව සඳහා මහ බැංකු අධිපති ඉදිරිපත් කරන ලද පිළිතුරට විගණකාධිපතිගේ අදහස් දැක්වීම. (පිටුව ....... දක්වා)

2.11. ඇමුණුම 11 - කාරක සභාව විසින් මහ බැංකුව වෙතයොමු කරන ලද ප්‍රශ්නාවලිය සහ ඒ සඳහා ලබා දෙන ලද පිළිතුරු (පිටුව ...... දක්වා)

2.12. ඇමුණුම 12 - කාරක සභාව විසින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ප්‍රශ්ණාවලිය සහ ඒ සඳහා ලබා දෙන ලද පිළිතුරු (පිටුව ...... දක්වා)

2.13. ඇමුණුම 13 - 2016.06.08 දින මහ බැංකු නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි සටහන් (පිටුව .....දක්වා)

2.14. ඇමුණුම 14 - 2016.09.23 දින පැවති කාරක සභා රැස්වීමේ පදානුගත වාර්තාව (Verbatim Report) (පිටුව ..........)

2.15. ඇමුණුම 15 - 2016.10.05 දින පැවති කාරක සභා රැස්වීමේ පදානුගත වාර්තාව (Verbatim Report) (පිටුව ..........)

2.16. ඇමුණුම 16 - 2015 පෙබරවාරි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකර තිබූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සකස් කොට 2016 සැප්තැම්බර් මස 23දින කාරක සභාවට ඉදිරිපත් කරන ලද ලද පළමු කෙටුම්පත් වාර්තාව (පිටුව ........)

2.17. ඇමුණුම 17 - 2016 සැප්තැම්බර් මස 25 වන දින සන්ඩේ ඔබ්සවර් පුවත්පතේ පළවූ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මූල්‍ය ප්‍රකාශනය

2.18. ඇමුණුම 18 - පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙනුවෙන් මහ බැංකු බැඳුම්කර මිලදී ගැනීම සඳහා ලංකා බැංකුවේ මැදිහත්වීම සම්බන්ධයෙන් අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තාව

2.19. ඇමුණුම 19 - 2016.10.20 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report)

2.20. ඇමුණුම 20 - 2016.10.21 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report

2.21. ඇමුණුම 21 - 2016.10.24 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report)

2.22. ඇමුණුම 22 - 2016.10.26 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report)

2.23. ඇමුණුම 23 - 2008 වසර සඳහා මහ බැංකු මූල්‍ය මණ්ඩල තීරණ / මහ බැංකු වෙබ් අඩවියේ බැඳුම්කර වල මූලික ලක්ෂණ පිළිබඳ පැහැදිලි කර ගැනීම

2.24. ඇමුණුම 24 - 2015 පෙබරවාරි 27 දින ලංසු වාර්තාව

2.25. ඇමුණුම 25 - ආචාර්ය අසීම් මහතාගේ වාචික සාක්ෂි

වාර්තාව

2015 පෙබරවාරි මස සිට 2016 මැයි මස දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා සොයාබැලීම සඳහා විශේෂ කාරක සභාවක් වශයෙන් කටයුතු කළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව අටවැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති වශයෙන් අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

මෙම කාරක සභාවේ පාද සටහන් නොමැති වාර්තාවට කාරක සභාවේ මතු නම් සඳහන් මන්ත්‍රීන් 15 දෙනා එකඟ වූහ.

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා ( සභාපතිතුමා)
2. ගරු රවුෆ් හකීම් මහතා
3. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
4. ගරු දයාසිරි ජයසේකර මහතා
5. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
6. ගරු ලසන්ත අලගියවන්න මහතා
7. ගරු අනුර දිසානායක මහතා
8. ගරු චන්ද්‍රසිරි ගජධීර මහතා
9. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
10. ගරු බිමල් රත්නායක මහතා
11. ගරු වීරකුමාර දිසානායක මහතා
12. ගරු එස්. ශ්‍රීතරන් මහතා
13. ගරු එම් ඒ. සුමන්තිරන් මහතා
14. ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා
15. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

මෙම කාරක සභාවේ පාද සටහන් සහිත වාර්තාවට කාරක සභාවේ මතු නම් සඳහන් මන්ත්‍රීන් 9 දෙනා එකඟ වූහ.

1. ගරු රවින්ද්‍ර සමරවීර මහතා
2. ගරු සුජීව සේනසිංහ මහතා
3. ගරු වසන්ත අලුවිහාරේ මහතා
4. ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා
5. ගරු අජිත් පී.පෙරේරා මහතා
6. ගරු අශෝක් අබේසිංහ මහතා
7. ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
8. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
9. ගරු හර්ෂණ රාජකරුණා මහතා

මෙම වාර්තාවේ අවසානයට ඇති නිර්දේශ සඳහා කාරක සභාවේ ඉහත නම් සඳහන් සභික මන්ත්‍රීන් සියළු දෙනාම ඒකමතිකව එකඟත්වය පළ කළහ.

**සුනිල් හඳුන්නෙත්ති**

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති**

<u>සභාපතිතුමාගේ සටහන</u>

2015 පෙබරවාරි මස සිට 2016 මැයි මාසය දක්වා කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ සිදුවූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳව විමර්ශනය කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට පැවරුණු කර්තව්‍යය ඉතා සංකීර්ණ සහ අතිශය වගකීම් සහගත පරීක්ෂණයක් විය. මෙම පරීක්ෂණය අප කාරක සභාවේ සභික මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකාරිත්වය පමණක් නොව හෘද සක්ෂිය පිළිබඳවද පරීක්ෂණයක් විය.

මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුව යනු සාමාන්‍ය වෙනත් රාජ්‍ය ව්‍යාපාරයක සිදුවූ සාමාන්‍ය මූල්‍ය ගනුදෙනුවක් නොව රාජ්‍ය භාණ්ඩාගාරයට සෘජුව වග කියන බැංකු වල බැංකුව වන ශ්‍රී ලංකා මහ බැංකුව අරභයා මතු වූ ගැටලුවකි. එසේම එම ගනුදෙනුව හරහා රජයට සිදුවූ හෝ සිදුවිය හැකි පාඩුව හුදෙක් මූල්‍ය වටිනාකමක් ඉක්මවන රටේ මූල්‍ය පාලනයේ ඉදිරි පැවැත්ම පිළිබඳව ප්‍රශ්නයකි. එසේම අප කාරක සභාවේ සීමාවන් ඉක්මවන දේශපාලන සංවාදයක්ද මෙම බැඳුම්කර ක්‍රියාවලිය හරහා රට තුළ ජනමාධ්‍ය හරහා මතුවිය. එනම්, මහ බැංකු බැඳුම්කර වංචාවේ දූෂිතයින් හෙළිදරව් කර ජනතාවගේ මහජන මුදල් වංචා කිරීමට එරෙහිව නීතිමය කටයුතු කිරීමට පාර්ලිමේන්තුවට විධිමත් වාර්තාවක් සැපයීමට කාරක සභාව සමත් වේද යන්නය. එය සංකීර්ණ වූත් දුෂ්කරතා සහිත අභියෝගයක් විය. නමුත් එය අනගි දේශපාලන අත්දැකීමක් සහිතව නිමකිරීමට අපි සමත් වී ඇත්තෙමු.

ජනතාව සතු පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නැගීමේ බලය, ජනතාව විසින් පවරා ඇත්තේ පාර්ලිමේන්තුවටය. පාර්ලිමේන්තුව සතු එම ජනතා බලය, මූල්‍ය පාලනය අරභයා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් ක්‍රියාවට නඟමින් සිටිමු. මෙම බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව පරීක්ෂණය ජනතා බලයේ පරීක්ෂණයකි. පරමාධිපත්‍යය පිළිබඳව පරීක්ෂණයකි. එනිසා අප ඉටු කර ඇත්තේ තනි තනි පුද්ගලයින්ගේ වුවමනාවක් ඉටු කිරීම නොව පොදු ජනතා අභිලාෂයක් ක්‍රියාවට නැඟීමයි. එම නිසා දීර්ඝ වාද විවාද අවසානයේ බඳු ගෙවන ජනතාවට සාධාරණ ලෙස මෙම පරීක්ෂණය අවසන් කර අද දින පාර්ලිමේන්තුව හමුවේ තබමි. තනි තනි පුද්ගලයින්ගේ අභිලාෂයන්ට හෝ ඔවුන්ගේ බලයේ තරමට නොව පොදු ජනතාවගේ පරමාධිපත්‍ය බලයට සාධාරණය ඉටු කිරීමට පමණක් අප බැඳී ඇති බව සිහියේ තබා ගනිමින් මෙම පරීක්ෂණය අවසන් වන තෙක් මා විසින් මෙහෙයවන ලදී. එම දුෂ්කර වැයම අවසාන මොහොතේදී සාර්ථක

ප්‍රතිඵල ලබා අවසන් කිරීමට මට හැකි විය. එය පාර්ලිමේන්තුව තුලින් දූෂණ විරෝධී සටන ජයගත් ඓතිහාසික මොහොතකි. මෙය ලංකාවේ දූෂණ විරෝධී සියලු බලවේගයන්ට ජවය සැපයීමක් වනු නොඅනුමානය.

මූල්‍ය පාලනය කෙරෙහි පාර්ලිමේන්තුව සතු බලය දුර්වල වීමට ඉඩ නොතැබීම සියලු මහජන නියෝජිතයින්ගේ පරම වගකීමයි. රජයට, මහ බැංකුවට මෙම බැඳුම්කර ගනුදෙනුව මගින්ද අවම පිරිවැයක් වග බලා ගැනීම සහ අවම අවදානමක් යටතේ කටයුතු කිරීම මහ බැංකුවේ නිලධාරීන් විසින් නිසි පරිදි ඉටු කර තිබේද යන්න විමර්ශනය කිරීම අපගේ පළමු වගකීමක් ලෙස සළකා කටයුතු කළෙමු. එසේම, ඒ සඳහා පදනම ලෙස විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ හා නිගමන ද පදනම් කර ගන්නා ලදී.

අද සභාගත කරන මෙම වාර්තාව සහ සියලු ඇමුණුම් සාක්ෂි සටහන් හොඳින් අධ්‍යනය කරන ලෙස සියලු ජනතාවගෙන්ද විශේෂයෙන් අධ්‍යාපනය ලබන දූදරුවන්ගෙන්ද වෘත්තීයවේදීන්ගෙන්ද මම ඉල්ලා සිටිමි. එවිට එම මහජන මුදල් පැහැරගත් දූෂිතයින් සහ දූෂිතයින් රකින්නන් ඔබට හමු වනු ඇත. දූෂිත බැඳුම්කර ගනුදෙනුවේ පරීක්ෂණය අප අද අවසන් කර ඇත. සියළු රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය මූල්‍ය පාලන ආයතන වෙත පූර්වාදර්ශයක් සිදුවන ලෙස සාර්ථකව මෙම පරීක්ෂණය අවසන් කිරීමට මෙහෙයවීම මාගේ වගකීම විය. එම කාර්යය සාර්ථකව ඉටු කල බව මාගේ හෘද සාක්ෂිය සහ විෂය දැනුමට අනුව මම විශ්වාස කරමි.

මෙම විමර්ශනය පිළිබඳව තම අභිමතය පරිදි මත පළ කළ සියලු දෙනාටත්, මෙම ක්‍රියාවලිය බාහිරින් සිට විවිධ විවේචන එල්ල කරමින් අප දිරිමත් කළ හැම දෙනාටත් ධෛර්ය සපයමින් මෙම ක්‍රියාදාමය අවසන් කිරීමට සහය පලකළ විගණකාධිපතිතුමා ඇතුළු කාර්යමණ්ඩලයේ හැමදෙනාටත් කතානායකතුමා ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටමත් දූෂණ විරෝධී සමාජයක් අපේක්ෂා කරමින් අප දිරිමත් කළ සියළු දෙනාටමත් මම ස්තූතිය පළකරමි.

**සුනිල් හඳුන්නෙත්ති**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති**

**2015 පෙබරවාරි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කර තිබූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සකස් කරන ලද වාර්තාව**

මෙම වාර්තාව 2015-2016 වසර තුළ මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධයෙන් විගණකාධිපති විසින් විගණනය කොට පිළියෙල කරන ලද විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් වූ කරුණුද, එම වාර්තාව සම්බන්ධයෙන් මහ බැංකු අධිපතිවරයාගෙන් ලබා ගන්නා ලද පිළිතුරුද, පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් මුදල් අමාත්‍යාංශයට හා ශ්‍රී ලංකා මහ බැංකුවට යොමු කරන ලද ලිඛිත ප්‍රශ්න වලට පිළිතුරුද මුදල් අමාත්‍යාංශයේ හා ප්‍රතිපත්ති සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් ලද ප්‍රකාශයන්ද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවා ලබා ගත් වාචික සාක්ෂි මඟින් අනාවරණය වූ කරුණුද සම්පිණ්ඩණය කොට පිළියෙල කරන ලද්දකි.

## 1 හැඳින්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් 2015 පෙබරවාරි මස 27 දින සිදු කරන ලද තිස් අවුරුදු බැඳුම්කර නිකුතුවේදී අක්‍රමිකතාවන් සිදුව ඇති බවත්, ඒ නිසා විශාල මූල්‍යමය පාඩුවක් රජයට හා රටට සිදුව ඇති බවත් පවසමින් 2015 පෙබරවාරි මාසයේදී එවකට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා ඇතුළුව මන්ත්‍රීවරුන් ගණනාවක් විසින් අත්සන් කරන ලදුව ඉදිරිපත් කරන ලද, එවකට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා එම තනතුරෙන් ඉවත් කළ යුතු යයි රජයට සාමූහිකව බලකිරීමේ යෝජනාවක්, 2015 මැයි මස 08 වැනි දින නිකුත් කරන ලද අංක 14(1) දරණ පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයට දින නියමයක් නොමැති යෝජනාවක් වශයෙන් ඇතුලත් කරන ලදී.

ඒ පිළිබඳව සොයා බලා වාර්තා කිරිම පිණිස 2015 මැයි මාසයේදී ගරු අග්‍රාමාත්‍යතුමා විසින් නීතිඥ ගාමිණී පිටිපන, නීතිඥ මහේෂ් කළුගම්පිටිය සහ නීතිඥ චන්ද්‍රිමාල් මෙන්ඩිස් යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරන ලදී.

එකී ත්‍රිපුද්ගල කමිටු වාර්තාව ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා විසින් 2015 මැයි මස 19 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලදී. එකී වාර්තාව මෙම වාර්තාවේ **ඇමුණුම 2** වශයෙන් ඉදිරිපත් කොට ඇත.

න්‍යාය පුස්තකයට ඇතුලත් කරන ලද පෙර කී යෝජනාව පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අනු කාරක සභාවක් මඟින් පූර්ණ විමර්ශණයක් සිදුකිරිම වඩාත් යෝග්‍ය වනු ඇති බව ගරු කථානායකතුමා 2015 මැයි මස 20 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලදී.
මේ අනුව, 2015 මැයි මස 22 වන දින පාර්ලිමේන්තුවේදී රැස්වූ හත්වැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ද මේ පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් අතුරින් මන්ත්‍රීවරුන් 13 දෙනෙකුගෙන් සමන්විත පහත දැක්වෙන විශේෂ අනුකාරක සභාව පත් කරන ලදී.

**විශේෂ අනුකාරක සභාවේ සභික මන්ත්‍රීවරුන්**

ගරු ඩිව් ගුණසේකර මහතා (සභාපති)
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු රෝසි සේනානායක මහත්මිය
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු එම්.ටි හසන් අලි මහතා
ගරු (මහාචාර්ය)රජීව විජේසිංහ මහතා
ගරු ඊ. සරවනපවන් මහතා

එකී විශේෂ අනු කාරක සභාව ස්වකීය පළමුවැනි රැස්වීම පැවැත්වූ 2015 මැයි මස 22 වැනි දින සිට රැස්වීම් වාර **14ක්** පවත්වන ලද අතර, ඉන් රැස්වීම් **11** කදී සාක්ෂිකරුවන් **42** දෙනෙකුගෙන් වාචිකව සාක්ෂි විමසන ලදී. එම සාක්ෂිකරුවන්ගේ නාම ලේඛනය පහතින් ඉදිරිපත් කොට ඇත.

**2015 වසරේදී වාචික සාක්ෂි ලබා ගැනීම සඳහා 7 වන පාර්ලිමේන්තුවේ අනු කාරක සභාව ඉදිරියට කැඳවන ලද නිලධාරීන්**

| කැඳවූ දිනය | නම, තනතුර සහ ආයතනය |
|---|---|
| | |
| 26.05.2015 | ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග, භාණ්ඩාගාර ලේකම් |
| | ආචාර්ය එම්.එස්.ඩී. රණසිරි, අධ්‍යක්ෂ ජෙනරාල් - භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව |
| | |
| 29.05.2015 | රොනල්ඩ් සී. පෙරේරා මයා, ජනාධිපති නීතිඥ, සභාපති, ලංකා බැංකුව |
| | ජේ.ඩී.කේ. ධර්මපාල මයා, ප්‍රධාන ගනුදෙණුකරු, ලංකා බැංකුව |
| | යූ. එල්. මුතුගල මිය, වැඩ බලන අධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | ආචාර්ය එම්. ඉසෙඩ්. එම්. අසීම්, අතිරේකඅධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහා බැංකුව |
| 03.06.2015 | එච්. ඒ. කරුණාරත්න මයා, ලේකම් - මුදල් මණ්ඩලය සහ සහකාර අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | ආර්. ඒ. ජයතිස්ස මයා, මුදල් මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා මහ බැංකුව |
| | මනෝහාරී රාමනාතන් මිය, මුදල් මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | ඩී. එම්. ගුණසේකර මයා, සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව |
| | ඒ. ඩී. බී. තල්වත්ත මයා, ප්‍රධාන හවුල්කරු, අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගම |
| | එච්. එම්. ඒ. ජයසිංහ මයා, හවුල්කරු, අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගම |
| | වයි. ඒ. ද සිල්වා මිය, හවුල්කරු, අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගම |
| | ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ප්‍රදීප් එල්. පෙරේරා මයා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගම |

| | |
|---|---|
| | පී. ජී. තිසේරා මයා, හිටපු සහකාර සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව |
| | |
| 04.06.2015 | අශ්වින් ද සිල්වා මයා, සභාපති, ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| | එස්. ඩී. එන්. පෙරේරා මයා, ප්‍රධාන විධායක නිලධාරි / සාමාන්‍යාධිකාරී, ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| | පී. ඒ. ලයනල් මයා, භාණ්ඩාගාර ප්‍රධානී, ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| | ඩී. එල්. පී. අබේසිංහ මයා, ගනුදෙනුකරු , ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| | බී. පී. ජේ. ගුණසේකර මයා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී /ප්‍රධාන විධායක නිලධාරි, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය කළමනාකරණ සමාගම |
| | නිහාල් ජයමාන්න මයා, ජනාධිපති නීතිඥ, සභාපති, සෙලාන් බැංකුව |
| | සෝමදාස පලිහවඩන මයා, ප්‍රධාන ගනුදෙනුකරු, සෙලාන් බැංකුව |
| | එන්. වසන්ත කුමාර් මයා, සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව |
| | ක්ලයිව් ෆොන්සේකා මයා, භාණ්ඩාගාර ප්‍රධානී, මහජනබැංකුව |
| | ආර්. ඒ. ඒ. ජයලත් මයා, අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල |
| | එම්. එස්. කේ. ධර්මවර්ධන මයා, අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල |
| | ජේ. ඩී. එස්. ජේ. නානායක්කාර මයා, නියෝජ්‍ය අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල |
| | එස්. පතුමානපන් මයා, සහකාර අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල |
| | කසුන් පලිසේන මයා, ප්‍රධාන විධායක නිළධාරී, සී/ස පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම |
| | හරීන් නිශාන්ත මයා, වෙළඳ කළමණාකරු, සී/ස පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම |
| | |
| 05.06.2015 | බී. ඩී. ඩබ්ලිව්. ඒ. සිල්වා මයා, නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව |
| | පී. සමරසිරි මයා, නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව |
| | |
| 09.06.2015 | සී. එම්. ඩී. එන්. කේ. සෙනෙවිරත්න මිය, අධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව |
| | ආචාර්ය එම්. ඉසෙඩ්. එම්. අසීම්, අතිරේක අධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව |
| | |
| 10.06.2015 | ඩී. එල්. පී. අබේසිංහ මයා, විධායක නිළධාරී, රජයේ සුරැකුම්පත් ගනුදෙනු, ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| | ඩබ්ලිව්. එම්. ආර්. බී. වීරකෝන් මයා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු ( ගනුදෙනු ), ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය කළමනාකරණ සමාගම |
| | කාවින්ද මෙවන් ගුණවර්ධන මයා, ජ්‍යෙෂ්ඨ වෙළඳඅගයන්, හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැංකින් කෝර්පරේෂන් |
| | ඩී. එන්. ආර්. සිරිවර්ධන මයා, සමාගම් රෙජිස්ට්‍රාර් |
| | |
| 11.06.2015 | අජිත් නිවාඩ් කබ්රාල් මයා, හිටපු අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | |
| 17.06.2015 | ජේ. කේ. ඩී. ධර්මපාල මයා, හිටපු ප්‍රධාන ගනුදෙණුකරු, ලංකා බැංකුව |
| | එන්. ඩබ්ලිව්. ජී. ආර්. ඩී. නානායක්කාර මයා, අධ්‍යක්ෂ, මූල්‍ය අංශ පර්යේෂණ, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | එල්. එස්. ෆර්නැන්ඩු මිය, කළමණාකරු, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | ආචාර්ය පී. එන්. වීරසිංහ මයා, නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | ඩී. එන්. ආර්. සිරිවර්ධන මයා, සමාගම් රෙජිස්ට්‍රාර් |

| | |
|---|---|
| | අර්ජුන් ජෝසප් ඇලෝෂියස් මයා, අධ්‍යක්ෂ, සී/ස ශ්‍රී ලංකා වෙළඳ සමාගම |
| | |
| 18.06.2015 | අර්ජුන මහේන්ද්‍රන් මයා, අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | එම්. එස්. එම්. පී. ෆර්නැන්ඩු, ජ්‍යෝෂ්ඨ කළමණාකරු, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | |
| 23.06.2015 | අර්ජුන මහේන්ද්‍රන් මයා, අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| 25.06.2015 | කාරක සභාවේ සභික මන්ත්‍රීන් පමණක් රැස් විය. |
| 26.06.2015 | කාරක සභාවේ සභික මන්ත්‍රීන් පමණක් රැස්විය. |

ඉන් අනතුරුව, අනු කාරක සභාව එම රැස්වීම් වාර 11 දී ඉදිරිපත්වූ එකී සාක්ෂි හා වෙනත් ලේඛන ගණනාවක් පිළිබඳව සලකා බලා විගණකාධිපති ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ ද සහාය සහ සහභාගිත්වය ඇතිව වාර්තාවක් කෙටුම්පත් කර අනු කාරක සභාවේදී සලකා බලන ලද අතර එම කෙටුම්පත පිළිබඳව එකඟතාවයකට පත්නොවීම සහ 2015.06.26 දින සිට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් එම වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගැන්වීමට නොහැකි විය.

ඉන් අනතුරුව 2015.09.01 දින පත්වූ අටවැනි පාර්ලිමේන්තුවේ දී ද මෙම කරුණ පිළිබද සාකච්ඡා කරන ලදුව, අටවැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මේ පිළිබඳව ආරම්භ කරන ලද පරීක්ෂණය යළි පැවැත්විය යුතු යයි එකඟතාවයකට පත්විණි.

**<u>8 වන පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව -</u>**

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (සභාපතිතුමා)
2. ගරු රවුෆ් හකීම් මහතා
3. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
4. ගරු දයාසිරි ජයසේකර මහතා
5. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
6. ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
7. ගරු සුජීව සේනසිංහ මහතා (2016.07.07 දින පත් කරන ලදී)
8. ගරු වසන්ත අලුවිහාරේ මහතා
9. ගරු ලසන්ත අලගියවන්න මහතා
10. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
11. ගරු අජිත් පී. පෙරේරා මහතා
12. ගරු රන්ජන් රාමනායක මහතා
13. ගරු අශෝක් අබේසිංහ මහතා
14. ගරු අනුර දිසානායක මහතා
15. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
16. ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා (2016.05.17 දින පත් කරන ලදී)
17. ගරු බිමල් රත්නායක මහතා
18. ගරු වීරකුමාර දිසානායක මහතා

19. ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
20. ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (2016.04.07 දින පත් කරන ලදී)
21. ගරු එස්. ශ්‍රීතරන් මහතා
22. ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
23. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
24. ගරු වේලු කුමාර් මහතා (2016.07.05 දින ඉල්ලා අස්වන ලදී)
25. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
26. ගරු ප්‍රසන්න රණතුංග මහතා (2016.04.07 දින පත් කරන ලදී - 2016.05.17 දින ඉල්ලා අස්වන ලදී)
27. ගරු හර්ෂණ රාජකරුණා මහතා
28. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ඒ අනුව, 2016.05.06 පැවැත්වූ රැස්වීමේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2015 වසරේ මුල් කාර්තුවේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතුව පිළිබඳව සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සියළු කරුණු පිළිබඳව සොයා බැලිය යුතු යයිද, ඉන්පසුව ඒ පිළිබඳව වාර්තාවක් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද සම්මත කළාය.

ඒ අනුව කාරක සභාව විසින් විගණකාධිපති වෙත ලබා දෙන ලද උපදෙස් අනුව මූලික වශයෙන් මේ සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කොට හා විමර්ශනය කොට විගණකාධිපති විසින් 'සංවේදී' කරුණු ද ඇතුලත් වාර්තාවක් 2016.06.29 දින ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාවේම 'සංවේදී' කොටස් ඉවත් කරන ලද වාර්තාව එදිනම කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ගරු කථානායකතුමා විසින් දීර්ඝ වශයෙන් කරුණු සලකා බැලීමෙන් පසුව, එකී 'සංවේදී' කරුණු ඇතුලත් සම්පූර්ණ වාර්තාවද කාරක සභාව වෙත 2016.09.23 දින ලබාදී ඇත. එකී සම්පූර්ණ වාර්තාව මෙම වාර්තාව සමග වෙනම වෙළුමක් වශයෙන් ඉදිරිපත් කොට ඇත.

මෙම කාලසීමාව අතරතුර දී ප්‍රශ්නයට තුඩුදුන් මහ බැංකු බැඳුම්කර නිකුතුව සිදුවූ කාලයේදී අධිපතිව සිටි අර්ජුන මහේන්ද්‍රන් මහතා මහ බැංකු අධිපති තනතුරේ කාල සීමාව ඉක්මවීම නිසා නැවත එම තනතුරට පත් නොකරන ලද අතර, ඒ වෙනුවට ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති තනතුරට පත්කරන ලදී.

අටවැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර, තවදුරටත් මහ බැංකු අධිපතිද ඇතුළුව සාක්ෂිකරුවන් 23 දෙනෙකුගෙන් වාචිකව සාක්ෂි විමසන ලදී. අටවැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියේ වාචිකව සාක්ෂි ලබා දුන් එකී සාක්ෂිකරුවන්ගේ නාම ලේඛනය පහතින් ඉදිරිපත් කොට ඇත.

| දිනය | කැඳවන ලද නිලධාරීන්ගේ නම් |
|---|---|
| | |
| 2016-06-08 | එම්.අයි.එම්. රෆීක්, ලේකම්, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | යූ.ජී. රත්නසිරි මහතා, අතිරේක ලේකම්, -එම- |
| | එස්.එම්. චන්ද්‍රපාල මහතා, ප්‍රධාන මුදල් නිලධාරි, -එම- |
| | ඩබ්ලිව්.එම්.ආර්. දිසානායක, ප්‍රධාන ගණකාධිකාරි, -එම- |
| | පී.ඒ. කාන්ති මිය, ප්‍රධාන විගණන නිලධාරි, -එම- |
| | ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා, ලේකම්, මුදල් අමාත්‍යාංශය |
| | එම්.එස්.ඩී. රණසිරි, අධ්‍යක්ෂ ජෙනරාල්, -එම- |
| | අර්ජුන මහේන්ද්‍රන් මහතා, අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | ආචාර්ය පී, එන්. වීරසිංහ මහතා, නියෝජ්‍ය අධිපති, -එම- |
| | පී. සමරසිරි මහතා, නියෝජ්‍ය අධිපති, -එම- |
| | එස්. ලංකාතිලක මහතා, නියෝජ්‍ය අධිපති, -එම- |
| | ටී.එච්.බී. සරත්චන්ද්‍ර මහතා, අධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, -එම- |
| | |
| 2016-06-29 | කාරක සභාව පමණක් රැස්විය - විගණකාධිපති විසින් මහ බැංකු බැඳුම්කර සම්බන්ධයෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද විශේෂ විගණන වාර්තාව පිළිබඳව සාකච්ඡා කිරීම. |
| | |
| 2016-07-07 | ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා, ලේකම්, භාණ්ඩාගාරය |
| | එම්.අයි.එම්. රෆීක්, ලේකම්, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | යූ.ජී. රත්නසිරි මහතා, අතිරේක ලේකම්, -එම- |
| | එස්.එම්. චන්ද්‍රපාල මහතා, ප්‍රධාන මුදල් නිලධාරි, -එම- |
| | ඩබ්ලිව්.එම්.ආර්. දිසානායක, ප්‍රධාන ගණකාධිකාරි, -එම- |
| | පී.ඒ. කාන්ති මිය, ප්‍රධාන විගණන නිලධාරි, -එම- |
| | එම්.එස්.ඩී. රණසිරි, අධ්‍යක්ෂ ජෙනරාල්, -එම- |
| | ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා, අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | මනෝහරී රාමනාදන් මහත්මිය, පත්කළ මුදල් මණ්ඩල සාමාජික, -එම- |
| | පී.එන්. වීරසිංහ මහතා, නියෝජ්‍ය අධිපති, - එම- |
| | පී. සමරසිරි මහතා, නියෝජ්‍ය අධිපති, -එම- |
| | එස්. ලංකාතිලක මහතා, නියෝජ්‍ය අධිපති -එම- |
| | එස්.එස්. රත්නායක, සහකාර අධිපති -එම- |
| | කේ.ඩී. රණසිංහ මහතා, සහකාර අධිපති, -එම- |
| | ආර්.ඒ.ඒ, ජයලත් මහතා, සහකාර අධිපති, -එම- |
| | පී.ඩබ්ලිව්.ඩී.එන්.ආර්. රොද්‍රිගු මහතා, අධ්‍යක්ෂ / දේශීය කටයුතු, -එම- |
| | සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මහත්මිය, අධ්‍යක්ෂ / තොරතුරු තාක්ෂණය, -එම- |
| | ටී.එච්.බී. සරත්චන්ද්‍ර මහතා, අධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, -එම- |
| | කේ.එම්.එම්. සිරිවර්ධන මහතා, අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ, -එම- |
| | යූ.එල්. මුතුගල මහත්මිය, අතිරේකඅධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, -එම- |
| | ආචාර්යඑම්. ඉසෙඩ්. එම්. අසීම් මහතා, අතිරේකඅධ්‍යක්ෂ, සංඛ්‍යා ලේඛන, -එම- |
| | කේ.ජී.පී. සිරිකුමාර මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ / නීති සහ පැමිණිලි -එම- |
| | |
| 2016-08-12 | ශාන්ත බණ්ඩාර මහතා , රාජ්‍ය ලේකම්, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | යූ.ජී. රත්නසිරි මහතා, අතිරේක ලේකම්, -එම- |
| | එස්.එම්. චන්ද්‍රපාල මහතා, ප්‍රධාන මුදල් නිලධාරි, -එම- |
| | ඩබ්ලිව්.එම්.ආර්. දිසානායක, ප්‍රධාන ගණකාධිකාරි, -එම- |

| | |
|---|---|
| | පී.ඒ. කාන්ති මිය, ප්‍රධාන විගණන නිලධාරි, -එම- |
| | ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා, අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | මනෝහරී රාමනාදන් මහත්මිය, පත්කළ මුදල් මණ්ඩල සාමාජික, -එම- |
| | සී.පී.ආර්. පෙරේරා මහතා, පත්කළ මුදල් මණ්ඩල සාමාජික, -එම- |
| | කේ.ඩී. රණසිංහ මහතා, සහකාර අධිපති, -එම- |
| | ආර්.ඒ.ඒ, ජයලත් මහතා, සහකාර අධිපති, -එම- |
| | කේ.එම්.එම්. සිරිවර්ධන මහතා, සහකාර අධිපති සහ අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ, -එම- |
| | පී.ඩබ්ලිව්.ඩී.එන්.ආර්. රොද්‍රිගු මහතා, අධ්‍යක්ෂ / දේශීය කටයුතු, -එම- |
| | සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මහත්මිය, අධ්‍යක්ෂ / තොරතුරු තාක්ෂණය, -එම- |
| | එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී. නානායක්කාර, අධ්‍යක්ෂ / මූල්‍ය අංශය පර්යේෂණ, -එම- |
| | ටී.එච්.බී. සරත්චන්ද්‍ර මහතා, අධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, -එම- |
| | කේ.එන්.එන්.එම්. බණ්ඩාර මහත්මිය, අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල, -එම- |
| | යූ.එල්. මුතුගල මහත්මිය, අතිරේකඅධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, -එම- |
| | ආචාර්ය එම්. ඉසෙඩ්. එම්. අසීම් මහතා, අතිරේකඅධ්‍යක්ෂ, සංඛ්‍යා ලේඛන, -එම- |
| | කේ.ජී.පී. සිරිකුමාර මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ / නීති සහ පැමිණිලි -එම- |
| | එස්. ඔබේසේකර මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, -එම- |
| | එස්. පතුමනාපන්, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, -එම- |
| | ඩබ්ලිව්.ජී.ආර්. හර්ෂප්‍රිය මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී, -එම- |
| | |
| 2016-08-23 | කාරක සභාව පමණක් රැස්විය - මහ බැංකු බැඳුම්කර සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව සකස් කිරීම සඳහා යෝජිත ඉදිරි වැඩ පිළිවෙල ගැන සාකච්ඡා කිරීම. |
| | |
| 2016-09-08 | ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා, අධිපති, ශ්‍රී ලංකා මහා බැංකුව |
| | |
| 2016-09-23 | කාරක සභාව පමණක් රැස්විය - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සකසනු ලැබූ තොරතුරු වාර්තාව ගැන සාකච්ඡා කිරීම. |
| 2016-10-05 | - කාරක සභාව පමණක් රැස්විය - -එම- |
| 2016.10.20 | - කාරක සභාව පමණක් රැස්විය - අවසන් කෙටුම්පත් වාර්තාව සලකා බැලීම සඳහා සහ අනුමත කිරීමට |
| 2016.10.21 | - කාරක සභාව පමණක් රැස්විය - අවසන් කෙටුම්පත් වාර්තාව සලකා බැලීම සඳහා සහ අනුමත කිරීමට |
| 2016.10.24 | - කාරක සභාව පමණක් රැස්විය - අවසන් කෙටුම්පත් වාර්තාව සලකා බැලීම සඳහා සහ අනුමත කිරීමට |
| 2016.10.26 | - කාරක සභාව පමණක් රැස්විය - අවසන් කෙටුම්පත් වාර්තාව සලකා බැලීම සඳහා සහ අනුමත කිරීමට |

මීට අමතරව මෙම වාර්තාව සැකසීමට උපයෝගී කර ගන්නා ලද ලිපිලේඛන හා අදාල නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවා මෙම ප්‍රස්තුත කාරණයට අදාලව ලබා ගන්නා ලද වාචික සාක්ෂි ඇතුලත් පදානුගත වාර්තාද(Verbatim Reports) පහත සඳහන් පරිදි ඇමුණුම් වශයෙන් මෙම වාර්තාව සමග ඉදිරිපත් කර ඇත.

1 **<u>ඇමුණුම 01</u>** - ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2015 පෙබරවාරි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු කර තිබුණු භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් පිළිබඳව, 2016 ජූනි 29 වන දින විශේෂ විගණන වාර්තාව නිකුත් කිරීමෙන් අනතුරුව 2016 සැප්තැම්බර් 23 දක්වා කාලය තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සහ විගණකාධිපති විසින් අනාවරණය කරගත් තොරතුරු අනුව එම වාර්තාවට කරන ලද යාවත්කාලීන කිරීම් ඇතුලත් වාර්තාව සහ යාවත්කාලීන විගණන වාර්තාවේ ඇතුලත් එකිනෙක ඡේදයන්හි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ උපලේඛනය (පිටුව ........ සිට ......දක්වා)

2 **<u>ඇමුණුම 2</u>** - මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත් කරන ලද ත්‍රි පුද්ගල කමිටුවේ වාර්තාව

3 **<u>ඇමුණුම 3</u>** - 2016 .07.05 වන දින මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට කරන ලද පැහැදිලි කිරීම (Power Point Presentation) (පිටුව ....... සිට .......දක්වා )

4 **<u>ඇමුණුම 4</u>** - 2016.ජුලි .07 දින මහ බැංකුවේ නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි*(පිටුව ....... දක්වා)*

5 **<u>ඇමුණුම 5</u>** - 2016.අගෝස්තු.12 දින මහ බැංකුවේ නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි*(පිටුව ........ දක්වා)*

6 **<u>ඇමුණුම 6</u>** - 2016 සැප්තැම්බර් 08 දින මහ බැංකු නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි*(පිටුව ......... දක්වා)*

7 **<u>ඇමුණුම 7</u>** - 2008. ජනවාරි 07 හා 2008 ඔක්තෝබර්07 දිනයන්හි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල පත්‍රිකාව සහ මුදල් මණ්ඩල සටහන් පත්‍රය *( පිටුව ....... දක්වා)*

8 **<u>ඇමුණුම 8</u>** - මහ බැංකුවේ රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අත්පොතෙන් උපුටා ගන්නා ලද කොටස්.*(පිටුව ....... දක්වා)*

9 **<u>ඇමුණුම 9</u>** - 2015- 2016 වසර වල මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන යෝජිත ඉදිරි වැඩ පිළිවෙල. *(පිටුව ..... සිට ...... දක්වා )*

10 **<u>ඇමුණුම 10</u>** - 2015 පෙබරවාරි සිට 2016 මැයි දක්වා කාලය තුල ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විශේෂ වාර්තාව සඳහා මහ බැංකු අධිපති ඉදිරිපත් කරන ලද පිළිතුරට විගණකාධිපතිගේ අදහස් දැක්වීම.*(පිටුව ....... දක්වා )*

11 **<u>ඇමුණුම 11</u>** - කාරක සභාව විසින් මහ බැංකුව වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලිය සහ ඒ සඳහා ලබා දෙන ලද පිළිතුරු *(පිටුව ...... දක්වා)*

12 **<u>ඇමුණුම-12</u>** - කාරක සභාව විසින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ප්‍රශ්ණාවලිය සහ ඒ සඳහා ලබා දෙන ලද පිළිතුරු *(පිටුව ...... දක්වා)*

13 **ඇමුණුම - 13** - 2016.06.08 දින මහ බැංකු නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවන ලද අවස්ථාවේදී ලබා දෙන ලද වාචික සාක්ෂි සටහන් *(පිටුව .....දක්වා)*

14 **ඇමුණුම -14** - 2016.09.23 දින පැවති කාරක සභා රැස්වීමේ පදානුගත වාර්තාව(Verbatim Report) (පිටුව ..........)

15 **ඇමුණුම -15** - 2016.10.05 දින පැවති කාරක සභා රැස්වීමේ පදානුගත වාර්තාව (Verbatim Report)(පිටුව ..........)

16 **ඇමුණුම -16** - 2015 පෙබරවාරි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකර තිබූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සකස් කොට 2016 සැප්තැම්බර් මස 23දින කාරක සභාවට ඉදිරිපත් කරන ලද ලද පළමු කෙටුම්පත් වාර්තාව (පිටුව ........)

17 **ඇමුණුම 17 -** 2016 සැප්තැම්බර් මස 25 වන දින සන්ඩේ ඔබ්සවර් පුවත්පතේ පළවූ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මූල්‍ය ප්‍රකාශනය

18 **ඇමුණුම - 18** - පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙනුවෙන් මහ බැංකු බැඳුම්කර මිලදී ගැනීම සඳහා ලංකා බැංකුවේ මැදිහත්වීම සම්බන්ධයෙන් අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තාව

19 **ඇමුණුම** - 19 - 2016.10.20 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report)

20 **ඇමුණුම** - 20 - 2016.10.21 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report)

21 **ඇමුණුම** - 21 - 2016.10.24 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report)

22 **ඇමුණුම** - 22 - 2016.10.26 දිනැති කාරක සභාවේ පදානුගත වාර්තාව (Verbatim Report)

23 **ඇමුණුම - 23** - 2008 වසර සඳහා මහ බැංකු මූල්‍ය මණ්ඩල තීරණ / මහ බැංකු වෙබ් අඩවියේ බැඳුම්කර වල මූලික ලක්ෂණ පිළිබඳ පැහැදිලි කර ගැනීම

24 **ඇමුණුම - 24** - 2015 පෙබරවාරි 27 දින ලංසු වාර්තාව

25 **ඇමුණුම - 25** - ආචාර්ය අසීම් මහතාගේ වාචික සාක්ෂි

## 2 ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් බැඳුම්කර නිකුතුව පිළිබඳව විමර්ශනය කිරීමට පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුව වාර්තාව -(ඇමුණුම - 2)

ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු සහ ළමා හා තරුණ කටයුතු සහ සංස්කෘතික අමාත්‍ය ධුර දරන ලදගරු අග්‍රාමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රු. බිලියන 01 ක බැඳුම්කර නිකුත් කිරීම සඳහා නිවේදනය නිකුත් කිරීමට හේතු වූ කරුණු හා එම කර්තව්‍යයට අදාල සිදුවීම් මාලාව හා සංඛ්‍යා ලේඛන පරීක්ෂා කොට වාර්තා කිරීමට හා 2012 ජනවාරි මස 01 දා සිට එම පරීක්ෂණය සිදු කරන ලද දින දක්වා රටේ මූල්‍ය ඉල්ලුම, බැඳුම්කර නිකුත් කිරීම, වෙන්දේසි කිරීම ආදී කටයුතු අධීක්ෂණය කොට විමර්ශනය කිරීම සඳහා නීතිඥ ගාමිණී පිටිපන මහතාගේ සභාපතිත්වයෙන් හා නීතිඥ මහේෂ්

කළුගම්පිටිය, නීතිඥ චන්දිමාල් මෙන්ඩිස් යන මහත්වරුන්ගේ සාමාජිකත්වයෙන් යුතුව ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරන ලදී. එම ත්‍රිපුද්ගල කමිටුව මගින් සකස් කරන ලද වාර්තාව ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා විසින් 2015.05.19 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. (ඇමුණුම - 2)

**ඉහත කී ත්‍රි පුද්ගල කමිටුව මගින් කරන ලද විමර්ශනය මගින් පහත සඳහන් කරුණු විශේෂයෙන් අවධාරණය කර තිබුණි.**

- Perpetual Treasuries සමාගමේ ලංසු තැබීමේ රටාව අනුව මෙම අවස්ථාවේ අනුමත ලංසුවලින් 50% ක් මිලට ගැනීම අසාමාන්‍ය තත්ත්වයක් බැවින් ඒ පිළිබඳ නිසි රාජ්‍ය අධිකාරියක් මගින් සම්පූර්ණ විගණනයක් සිදු කළ යුතු බව.
- ලංකා බැංකුවේ ගනුදෙනු කාමරයේ (Dealer Room) සිදුවන කටයුතු සම්බන්ධයෙන් ව්‍යවහාරික විගණනයක් (Forensic Audit) සිදු කිරීමට ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතු බව.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සම්බන්ධයෙන් හා ප්‍රාථමික ගනුදෙනුකරුවන් අතර සිදුකරන කාර්යයන් පාලනය කිරීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කිරීමේ විධිමත් යාන්ත්‍රණයක් නොපමාව ක්‍රියාත්මක විය යුතු බව
- ප්‍රාථමික ගනුදෙනුකරුවන් බොහෝ දෙනෙකු දැක්වූ අදහස් පරිදි මහ බැංකුවේ සංවේදී තොරතුරු සම්බන්ධ ලියකියවිලි ප්‍රසිද්ධියට පත්ව ඇති බව තම කමිටුවට නිරීක්ෂණය වී ඇති බව හා එසේ රහස්‍ය තොරතුරු පිටවී ඇත යන ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාවය සොයා බැලීමටද, මහ බැංකුවේ නිලධාරීන්ගේ කටයුතු සොයා බැලීම සඳහාද නිසි අධිකාරියක් මගින් පූර්ණ විභාගයක් කළ යුතු බව

ඉහත කී ක්‍රියාදාමය නිසා රටට යම් පාඩුවක් සිදුවීද යන්න සොයා බැලීමට රජයට හෝ පාර්ලිමේන්තුවට හෝ මහජන උන්නතිය තකා වෙනත් සංවිධානයකට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කිසිදු බාධාවක් නැති බව නීතිඥ ගාමිණී පිටිපන මහතාගේ සභාපතීත්වයෙන් යුතු ත්‍රි පුද්ගල කමිටුව තම වාර්තාව මගින් දැනුම් දෙන ලද අතර රටේ මුදල් පාලනයේ වගකීම හා පාරිශුද්ධභාවය සම්බන්ධයෙන් ජනතාව විසින් තබා ඇති අපේක්ෂා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒ අයුරින්ම ඉටු කර ඇත්ද යන්න පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සංඛ්‍යාංක හා පා සටහන් (Digital Foot Prints) පිළිබඳවද නිරීක්ෂණය කිරීම යෝග්‍ය වන බව පෙන්වා දී තිබුණි.

ඉහත කරුණු පදනම් කරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් නිසි රාජ්‍ය අධිකාරියක් මගින් පූර්ණ අධීක්ෂණයක් සිදු කළ යුතු බව ගරු අග්‍රාමාත්‍ය හා ප්‍රතිපත්ති සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් පත් කරන ලද ඉහත කී ත්‍රි පුද්ගල කමිටුව විසින් ද නිගමනය කොට තිබුණි.

## 3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හැඳින්වීම.

ශ්‍රී ලංකාවේ ආර්ථික හා මිල ස්ථායීතාවය පවත්වාගෙන යාමද මූලික අරමුණු ලෙස සලකා ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුව, පස් දෙනෙකුගෙන් සමන්විත මහ බැංකු මූල්‍ය මණ්ඩලයේ ප්‍රධානියාද වන මහ බැංකු අධිපති විසින් මෙහෙය වනු ලැබේ. ( ඇමුණුම 1හි ඇමුණුම VII බලන්න, පිටුව 67) තවද මුදල් නීති පනතේ 19 (1) වගන්තිය පරිදි මහ බැංකු අධිපති ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ. මහා භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ දැනුම් දීම මත රජයේ ඉදිරි මාසික මුදල් අවශ්‍යතාව සපුරාලීම සඳහා භාණ්ඩාගාර සුරකුම්පත් (Treasury Securities) එනම් භාණ්ඩාගාර බිල්පත් (Treasury Bills) හා භාණ්ඩාගාර බැඳුම්කර (Treasury Bonds) නිකුත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරණු ලබයි. (ඇමුණුම 1 හි ඇමුණුම ix - පිටුව 69 බලන්න) වර්ෂයකට වඩා අඩු කාලයකින් කල් පිරෙන (Maturity) අයුරින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලබන අතර වර්ෂයකට වැඩි දිගු කාලයකින් කල් පිරෙන අයුරින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරයි. මෙම බැඳුම්කරයක මුහුණත වටිනාකම (Face Value) රුපියල් 100 ක අගයක් ගනී. මෙහිදී මහ බැංකුව විසින් රජය වෙනුවෙන් මුදල් සපයාදීම සිදු කරනු ලබන අතර මුදල් නීති පනතේ 106 (1) වගන්තියට (ඇමුණුම 1 හි ඇමුණුමX බලන්න, පිටුව 70) අනුව ලංකා මහබැංකුව රජයේ නියෝජිතයකු ලෙස කටයුතු කරන බව දක්වා ඇත. මෙම සුරකුම් පත් මිලදී ගැනීම සඳහා සුදුසුකම්ලත් ආයතන 16 ක් 2015 වර්ෂය අවසාන විට ලියාපදිංචි කර තිබූ අතර 2016 වර්ෂයේදී ඉන් එක් ආයතනයක් ඉවත්ව ඇත. (ඇමුණුම 1 හි ඇමුණුමVI - බලන්න, පිටුව 65) එම ආයතන අතර රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන ද වේ. මෙම ආයතන ප්‍රාථමික ගනුදෙනුකරුවන් /වෙළඳුන් (Primary Dealers) ලෙස හඳුන්වනු ලැබේ. තවද සේවක අර්ථ සාධක අරමුදලටද ප්‍රාථමික වෙළඳපලෙන් භාණ්ඩාගාර සුරකුම්පත් මිලදී ගැනීමට අවසර ලබාදී තිබේ.

### 3.1 ශ්‍රී ලංකා මහ බැංකුව බැඳුම්කර නිකුත් කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේද

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 පෙබරවාරි මස 27 දින දක්වා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා ක්‍රමවේද 2 ක් අනුගමනය කර ඇත.

#### 3.1.1 පළමු ක්‍රමය (වෙන්දේසි ක්‍රමය)

භාණ්ඩගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමක් අනුව ඉහතින් සඳහන් කරන ලද ලියාපදිංචි ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගෙන් මිල ගණන් කැඳවා ඒ අනුව බැඳුම්කර වෙන්දේසි (auction) මගින් අවශ්‍ය මුදල් අවශ්‍යතා සපුරා ගැනීමයි.

## 3.1.2 දෙවැනි ක්‍රමය (ඍජු ක්‍රමය / පුද්ගලික නිකුතු ක්‍රමය)

ඍජුවම ප්‍රාථමික ගනුදෙනුකරුවන් හට සුරැකුම්පත් නිකුත් කිරීම හෙවත් පෞද්ගලික නිකුතු ක්‍රමයයි. මෙම දෙවන ක්‍රමයේදී සිදුවූයේ මහ බැංකුවේ ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද බර තැබූ සාමාන්‍ය ඉපයුම්/ඵලදා අනුපාතයක් (weighted Average Yield Rate) මත ප්‍රාථමික ගනුදෙනුකරුවන්ට බැඳුම්කර මිලදී ගැනීම සඳහා අවස්ථාව ලබාදීම වේ.

මෙහිදී මෙම බර තැබූ ඉපයීම් අනුපාතය ගණනය කිරීම ක්‍රම 2 ක් අනුව සිදු කරනු ලැබේ. එක් ක්‍රමයක් වන්නේ ආසන්නතම පෙර කාල සීමාව තුල සිදුකළ බැඳුම්කර වෙන්දේසියේදී සමාන කල් පිරීමේ කාලයක් (Maturity Period) සහිත බැඳුම්කර සඳහා ඉදිරිපත් කරන ලද ඵලදා අනුපාතයන්හි බරිත සාමාන්‍ය අගය ඵලදා අනුපාතය ලෙස ගැනීම වේ. අනෙක් ක්‍රමය වන්නේ ද්වීතියක වෙළඳපලේ (Secondary Market) පවතින සමාන පරිණත කාලයක් සහිත බැඳුම්කර ඵලදා අනුපාත පදනම් කරගෙන නැවත ඵලදා අනුපාත ගණනය කිරීමයි.

ඍජු නිකුතු ක්‍රමය වෙන්දේසි දින හැර අනෙකුත් සෑම වැඩ කරන දිනයකම විවෘතව පවතින අතර බැඳුම්කර මිලදී ගැනීමට කැමති ප්‍රාථමික ගනුදෙනුකරුවන්හට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පෙර තීරණය කරන ලද ඵලදා අනුපාතයන් යටතේ අලෙවියට ඇති බැඳුම්කර මිලදී ගැනීමට අයදුම් කළ හැකිය. භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවකදී අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අත්පොතෙහි (Operations Manual of Public Debt Department ) දක්වා තිබේ.

## 3.2 බැඳුම්කර නිකුත් කිරීම හා මූල්‍ය වෙළඳපල පොළී අනුපාතයෙහි බලපෑම

භාණ්ඩාගාර බැඳුම්කර පොලී අනුපාතයක් සමඟ (Coupon Rate / Interest Rate) විවිධ පරිණත කාලසීමාවන් සඳහා නිකුත් කරනු ලබයි. එලෙස නිකුත් කරනු ලබන බැඳුම්කරයේ මුහුණත වටිනාකමට අනුව පොලී අනුපාතය මත අර්ධ වාර්ෂිකව රජය විසින් පොලී ගෙවීම් කරනු ලබයි. (ඇමුණුම 1 හි ඇමුණුම XI බලන්න - පිටුව 71) බැඳුම්කර වෙන්දේසියන්හිදී ගනුදෙනුකරුවන් විසින්, මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන පොලී අනුපාතයක් මත පදනම්ව විවිධ මිල ගණන් යටතේ ලංසු ඉදිරිපත් කරනු ලබයි. එම ලංසු අධි මිලකට (premium) එනම් මුහුණත වටිනාකමට වඩා වැඩි මිලකට, සම මිලට (at par) එනම් මුහුණත වටිනාකමට සමාන වූ මිලකට සහ අව මිලකට (discount) එනම් මුහුණත වටිනාකමට වඩා අඩු වූ මිලකටද ඉදිරිපත් කරනු ලබයි. මෙහිදී ඔවුන් විසින් අධි මිලට ඉල්ලුම් කළහොත් බැඳුම්කරයේ ඵලදා අනුපාතිකය පොලී අනුපාතයට වඩා පහළ අගයක් ගන්නා අතර සම මිලට ඉල්ලුම් කළහොත් පොලී අනුපාතයට සමාන අගයක්ද අව මිලට ඉල්ලුම් කළහොත් පොලී අනුපාතයට වඩා ඉහළ අගයක්ද ගනු ලබයි. ඒ අනුව පොලී අනුපාතයට ඉහළින් ඇති ඵලදා අනුපාතිකයක් පවතින අවස්ථාවලදී බැඳුම්කර මුහුණත අගයට වඩා අව මිලකට නිකුත් වන බවත් පොලී අනුපාතය හා ඵලදා අනුපාතය සමාන වන විට බැඳුම්කර මුහුණත අගයට නිකුත් වන බවත්, පොලී අනුපාතයට වඩා පහලින් ඵලදා අනුපාතය පවතින අවස්ථාවලදී

මුහුණත අගයට ඉහල වූ අධි මිලකට නිකුත් වන බවත් දැක්විය හැක. ඒ අනුව පොලී අනුපාතයට වඩා අඩු ඵලදා අනුපාතයකට බැඳුම්කර නිකුත් කිරීම මගින් අධිමිලක් ලැබෙන අතර එයින් රජයට අමතර මූල්‍ය වාසියක් ලැබේ. එමෙන්ම පොලී අනුපාතයට වඩා වැඩි ඵලදා අනුපාතයකට **එනම් වට්ටම් අනුපාතයට බැඳුම්කර නිකුත් කිරීම හේතුවෙන් රජයට මූල්‍ය අවාසියක්ද සිදුවේ.** පොලී අනුපාතයට සමාන ඵලදා අනුපාතයකට බැඳුම්කර නිකුත් කළ හොත් රජයට අමතර වාසියක් හෝ අවාසියක් සිදු නොවේ.

ඉහත කී 3.2 ඡේදයට ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා, අජිත් පී.පෙරේරා, අශෝක් අබේසිංහ, සුජීව සේනසිංහ, හෙක්ටර් අප්පුහාමි, වසන්ත අලුවිහාරේ, හර්ෂණ රාජකරුණා යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එකඟ නොවූ අතර මෙම ඡේදය මතු දැක්වෙන පරිදි සංශෝධනය කළ යුතු බවට ඔවුන් එකඟ වූහ.

**එනම් වට්ටම් අනුපාතයට බැඳුම්කර නිකුත් කිරීම හේතුවෙන් රජයට මූල්‍ය අවාසියක්ද සිදුවේ.** යන කරුණට එකඟ නොවේ.

සමස්තයක් හැටියට වට්ටම් මිලකට බැඳුම්කරයක් නිකුත් කිරීම හරහා රජයට අවාසියක් /අලාභයක් සියලු අවස්ථාවල සිදුවේ යැයි යන ප්‍රකාශය පිළිගත නොහැක. එයට හේතුව අවුරුද්දකට අඩු බැඳුම්කරයක් (එනම් පොලියක් සඳහන් නොවන භාණ්ඩාගාර බිල්පතක්) මුහුණත අගයට විකිණිය නොහැක. අවුරුද්දකට වඩා වැඩි, බැඳුම්කරයකට පොලියක් නැතහොත් කූපන් එකක් අමුණා ඇත්නම් එය රුපියල් සියයක මුහුණත අගයට විකිණීමට හැකි වන්නේ බැඳුම්කරයක් හරහා ලැබෙන පොලිය වෙළෙඳපොලේ එම කාල පරාසයටම ද්විතීයික වෙළෙඳපොලෙන් ලැබෙන ඵලදා අනුපාතය හා සමාන නම් පමණයි. ද්විතියික වෙළෙඳපොලේ මෙම බැඳුම්කරයටම සමාන කාලයකින් ඉතිරිවී ඇති බැඳුම්කර ඇත්නම්, එම බැඳුම්කර වලට ද්විතියික වෙළෙඳපොලේ ලැබෙන ඵලදා අනුපාතය මේ බැඳුම්කරයේ පොලියට වඩා වැඩිනම්, එහිදී බැඳුම්කරය විකිණිය හැකි වන්නේ වට්ටමකටය. මුහුණත අගය සියයට අඩුද වැඩිද යන්න තීරණය වන්නේ මෙම බැඳුම්කරයට අදාල වන පොලී අනුපාතය සහ වෙළඳපලේ ඒ හා සමාන බැඳුම්කර වලට ඇති ඵලදා අනුපාතය මතයි.

**4 <u>භාණ්ඩාගර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව අනුගමනය කරන ලද ප්‍රතිපත්ති, ක්‍රියා මාර්ග හා නීතිමය පසුබිම.</u>**

4.1 <u>බැඳුම්කර නිකුත් කරනු ලබන්නේ වෙන්දේසි ක්‍රමය මගින්ද නැතහොත් සෘජු ක්‍රමය මගින්ද යන ප්‍රතිපත්තිමය තීරණය ගැනීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් පදනම් කරගන්නා ලද ලේඛන -</u>

ශ්‍රී ලංකා මහ බැංකුව බැඳුම්කර නිකුත් කිරීම ආරම්භ කර ඇත්තේ 1997 වසරේදීය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක MB/PD/05/18/97 ට (ඇමුණුම - 1 හි ඇමුණුම XII බලන්න - පිටුව 72 ) අනුව 1997 මාර්තු මාසයේ සිට භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි මගින් ප්‍රාථමික ගනුදෙනුකරුවන් වෙත නිකුත් කිරීමට තීරණය කර තිබුණු බවද වෙළඳපලේ අවශ්‍ය තරම් මුදල් නොමැති අවස්ථාවකදී හෝ පොලී අනුපාතය අසීමිතව ඉහල යන අවස්ථාවකදී වෙන්දේසි මගින් සපයා ගැනීමට නොහැකි වන අරමුදල් සපයා ගැනීම සඳහා සේවක අර්ථ සාධක අරමුදල යොදාගත යුතු බවද එම පත්‍රිකාවෙහි දක්වා ඇති බව 2015 – 2016 වසරතුල බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ විගණකාධිපති වාර්තාව (ඇමුණුම - 1 ) මගින් පෙන්වා දෙනු ලබයි.

4. 1.1 පසුව මුදල් මණ්ඩල පත්‍රිකා අංක MB/PD/1/26/2008 (2008.01.07) (ඇමුණුම - 7) මගින් 2008 වසරේදී සෘජු ක්‍රමය මගින් අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීමට[1] තීරණය කර තිබුණු බවත් පසුව මුදල් මණ්ඩල පත්‍රිකා අංක MB/PD/25/20/2008 (2008.10.07) (ඇමුණුම - 7) මගින්ද මුදල් මණ්ඩලය විසින් ද්විතියක වෙළඳපලේ පවතින පොලී අනුපාතවලට වඩා සියයට 0.05 ක් පමණ ඉහළ පොලී අනුපාතයන් සහිත බැඳුම්කර සේවක අර්ථ සාධක අරමුදලට නිකුත් කිරීම මගින් සහ එම තීරණයම දීර්ඝ කිරීම මගින් වෙළඳපල ද්‍රවශීලතාව ඇති කිරීම සඳහා වැඩිදුරටත් නිර්දේශ කර ඇත. [2]

4.1.2 MB/PD/25/20/2008 (2008.10.07) මුදල් මණ්ඩල තීරණයට Other Captive Sources යන අදහස ඇතුළත් වූයේ කෙසේද යන්න කාරක සභාව මගින් මහ බැංකු නිලධාරීන්ගෙන් විමසන ලද අතර සේවක අර්ථ සාධක අරමුදල් පමණක් නොව අදාළ කාලය තුළ රටේ මූල්‍ය අවශ්‍යතාවන් සපුරා ගතහැකි අනෙකුත් මූලාශ්‍රද (Other Captive Sources) සැලකිල්ලට ගතයුතු බව තීරණය වූ බව පෙන්වා දෙන ලදී.[3]

---

[1] මාස 3 ක කාලයකට

[2] මුදල් මණ්ඩල පත්‍රිකා අංක MB/PD/01/26/2008 හි *"The Monetary Board approval is sought for the proposed rate structure to be used for direct placements of treasury Bonds and Rupee loans in respect of captive investors such as EPF, NSB, and ETF during January - April 2008"* යනුවෙන් සඳහන් වේ.

මූල්‍ය මණ්ඩල පත්‍රිකා අංක MB/PD/11/16/2008 හා 2008.05.02 වන දින *"The Monetary Board approval is sought for the proposed rate structure to be used from Direct Placements of Treasury Bonds in respect of Captive type large investors such as EPF, NSB and ETF during May to December 2008 "* යනුවෙන් සඳහන් වේ.

දේශීය ණය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂවරිය මගින් 2016 ඔක්තෝම්බර් මස 24 වන දින පැවති කාරක සභා රැස්වීමට ෆැක්ස් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය මගින් පෙන්වා දෙන ලද්දේ, ඉහත සඳහන් පරිදි රජයේ හිමිකාරීත්වය දරන ආයතන ( captive sources ) සඳහා සෘජු ක්‍රමය මගින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා සහ ගෙවනු ලබන පොලී අනුපාත සඳහා මූල්‍ය මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී ඇත්තේ 2008 මැයි මස සිට දෙසැම්බර් මාසය දක්වා කාලය සඳහා පමණක් බවයි. ඒ සඳහා 2008 දෙසැම්බර් මාසයෙන් පසුව කාලය දීර්ඝ කිරීමක් සිදු කර නොමැති බව එම ලිපිය මගින් තවදුරටත් පෙන්වා දෙනු ලබයි.

(ඇමුණුම 23 - 2016 ඔක්තෝම්බර් මස 24 දිනැති මහ බැංකුවේ දේශීය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධිකාරීවරයෙකු අත්සන් කරන ලද ලිපිය)

[3] *"Except for the EPF, all other captive sources need to come to the auction through a primary dealer"* යනුවෙන් සඳහන් වන අතර ප්‍රාථමික ගැණුම් කරුවන්ට ඔවුන්ගේම ගණුදෙනු සඳහා සෘජු ක්‍රමය හරහා අවසර දීමක් ඇති බව සඳහන් නොවේ.

## 4.2 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැඳුම්කර නිකුත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මහ බැංකුවේ දේශීය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අත්පොත භාවිතය - [4]

ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් මෙම මෙහෙයුම් අත්පොත බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා පරිශීලනය කරනු ලබන බවත් එය අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ 2013 ජුලි 31 දින බවත් මහ බැංකු නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදී. [5] ශ්‍රී ලංකා මහ බැංකු මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන මහ බැංකුවේ ක්‍රියාකාරකම්වලට අදාල ප්‍රතිපත්තිමය තීරණයන් දේශීය ණය දෙපාර්තමේන්තුවට දැනුම් දීමෙන් පසු එම දෙපාර්තමේන්තුව විසින් මෙම මෙහෙයුම් අත්පොත සංශෝධනය කිරීම හෝ යාවත්කාලීන කිරීම් සිදු කරනු ලබන බවද ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් තවදුරටත් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බැඳුම්කර නිකුත් කිරීමේදී අනුගමනය කළ යුත්තේ ඍජු ක්‍රමයද, වෙන්දේසි ක්‍රමයද යන ප්‍රතිපත්තිමය තීරණය සම්බන්ධයෙන් උපයෝගී කර ගන්නා ලද ඉහත කී මෙහෙයුම් අත්පොතෙහි අදාල කරගත් කොටස් මෙම වාර්තාවෙහි ඇමුණුම් 8 වශයෙන් දක්වා ඇත.

කෙසේ වුවද 2008 ඔක්තෝබර් 07 දිනැති මුදල් මණ්ඩල පත්‍රිකාව අනුව මෙහෙයුම් අත්පොත මෙතෙක් සංශෝධනය වී නැති බව කාරක සභාව විසින් කරන ලද විමසීමකදී ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් විසින් පිළිගන්නා ලදී. කෙසේවුවද එකී මුදල් මණ්ඩල තීරණය මෙහෙයුම් අත්පොතෙහි අදාල වගන්ති මගින් ආවරණය වන බව තම අදහස යැයි මහ බැංකු අධිපතිවරයා විසින් කාරක සභාව කරන ලද විමසීම්වලදී ප්‍රකාශ කරන ලදී.

මෙම මෙහෙයුම් අත්පොතෙහි 8 වන පිටුවෙහි B (i) හි සඳහන් බැඳුම්කර නිකුත් කිරීමේදි ඍජු ක්‍රමය හා වෙන්දේසි ක්‍රමය අනුගමනය කළ යුතු ආකාරය පිළිබඳ කාරක සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්ගෙන් විමසීම් කරන ලද අතර මහ බැංකු නිලධාරීන්ට අනුව එහි *“as much as possible through auctions”* යන්න වෙන්දේසි ක්‍රමය හරහා කුමන ප්‍රමාණයක බැඳුම්කර ප්‍රමාණයක් නිකුත් කළ යුතුද යන්න තීරණය කරන බවත් එය පිරිවැය, අවදානම යන කරුණු මත තීරණය වන බවත් පෙන්වා දෙන ලදී. ඒ පිළිබඳ තවදුරටත් කරුණු දක්වමින් ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් සඳහන් කලේ, මහ බැංකුවේ දේශීය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ණය ලබා ගැනීමේ වැඩ සටහනෙහි මධ්‍යකාලීන ණය කළමනාකරණ ක්‍රමෝපායෙහි (Medium Term Debt Management Strategy) සඳහන් කරන උපදේශය පරිදි පිරිවැය හා අවදානම කෙසේ වේද යන්න නිර්ණය කරනු ලබන බවයි.

[4] දේශීය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අත්පොතෙහි 8 වන පිටුවෙහි B 1 හි සඳහන් බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රම වේදය මෙසේය.
*"Front Office has to make arrangements to meet financing needs as much as possible through auctions. The balance fund requirements of the government as indicated in the approved Borrowing program may be arranged through private placements with PDs."* එහෙත් මෙම ස්ථාවරයට මුල්‍ය මණ්ඩල අනුමැතියක් ලැබුණු බවට සාක්ෂි ඉදිරිපත් නොවිය.

[5] නමුත් ඒ ආකාරයට කාලානුරූපව යාවත්කාලීන වීමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

තවද මෙහෙයුම් අත්පොතෙහි 3 පිටුවෙහි මූල්‍ය සම්පාදනය කර ගැනීමේ ක්‍රමවේද ලෙස,

A. Auctions
B. Private Placements
C. Rupee Loans

යනුවෙන් සඳහන් වුවද එමගින් පළමුව වෙන්දේසි ක්රමයද දෙවනුව පුද්ගලික නිකුතු ක්‍රමයද තෙවනුව රුපියල් ණය වශයෙන් අනුගමනය කළ යුතු බවට අනුපිළිවෙලක් නොමැති බව මහ බැංකු නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදී.

තවද මෙහෙයුම් අත්පොතෙහි පළමු පිටුවෙහි සඳහන්*"The front office of the PDD is mainly responsible for mobilizing required funds for the government at the lowest possible cost with a reasonable degree of risk through implementation of domestic borrowing programme approved by the Monetary Board"* යන්න ගෙන හැර දක්වමින් රජයේ මුදල් අවශ්‍යතාව අවම පිරිවැයක් යටතේ සම්පාදනය කර ගත යුතු බව දක්වා ඇති බව එම නිලධාරීන් පෙන්වා දෙන ලදී. එහිදී රජයට හා මහ බැංකුවේ ක්‍රියාවලියට අවාසියක් නොවන ආකාරයට මූල්‍ය අවශ්‍යතාව සම්පාදනය කර ගතයුතු බව දක්වා ඇති බව ද පෙන්වා දෙන ලදී. [6]

---

[6] මුදල් මණ්ඩලයේ ක්‍රමවේදය හා මෙහෙයුම් අත්පොත අනුව වෙන්දේසි ක්‍රමය මගින් හැකිතාක් මූල්‍ය සම්පාදනය සිදු කළයුතු බවත් ඉතිරිය පෞද්ගලික නිකුතු ක්‍රමය මගින් සපුරා ගත යුතු බවත් සඳහන් වුවද එම අවස්ථාවේ තිබූ කරුණු අනුව විගණකාධිපතිවරයා විසින් සඳහන් කරන ආකාරයට නිවැරදි ක්‍රමය ලෙස සලකා ඇත්තේ පුද්ගලික නිකුතු බවත්, මෙම පරීක්ෂණයට විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කොට ඇති වාර්තාව මගින් පුද්ගලික නිකුතු ක්‍රමය පිළිගත් ක්‍රමය ලෙස කරුණු දක්වා ඇති බවත් පෙනී යයි.

මූල්‍ය මණ්ඩල පත්‍රිකා දෙක අනුව MB/PD /01 /26/2008 සහ MB/PD/11/16/2008 හදිසි අවස්ථාවකදී මාස 12ක කාලයකට (පළමුව මාස 04කට සහ පසුව මාස 08කට) ඍජු ක්‍රමය සඳහා අවසර ලබාදී ඇත. මෙම මූල්‍ය මණ්ඩල පත්‍රිකා මගින් අවසර ලබාදී ඇත්තේ EPF, ETF, NSB හිමිකරුවන්ගේ අයිතිය ආරක්ෂාවන පරිදි උද්ධමනයද සැලකිල්ලට ගිනිමින්ය. එහිදී විශේෂයෙන්ම සඳහන් කර ඇති කරුණ වන්නේ එම ඍජු නිකුත්කර ( captive sources) රජය හෝ රජය විසින් පාලනය කරන ආයතන වන EPF, ETF, NSB වැනි ආයතන වලට ලබා දීමටයි. එම ඍජු නිකුත් කර ප්‍රාථමික ගැනුම්කරුවන් හට ලබා දීමේ අවසරයක් ලබා දී ඇත්ද යන්න කිසිම ලියවිල්ලකින් පැහැදිලිව සඳහන් කර නැත. ඒ අනුව 2008 සිට 2015 දක්වා කාලය තුල පුද්ගලික ගැනුම්කරුවන්ට අවස්ථාව ලබාදී ඇත්දැයි පරීක්ෂා කළයුතුය.

### 4.3 2014 ජනවාරි - 2016 මැයි දක්වා රජයේ මුදල් අවශ්‍යතාවය බැඳුම්කර නිකුතුව මගින් සපුරා ගත් ආකාරය පිළිබඳ විශ්ලේෂණය

2014 ජනවාරි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා රජයේ මුදල් අවශ්‍යතාවය වෙන්දේසි ක්‍රමය හා සෘජු ක්‍රමය භාවිතයෙන් බැඳුම්කර නිකුත් කිරීම මගින් සපුරා ගත් ආකාරය පිළිබඳ විශ්ලේෂණයක් 2015- 2016 මහ බැංකු බැඳුම්කර සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් පහත සඳහන් පරිදි ඉදිරිපත් කරනු ලබයි.

| වර්ෂය හා මාසය | බැඳුම්කර නිකුත් කළ ක්‍රමවේදය හා වටිනාකම | | | නිකුත් කළ වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|
| | **වෙන්දේසි ක්‍රමය (Auction)** | **සෘජු ක්‍රමය (Direct Placement)** | **එකතුව** | **වෙන්දේසි ක්‍රමය (Auction)** | **සෘජු ක්‍රමය (Direct Placement)** |
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | % | % |
| 2014 ජනවාරි | 5.500 | 32.718 | 38.218 | 14 | 86 |
| 2014 පෙබරවාරි | 3.050 | 80.088 | 83.138 | 4 | 96 |
| 2014 මාර්තු | 5.000 | 130.117 | 135.117 | 4 | 96 |
| 2014 අප්‍රේල් | - | 120.373 | 120.373 | 0 | 100 |
| 2014 මැයි | 5.950 | 62.745 | 68.695 | 9 | 91 |
| 2014 ජූනි | - | 126.210 | 126.210 | 0 | 100 |
| 2014 ජූලි | 5.300 | 109.483 | 114.783 | 5 | 95 |
| 2014 අගෝස්තු | - | 44.230 | 44.230 | 0 | 100 |
| 2014 සැප්තැම්බර් | 2.950 | 72.458 | 75.408 | 4 | 96 |
| 2014 ඔක්තෝබර් | - | 22.617 | 22.617 | 0 | 100 |
| 2014 නොවැම්බර් | - | 13.788 | 13.788 | 0 | 100 |
| 2014 දෙසැම්බර් | 4.000 | 18.148 | 22.148 | 18 | 82 |
| 2015 ජනවාරි | - | 69.923 | 69.923 | 0 | 100 |
| 2015 පෙබරවාරි | 10.058 | 23.524 | 33.582 | 30 | 70 |
| 2015 මාර්තු | 171.659 | 14.144 | 185.803 | 92 | 8 |
| 2015 අප්‍රේල් | 44.306 | - | 44.306 | 100 | 0 |
| 2015 මැයි | 35.730 | - | 35.730 | 100 | 0 |
| 2015 ජූනි | 82.900 | - | 82.900 | 100 | 0 |
| 2015 ජූලි | 99.575 | - | 99.575 | 100 | 0 |
| 2015 අගෝස්තු | 100.578 | - | 100.578 | 100 | 0 |
| 2015 සැප්තැම්බර් | 57.576 | - | 57.576 | 100 | 0 |
| 2015 ඔක්තෝබර් | 55.811 | - | 55.811 | 100 | 0 |
| 2015 නොවැම්බර් | 20.594 | - | 20.594 | 100 | 0 |
| 2015 දෙසැම්බර් | 29.545 | - | 29.545 | 100 | 0 |
| 2016 ජනවාරි | 61.119 | - | 61.119 | 100 | 0 |
| 2016 පෙබරවාරි | 38.959 | - | 38.959 | 100 | 0 |
| 2016 මාර්තු | 135.667 | - | 135.667 | 100 | 0 |
| 2016 අප්‍රේල් | 30.44 | - | 30.440 | 100 | 0 |
| 2016 මැයි | 114.335 | - | 114.335 | 100 | 0 |

ඉහත වගුව අනුව 2014 ජනවාරි මාසයේ සිට, සෘජු ක්‍රමය තාවකාලිකව අත්හිටුවීමට ගත් තීරණය මුළුමනින්ම ක්‍රියාත්මක වූ 2015 අප්‍රේල් මාසය දක්වා වූ මාස 15 ක කාලය තුළ, සෘජු ක්‍රමය පමණක් යොදාගත් මාසයන්ද වෙන්දේසි ක්‍රමය පමණක් යොදා ගත් මාසයන් ද මෙම ක්‍රම දෙකම යොදාගත් මාසයන්ද, පැවති බව නිරීක්ෂණය වේ. කෙසේ වුවත් එම මාස 15 ක කාලය තුළ නිකුත් කළ සමස්ත බැඳුම්කරයන්ගෙන් සියයට 80 කට වඩා සෘජු ක්‍රමය යොදාගෙන නිකුත් කර තිබුණු බව වැඩි දුරටත් නිරීක්ෂණය වේ.

## 4.4 මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල් නීති පනතෙහි(Monetary Law Act) ඇතුලත් ප්‍රතිපාදන -

මුදල් නීති පනතෙහි (Monetary Law Act) හි ප්‍රතිපාදන (ඇමුණුම 1 හි ඇමුණුම vii) අනුව බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා බලය පැවරී තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලයට වන අතර මුදල් මණ්ඩලය ක්‍රියා කරනු ලබන්නේ පවත්නා රජය හා මුදල් අමාත්‍යවරයා මගින් යෝජනා කරනු ලබන රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය මත පිහිටා වන බව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා හා මහ බැංකු නිලධාරීන් විසින් කාරක සභාව විසින් කරන ලද විමසීම් වලදී පෙන්වා දෙන ලදී.

රජය මගින් රට තුල අනුගමනය කිරීමට යෝජිත මූල්‍ය ප්‍රතිපත්තිය දැනුම් දුන් පසු ඒ මත පදනම්ව වඩාත් නිවැරදි සුදුසුම ක්‍රමය අනුගමනය කරමින් රටේ මුදල් අවශ්‍යතාව සපුරා ගැනීමට මූල්‍ය මණ්ඩලය ක්‍රියා කරන බව දැනුම් දෙන ලදී. මූල්‍ය ප්‍රතිපත්තිය ලිඛිතව හෝ වාචිකව මුදල් මණ්ඩලයට සන්නිවේදනය විය හැකි බව කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් කරන ලද විමසීම් වලදී මහ බැංකු නිලධාරීන් විසින් තවදුරටත් පෙන්වා ලද අතර කෙසේ වුවද රජය විසින් ඉදිරිපත් මූල්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අවසාන අනුමැතිය ලබාදීම සඳහා බලය පැවරී ඇත්තේ මහ බැංකු මුදල් මණ්ඩලයට බව පෙන්වා දෙන ලදී.

මෙම ප්‍රශ්නගත ගනුදෙනුව පිළිබඳ මුදල් මණ්ඩලය විසින් තීරණයක් ගෙන නොමැති අතර 2016 මාර්තු 2 වන දින මුදල් මණ්ඩලයට කලින් ක්‍රියාත්මක කර තිබූ තීරණය දැනුම්දීමක් පමණක් සිදු කර ඇති බව කාරක සභාවට අනාවරණය විය.

## 4.5 මහ බැංකුවේ මුදල් මණ්ඩලය

මුදල් නීති පනතෙහි 8.1 වගන්තිය අනුව මහ බැංකුවෙහි මුදල් මණ්ඩලයෙහි සභාපතීත්වය දරනු ලබන්නේ මහ බැංකු අධිපතිවරයා වන අතර මුදල් අමාත්‍යාංශ ලේකම්ගෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාව මත මුදල් අමාත්‍යවරයා විසින් නිර්දේශ කොට ගරු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් ද මහ බැංකු මුදල් මණ්ඩලය සමන්විත වේ.

මුදල් නීති පනතෙහි ඇතුලත් ප්‍රතිපාදන අනුව රටේ මූල්‍ය ප්‍රතිපත්තිය මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලයට සන්නිවේදනය කරනු ලබන්නේ මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සමාජිකයකුද

වන මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා මාර්ගයෙන් වුවද ප්‍රශ්නගත බැඳුම්කර සිද්ධියට අදාල කාල වකවානුව තුල මහ බැංකුව පැවතියේ මුදල් අමාත්‍යංශය යටතේ නොව ගරු අග්‍රාමාත්‍යවරයා යටතේ පැවති ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා හා තරුණ කටයුතු සහ සංස්කෘතික අමාත්‍යංශය යටතේ වූ බැවින් මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමවේදයට අදාල රජයේ ප්‍රතිපත්තිය මහ බැංකුවේ මුදල් මණ්ඩලයට සන්නිවේදනය වූ අකාරය පිළිබඳව කාරක සභාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

## 4.6 ශ්‍රී ලංකා මහ බැංකුව සුරැකුම්පත් නිකුත් කිරීම මගින් රටේ මුදල් අවශ්‍යතාව සම්පාදනය කර ගැනීමේ ක්‍රියාවලියේදී මුදල් අමාත්‍යංශයේ මැදිහත් වීම -

### 4.6.1 මුදල් ප්‍රවාහ කමිටුව (Cash Flow Committee )

මෙම මුදල් ප්‍රවාහ කමිටුව භාණ්ඩාගාර ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් රැස්වෙන අතර සියළු නියෝජ්‍ය ලේකම්වරු, භාණ්ඩාගාරයේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කීප දෙනෙක් සහ මෙම විෂය පිළිබඳ දැනුම තිබෙන මහ බැංකුව සමග ගනුදෙනු කරන කීප දෙනෙක් එම කමිටුවට සහභාගී වන බව මුදල් අමාත්‍යංශ ලේකම් විසින් කාරක සභාවට පෙන්වා දෙන ලදී. මෙම කමිටුවෙහිදී, මාසයක් තුල රජයට ලැබෙන ආදායමත් - වියදමත් පිළිබඳ සාකච්ඡා කරන බවත් ආදායම - වියදම් අතර පවතින හිඟ මුදල, තිබෙන ණය සීමාවන්ට යටත්ව, මහ බැංකුවෙන් ලබා ගැනීමට සැලසුම් කරන බවද මුදල් අමාත්‍යංශ ලේකම් තවදුරටත් පෙන්වා දෙන ලදී.

**4.6.2** මහ බැංකුව විසින් රටට අවශ්‍ය මුදල් සම්පාදනය කරගැනීම සඳහා ණය මුදල් ලබාගන්නා ආකාරය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යංශය මගින් පසුවිපරමක් කරන්නේද යන්න කාරක සභාව කරන ලද විමසීමකදි, මේ දක්වා එවන් පසුවිපරමක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් මතු නොවූ බවත් එලෙස පසුවිපරමක් කිරීමට සිදුවන්නේ නම් එය කළ හැක්කේ මහ බැංකුවේ අදාල බැඳුම්කර ක්‍රියාවලියට සම්බන්ධ වන මුදල් නීති පනතෙහි පවත්නා පනතේ විධි විධානයන්ට යටත්ව බවත් මුදල් අමාත්‍යංශ ලේකම් විසින් පෙන්වා දෙන ලද අතර මහ බැංකුවේ මෙම ප්‍රශ්නගත බැඳුම්කර නිකුතු සම්බන්ධයෙන් විගණකාධිපති විසින් ලබාදෙන ලද වාර්තාවේ නිර්දේශ මත ඒ සම්බන්ධයෙන් පසුවිපරමක් සිදු කිරීම කෙරෙහි අවධානය මේ වන විට යොමු වී ඇති බව ද පෙන්වා දෙන ලදී. [7]

[7] මුදල් මණ්ඩලයේ ක්‍රමවේදය හා මෙහෙයුම් අත්පොත අනුව වෙන්දේසි ක්‍රමය මගින් හැකිතාක් මූල්‍ය සම්පාදනය සිදු කළයුතු බවත්, ඉතිරිය පුද්ගලික නිකුතු ක්‍රමය මගින් සපුරා ගත යුතු බවත් සඳහන් වුවද විගණකාධිපති වාර්තාවේ සඳහන් වන ආකාරයට නිවැරදි ක්‍රමය ලෙස සලකා ඇත්තේ පුද්ගලික නිකුත් ක්‍රමය වන බවත් විගණකාධිපති වාර්තාව මගින් පුද්ගලික නිකුත් ක්‍රමය පිළිගත් නියමය වශයෙන් ගෙන කරුණු දක්වා ඇති බවත්, පෙන්වා දී ඇත.

## 5 2015 පෙබරවාරි මස 27 දින බැඳුම්කර නිකුත් කිරීම

### 5.1.1 මහ බැංකුවේ දේශීය ණය කළමනාකරණ කමිටුව හා එහි කාර්ය භාරය

මුදල් අමාත්‍යංශයේ නියෝජිතයෙක්ද ඇතුළුව සාමාජිකයන් 5 දෙනෙකුගෙන් යුතු මෙම කමිටුවේ වගකීම වනුයේ දේශීය මූලා‍ෂ වෙළඳපළෙන් ලබාගැනීමට අපේක්ෂා කරන්නාවූ ණය ගැනුම්, වියදම හා අවදානම අවම වන අයුරින් පවත්වා ගනිමින් ඒ සඳහා අවශ්‍ය වන නිර්දේශ ඉදිරිපත් කිරීමයි. [8]

### 5.1.2 2015 මාර්තු මාසය සඳහා රටේ මුදල් අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා මහ බැංකුවේ රාජ්‍ය ණය කළමනාකරණ කමිටුවේ නිර්දේශය -

2015 මාර්තු මාසය සඳහා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර නිකුත්කර සපුරාගත යුතු රජයේ සමස්ත මුදල් අවශ්‍යතාවය රු.බිලියන 261.683 ක් වූ බවත් ඉන් රු. බිලියන 89.683 භාණ්ඩාගාර බිල්පත් මගින්ද රු.බිලියන 172ක් භාණ්ඩාගාර බැඳුම්කර මගින්ද ලබා ගැනීමටත් එකී රු.බිලියන 172න්, රු.බිලියන 1 ක් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසිය මගින්ද ඉතිරිය ඍජු ක්‍රමය අනුගමනය කිරීම මගින්ද සපුරා ගැනීමට 2015 පෙබරවාරි 27 දින පැවති රාජ්‍ය ණය කළමනාකරණ කමිටුව මගින් තීරණය කොට නිර්දේශ කර තිබූ බව 2015-2016 මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සකසන ලද වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි.

ඒ අනුව 2015 පෙබරවාරි මස 25 හා 26 දින පිළිවලින් අන්තර්ජාලයේ හා ප්‍රසිද්ධ පුවත්පත්වල ප්‍රසිද්ධ කරන ලද දැන්වීම් වලට අනුව ප්‍රාථමික වෙළඳුන් 16 දෙනා වෙත වසර 30 ක කාලයකින් කල් පිරෙන රු.බිලියන 1ක භාණ්ඩාගාර බැඳුම්කර 12.5 % ක් වන පොලී අනුපාතයක් යටතේ නිකුත් කිරීම සඳහා මිල ගණන් කැඳවා තිබුණි. මේ පිළිබඳ ලංසුතැබීමේ තොරතුරු වාර්තාව (ඇමුණුම 1 හි ඇමුණුම XXiii බලන්න )

[8] **5.1.1.1 මහ බැංකුවේ ටෙන්ඩර් කමිටුව හා එහි කාර්ය භාරය.**

සියලු බැඳුම්කර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි වලින් පසුව ඉදිරි කාර්යාලය මගින් (FO) ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා වාර්තා සකස් කරනු ලබන අතර, ටෙන්ඩර් මණ්ඩලය මගින් අවම පිරිවැය හා අවදානම මත කොපමණ බැඳුම්කර ප්‍රමාණයක් මිලදී ගන්නේද යන්න තීරණය කරනු ලබයි.

## 5.2 **<u>2015 පෙබරවාරි මස 27 දින බැඳුම්කර නිකුතුව සිදුවූ ආසන්න කාලය තුල වෙළඳපල හැසිරීම -</u>**

මෙම බැඳුම්කර නිකුතු දිනට පෙර සතියේ ද්විතීයක වෙළඳපල තුල වසර 30 බැඳුම්කර සඳහා 9.48 % ක සාමාන්‍ය ඵලදා අනුපාතයක් පැවතීය. (ඇමුණුම 1 හි ඇමුණුම xx බලන්න - පිටුව 108) [9]

## 5.3 **<u>මහ බැංකු නිලධාරීන් විසින් පොදු ව්‍යාපාර කාරක සභාව ඉදිරියේ මෙම බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් දෙන ලද වාචික සාක්ෂි අනුව 2015 පෙබරවාරි 27 දින මහ බැංකු බැඳුම්කර නිකුතුව සිදුවූ අකාරය පැහැදිලි කළ අයුරු පහතින් කෙටියෙන් දැක්වේ.-</u>** ***(උපුටා ගැනීම - වාචික සාක්ෂි ඇමුණුම් ) -[10]***

- ✓ හිටපු මහ බැංකු අධිපතිවරයා එදින පෙ.ව. 10.45ට පමණ රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැමිණ වෙන්දේසියෙන් කොපමණ ඉල්ලුමක් ලැබී ඇත්ද ආදී විස්තර විමසූ බව.

---

[9] මෙම 9.48% ක පොලී අනුපාතය සෘජු ක්‍රමය හරහා මහ බැංකුව විසින් තීරණය කරන ලද පොලී අනුපාතය මත පදනම් වූ පොලී අනුපාතයක් බවත්, වෙළෙඳපොලේ ස්වාධීනව තීරණය වූ පොලී අනුපාතයක් නොවුනු බවත් පැහැදිලි විය.

[10] 2015 පෙබරවාරි 27 වන දින උදේ කාලයේ වෙළෙඳපොල මෙහෙයුම් කමිටුව මගින් එතෙක් වසරක් පමණ පැවති දින 3 රීතිය එනම් දින 3 ට වඩා වැඩි ප්‍රමාණයක් යම් බැංකුවක් මහ බැංකුවේ මුදල් තැන්පත් කළහොත් ලැබිය යුතු පොලී අනුපාතය 6.5% සිට 5% දක්වා අඩු කර තිබුණි. මෙම තීරණය මගින් එම අඩු කිරීම ඉවත් කරන ලදි. නැවත සාමාන්‍ය අගය වන 6.5% ට පැමිණෙන ලදි.

✓ මෙදින බැඳුම්කර වෙන්දේසිය පෙ.ව.11.00 ට අවසන් විය යුතුව තිබුණද ප්‍රාථමික ගනුදෙනුකරුවකුවකුගේ ඉල්ලීම මත වෙන්දේසිය පෙ.ව 11.05 දක්වා දීර්ඝ කරන ලද බව.[11], [12]

---

[11] එලෙස පෙ.ව.11.00 ට පසුව ලංසු තබා ඇත්තේ එක් ඉල්ලුම්කරුවෙකු පමණක් වන අතර, ඒ රුපියල් මිලියන 100ක් බවත් පෙ.ව. 11.04.26 ට ලංසු තබා ඇත්තේ HSBC බව පෙනේ.

[12] මහ බැංකු නිලධාරීන් විසින් මෙම ප්‍රශ්නගත වෙන්දේසිය සම්බන්ධයෙන් ඊට කලින් දිනයකදී ප්‍රාථමික ගනුදෙනු කරුවන්ට දුරකථනයෙන් කථා කර රු. බිලියන 10 ක් පමණ මිලදී ගැනීමට කැමැත්ත අකමැත්ත විමසන ලද බව සාක්ෂිවල සටහන් වේ. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ නියෝජිතයාටද එම දුරකථන ඇමතුම ලැබුන බව ප්‍රකාශ කරයි. තවද මහ බැංකුවේ නිලධාරීන් විසින් එය සනාථ කරන ලදි.

- ✓ පර්පෙචුවෙල් ට්රෙෂරීස් සමාගම රු: බිලියන 3 ක් 12.5 % ක්ද රු. බිලියන 5 ක් 12.75% රු: බිලියන 5 ක් 13% කට ද ආයෝජනය 2045 බැඳුම්කර වෙන්දේසියේදී ලංසු තබන ලෙසට ඊට මඳ වේලාවකට පෙර දුරකතනයෙන් සාකච්ජා කළ පරිදි ලංකා බැංකුවට 2015 පෙබරවාරි 27 වන දින පෙ.ව. 10.48 ට ඊමේල් මගින් උපදෙස් දී ඇත. එම ලංසු ලංකා බැංකුව විසින් පිළිවෙලින් 10.57.22, 10.57.41 සහ 10.57.57 යන වේලාවන් වලදී මහ බැංකුව වෙත ලැබී ඇත. ඒ බව ලංසු වේලාව දක්වන සටහනේ සටහන් වේ. පෙ.ව. 11.06 ට HSBC ආයතනය මගින් ලංසු ඉදිරිපත් කර ඇත.

- ✓ එම වෙන්දේසියේදී බැඳුම්කර සඳහා පැවති ඉල්ලුම සලකා බැලීමෙන් පසුව රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්යාලය (front office) විසින් සකස් කරන ලද විකල්ප ක්‍රම 07 ක් ඇතුලත් වාර්තාවේ තිබූ රු.බිලියන 2.6 ක බැඳුම්කර නිකුත් කළ යුතු බවට වූ නිර්දේශය ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් සකසන ලද බව

- ✓ හිටපු මහබැංකු අධිපතිවරයා යලි පෙ.ව. 12.30 ට පමණ නියෝජ්‍ය අධිපතිවරුන් දෙදෙනෙකු[13] සමග රාජ්‍ය ණය කළමණාකරණ දෙපාර්තමේන්තුවට පැමිණ බැඳුම්කර වෙන්දේසිය සම්බන්ධ කරුණු විමසූ බව. [14]

---

[13] ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා සහ ආනන්ද සිල්වා මහතා යන දෙදෙනා

[14] මුල් කෙටුම්පත් වාර්තාවේ (fact report) හි මෙසේ සඳහන් වේ.එදින ටෙන්ඩර් කමිටුව නියෝජනය කළ සාමාජිකයන් වන්නේ ටෙන්ඩර් කමිටුවේ සභාපති, නියෝජ්‍ය අධිපති පී.සමරසිරි මහතා , රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී එස්.එස්. අධිකාරී මහතා, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධිපති සී.පී.ඒ. කරුණාතිලක මහතා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මහත්මිය, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ගුණරත්න මහත්මිය සහ තවත් අතිරේක සුපිරින්ටැන්ඩන් වරු දෙදෙනෙක් වන බව අනාවරණය කර ගන්නා ලදි. මහ බැංකු අධිපති ටෙන්ඩර් කමිටුවේ සාමාජිකයෙක් නොවන බවද අනාවරණය විය.

මෙහිදී රු. බිලියන 1 සිට රු. බිලියන 10 දක්වා මුදලක් සපයා ගැනීමට ගනු ලැබූ තීරණය ඉහත සඳහන් නිලධාරීන් විසින් වෘත්තීයමය විනිශ්චය අනුව කණ්ඩායමක් වශයෙන් ගනු ලැබූ තීරණයක් බව තමන් පිළිගන්නා බව ටෙන්ඩර් කමිටු සභාපති පී. සමරසිරි මහතා ප්‍රකාශ කරන ලදි.

කෙසේ වෙතත් ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී සෙනෙවිරත්න මහත්මියගේ සාක්ෂිය ගැන විශේෂයෙන් සලකා බැලිය යුතුව ඇත. "මෙහිදී කාරක සභාව විසින් පෙන්වා දෙන ලද්දේ සෙනෙවිරත්න මහත්මිය විසින් මින් පෙර කිසිම අවස්ථාවකදී කාරක සභාව ඉදිරියේ හිටපු මහ බැංකු අධිපතිවරයා විසින් තමන්ට " Do it " යනුවෙන් නියෝග කළ බව සඳහන් නොකල බව හා "Why don't you go for ten ? " යනුවෙන් අදහසක් ඉදිරිපත් කළ බව පමණක් ප්‍රකාශ කළ බවයි. විගණකාධිපති වාර්තාවෙන්ද මහ බැංකු අධිපති වරයා විසින් සෙනෙවිරත්න මහත්මියගෙන් රු: බිලියන 10 කට නොයන්නේ මන්දැයි " Why don't you go for ten ? " යන්න ඇසූ බව හැර වෙනත් කිසිම සාක්ෂියක් ඉදිරිපත් කර නැති බව පෙන්වා දෙන ලදි.

මෙහිදී සෙනෙවිරත්න මහත්මිය කලින් කාරක සභා වලදී ඒ බව ප්‍රකාශ කිරීමට නොහැකිවීම පිළිබඳව සමාව භජනය කරන බව ප්‍රකාශ කර සිටියාය."

තවද ආචාර්ය ඒ. ඉසඩ්. එම්. අසීම් මහතා ( නියෝජ්‍ය ණය අධිකාරී) ප්‍රකාශ කරන ලද්දේද අදාල තීරණය ටෙන්ඩර් කමිටුවේ තීරණයක් බවයි.

*" අචාර්ය අසීම් ගේ සාක්ෂි අනුව පැහැදිලි වෙනවා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ක්‍රමයෙන් ඍජු නිකුතු ක්‍රමයෙන් ඉවත්ව, වඩාත් පුළුල් වෙළඳපළක් සහිත වෙන්දේසි ක්‍රියාවලියට යාමට 2015 පෙබරවාරි 27 දිනට පෙර දිනවල සාකච්ඡා කරමින් සිටි බව. සාකච්ජාවේ යෝජනාව වූයේ Full scale Public Auction වලට යාමටයි. වෙන්දේසි දිනයට පෙර දිනයේදී ද මෙම කාරණය සාකච්ඡා කර තිබූ අතර ආචාර්ය අසීම් සහ අනෙක් අයට ද මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට සිදු විය හැකි බව දැනුම් දී තිබුණා. ආචාර්ය අසීම් තව දුරටත් සාක්ෂි දීමේ දී ප්‍රකාශ කලේ, ඉදිරිපත් කර තිබූ රු. බිලියන 1ට වඩා 20 ගුණයක ලංසු ලැබීම නිසා Public Auction හරහා අවශ්‍ය අරමුදල් රැස් කිරීමට හොඳම අවස්ථාවක් ("Ideal opportunity") වූ බවයි. එම නිසා සම්පූර්ණ ප්‍රමාණයම, ඒ කියන්නේ රු. බිලියන 10කට අධික ප්‍රමාණයක් වඩා එදින Public Auction එකෙන් ගැනීමට තීරණය කළ බව (ඇමුණුම 25 බලන්න)*

ඉන්පසු එම තීරණය මහ බැංකු අධිපති වරයා වෙත ටෙන්ඩර් කමිටුව මගින් දන්වන ලද බව සාක්ෂි මගින් හෙළිවිය.

- ✓ මෙහිදී ප්‍රාථමික වෙළඳපළ ගැනුම්කරුවන් ලංසු තැබූ විස්තර ඇතුලත් ලයිස්තුව හිටපු අධිපතිවරයා විසින් රැගෙන පරීක්ෂා කළ බව

- ✓ හිටපු අධිපතිවරයා එම ලයිස්තුවේ රු.බිලියන 20 සඳහන් ස්ථානයට අත දිගුකොට රු.බිලියන 20 ම නොගන්නේ මන්දැයි විමසූ බව

- ✓ රු.බිලියන 20 ක් දක්වා ඉල්ලුමක් ලැබී ඇති බව නිලධාරීන් විසින් දැනුම් දෙන ලද විට එම රු.බිලියන 20 ම ලබා ගන්නා ලෙස හිටපු අධිපතිවරයා විසින් නිලධාරීන්ට යෝජනා කරන ලද බව

  *(2016.08.12 දින පැවති කාරක සභාවේදී තමන්ට එම මුදල ලබා ගන්නා ලෙස රාජ්‍ය ණය කළමණාකරණ දෙපාර්තමේන්තුවට මහ බැංකු අධිපතිවරයා පැමිණ - "Do it" යනුවෙන් නියෝග කළ බව ප්‍රකාශ කරන ලදී. නමුත් මීන් පෙර කරන ලද සාක්ෂි දැක්වීමකදී "Why don't you go for 10?" යනුවෙන් හිටපු මහ බැංකු අධිපති විසින් යෝජනා කළ බවට රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධිකාරීතුමිය සාක්ෂි සපයා ඇත.)*

- ✓ රු.බිලියන 20 ලබා ගතහොත් මූල්‍ය වෙළඳපල තුල ඇතිවන අහිතකර තත්ත්වයන් පිළිබඳ නිලධාරීන් විසින් හිටපු අධිපතිවරයාට පෙන්වා දෙන ලද බව

- ✓ එවිට හිටපු අධිපතිවරයා විසින් 2014 සැප්තැම්බර් මස නිකුත් කරන ලද 30 අවුරුදු බැඳුම්කරයෙහි බර තැබූ අනුපාතය පිළිබඳ විමසන ලද බව

- ✓ එම අනුපාතය 11.75 බව නිලධාරීන් විසින් පෙන්වා දෙන ලද බව හා එවිට හිටපු අධිපතිවරයා විසින් එම මූල්‍ය වෙළඳපල අනුපාත පැවති මට්ටම අනුව කටයුතු නොකරන්නේ මන්දැයි විමසන ලද බව

- ✓ පසුව, රු.බිලියන 10 ක් ලබා ගන්නා ලෙස ඉහත කී ලැයිස්තුවෙහි රු.බිලියන 10 සඳහන් ස්ථානය අතින් පෙන්වා දෙමින් හිටපු අධිපතිවරයා විසින් නිලධාරීන්ට උපදෙස් දෙන ලද බව

- ✓ ඒ අනුව හිටපු මහබැංකු අධිපතිවරයාගේ උපදෙස් පරිදි රු.බිලියන 10 ලබාගැනීම සඳහා වෙනම වාර්තාවක් ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සකස් කරන ලද බව

- ✓ හිටපු මහ බැංකු අධිපතිවරයාගේ උපදෙස් මත රු. බිලියන 10 ලබාගැනීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරීතුමිය විසින් සටහනක් තබා ඉදිරි කාර්යාලය වෙත දැනුම්

දුන් බව. - *( "Governor instructed to place price up to Rs.10 billion taking in to consideration additional fund requirements of the Government" )*[15]

- ✓ එම රු.බිලියන 10 නිර්දේශය ටෙන්ඩර් කමිටුවට රැගෙන ගිය බව හා හිටපු අධිපතිවරයා රු.බිලියන 10 ක් ලබා ගැනීමට උපදෙස් දුන් බව ටෙන්ඩර් කමිටු නිලධාරීන්ට ණය අධිකාරීතුමිය විසින් ප්‍රකාශ කරන ලද බව

***(මහ බැංකුවේ ටෙන්ඩර් මණ්ඩලය )***

*(මහ බැංකු ටෙන්ඩර් මණ්ඩලයේ කාර්ය භාරය වනුයේ රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන් ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණ ගැනීමයි. 2015 පෙබරවාරි මස 27 දින ටෙන්ඩර් කමිටුව නියෝජනය කළ සාමාජිකයින් වනුයේ ටෙන්ඩර් කමිටුවේ සභාපති, නියෝජ්‍ය අධිපති පී. සමරසිරි මහතා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී එස්.එස්.අධිකාරී මහතා, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධිපති සී.පී.ඒ කරුණාතිලක මහතා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී සී.එම්.ඩී.එන්.කේ.සෙනවිරත්න මහත්මිය, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ගුණරත්න මහත්මිය සහ තවත් අතිරේක සුපරින්ටෙන්ඩන්ඩ්වරු දෙදෙනෙකි. )*

- ✓ රු.බිලියන 10 ක් ලබා ගැනීමට උපදෙස් දීමට හේතුව කුමක්දැයි ටෙන්ඩර් කමිටු සභාපති විසින් හිටපු අධිපතිවරයාගෙන් දුරකතනයෙන් විමසන ලද බව -

- ✓ ඒ සඳහා හිටපු අධිපතිවරයා විසින් හේතු 2 ක් ඉදිරිපත් කළ බව -
    1. ආණ්ඩුවට විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය බව
    2. 5% කට පැවති පොලී අනුපාතය (Special Standing Deposit Facility Rate) ලබන සතියේදී ඉවත් කරන බව හා එවිට පොලී අනුපාතය ඉහල යන බව (2014 සැප්තැම්බර් මස බැඳුම්කර නිකුතුවේදි පැවති තත්ත්වයට පොලී අනුපාත මට්ටමට පත් වන බව) පෙන්වා දෙන ලද බව

*(කෙසේ වුවද පෙබරවාරි 27 බැඳුම්කර නිකුතුව සිදුවීමට පෙර පෙබරවාරි 23 වන දින රැස්වන ලද මහ බැංකු මුදල් මණ්ඩලය මගින් පොලී අනුපාතය, මීලඟ මාසයේ මුදල් මණ්ඩලය රැස්වන තෙක් පොලී අනුපාත පැවති මට්ටමේම නොවෙනස්ව පවත්වා ගනු ලබන බවට තීරණයක් ගෙන ඇති බව 2015 පෙබරවාරි මස 23 දින මුදල් මණ්ඩල පත්‍රිකාවෙහි දෙවන අයිතමය උපුටා දක්වමින් කාරක සභාව මගින් පෙන්වා දෙන ලදී.)*

***-Item No.02 of the Board Paper dated 23 February 2015 –***

*"Given the rising trend of the market interest rates and rising growth of private sector credit and decided to maintain the policy interest rates at current level until the next month's monetary policy review"*

---

[15] වැඩිමනත් අරමුදල් වල අවශ්‍යතාවය සඳහා

*(මහ බැංකු මුදල් මණ්ඩලය එවන් තීරණයක් ගෙන තිබියදී හිටපු මහ බැංකු අධිපතිවරයා විසින් පොලී අනුපාත වෙනස් කිරීම සඳහා තීරණය කර ඇති බව නිරීක්ෂණය විය.)*

- ✓ පෙබරවාරි 27 වන දින උදය කාලයේ වෙළඳපල මෙහෙයුම් කමිටුවට ( Market Operation Committee) හිටපු අධිපතිවරයා පැමිණ 5% පැවති පොලී අනුපාතය (Special Standing Deposit Facility Rate) 6.5% දක්වා වැඩි කිරීමට උපදෙස් දුන් බව හා අධිපතිවරයා එම කමිටුවේ සාමාජිකයෙක් නොවන බව

- ✓ එදිනම වෙළඳපල මෙහෙයුම් කමිටුව මගින් චක්‍රලේඛයක් නිකුත් කර එම පොලී අනුපාතය පිළිබඳව මුදල් වෙළඳපල දැනුවත් කළ බව

- ✓ හිටපු මහ බැංකු අධිපතිවරයා විසින් පෙබරවාරි 27 දිනම ඒ සඳහා අනුමැතිය ලබා දුන් බව

- ✓ එමපොලී අනුපාත වෙනස් කිරීමට ගනු ලැබූ තීරණය ක්‍රියාත්මක වූයේ මාර්තු 3 වන දා සිට බව

- ✓ [16]හිටපු මහ බැංකු අධිපතිවරයා විසින් ගනු ලැබූ එම තීන්දුව 2015 මාර්තු 06 දින පැවති මුදල් මණ්ඩලයේදී[17] අපර අනුමැතියට (Ratification) ලක්කරන ලද බව

[16] වෙළෙඳපොල මෙහෙයුම් කමිටුවේ සභාපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාගේ සහභාගිත්වයෙන්
[17] වෙළෙඳපොල මෙහෙයුම් කමිටුවේදී ගනු ලැබූ තීන්දුව

## 5.4 2015 පෙබරවාරි 27 දින මහ බැංකු බැඳුම්කර සඳහා ලංසු කැඳවීමේ තොරතුරු පත්‍රිකාවට (Bid Acceptance information sheet) අනුව සකසන ලද වගුව -

| ගණුදෙනුකරු (Dealer) | බැඳුම්කර වල මුහුණත වටිනාකම රු. | වෙන්දේසියෙන් ලද මුදල රු. | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතය (WAYR) |
|---|---|---|---|
| Bank of Ceylon | 8,000,000 | 9,546,736 | 9.3510 |
| Acuity Securities Ltd | 50,000,000 | 56,005,000 | 9.9063 |
| First Capital Treasuries Ltd. | 100,000,000 | 110,954,800 | 10.0278 |
| Bank of Ceylon | 500,000,000 | 546,966,000 | 10.1970 |
| Entrust Securities PLC | 50,000,000 | 52,253,650 | 10.2339 |
| NSB Fund Management Company Ltd. | 100,000,000 | 104,507,300 | 10.2959 |
| EPF | 500,000,000 | 522,536,500 | 10.4652 |
| එකතුව | 1,308,000,000 | 1,402,769,986 | |

දේශීය ණය කළමනාකරණ කමිටුව විසින් ප්‍රාථමික වෙන්දේසියෙන් රු.බිලියන 1 ක බැඳුම්කර පමණක් මිලට ගැනීමට නිර්දේශ කර තිබියදී එම ප්‍රමාණය මෙන් දස ගුණයකටත් වැඩි ප්‍රමාණයක් එනම් රු.බිලියන 10.058 දක්වා ලංසු පිළිගැනීමට 2015.02.27 දින පැවැත්වුණු භාණ්ඩාගාර බැඳුම්කර ටෙන්ඩර් කමිටුව (ඇමුණුම 1 හි ඇමුණුම xxiv බලන්න- පිටුව 112) විසින් තීරණය කර තිබුණු බව විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි. එදින පැවති වෙන්දේසියේදී 9.3510 සිට 11.7270 දක්වා වූ බරතැබූ ඵලදා අනුපාතයකට මිල ගණන් ඉදිරිපත් කර තිබූ ප්‍රාථමික ගනුදෙනුකරුවන් 14 දෙනෙකුට වසර 30 කින් කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමෙන් (ඇමුණුම 1 හි ඇමුණුම XXV බලන්න - පිටුව 114 ) රු.බිලියන 10.058 ක් උපයා ගැනීමට අපේක්ෂා කළද වට්ටම් අනුපාතයකට (අවමිලට) නිකුත් කිරීම නිසා රු.බි. 9.658 ක් පමණක් උපයා ගැනීමට හැකිව තිබුණි. මෙහිදී අනාවරණය වූ තවත් වැදගත් කරුණක් ලෙස ඉහත පරිදි සපුරාගත නොහැකි වූ රු.බි 0.371 (රු.බිලියන 10.058 - රු.බිලියන 9.687) ක මුදල වෙනත් කෙටි කාලීන ප්‍රභවයකින් සපුරා ගැනීමට සිදුව තිබූ බව විගණකාධිපති වාර්තාව තවදුරටත් පෙන්වා දෙයි.

## 5.5 පර්පෙචුවල් ට්‍රෙෂරීස් (Perpetual Treasuries) සමාගම විසින් 2015 පෙබරවාරි 27 බැඳුම්කර නිකුතුව සඳහා ලංසු තැබීම

ඉහතින් දැක්වූ පරිදි ප්‍රාථමික වෙන්දේසිය රු.බි. 1කට සීමා කලේ නම් ඉහත සඳහන් ප්‍රාථමික ගනුදෙනුකරුවන් 7 දෙනා හැරුණු විට එදිනට ලැබී තිබූ එකතුව රු.බිලියන 20.708 ක් වූ සියළුම මිල ඉදිරිපත් කිරීම් වලින් සියයට 75 ක ප්‍රමාණයක් සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ Perpetual Treasuries සමාගම ඇතුළු වෙනත් ගනුදෙනුකරුවන්ට බැඳුම්කර මිලදී ගැනීමට අවස්ථාවක් නොතිබූ බව ඉහත වගුවෙන් පැහැදිලි වේ. එදින වෙන්දේසිය මගින් නිකුත් කිරීමට අපේක්ෂා කළ රු.බි. 1 ක මුදල රු.බිලියන 10.058 දක්වා වැඩි කිරීමට තීරණය කිරීම හේතුවෙන් ඉහත සඳහන් ප්‍රාථමික වෙළඳුන් 07 දෙනා අතරද නොසිටි Perpetual

Treasuries සමාගම එදින නිකුත් කරන ලද මුළු බැඳුම්කර වටිනාකමින් 50 % ක් එනම් රු.බිලියන 5 ක් ලබා ගැනීමේ අවස්ථාව උදා වී තිබීම කැපී පෙනෙන ලක්ෂණයක් වූ බවත් ( ඇමුණුම 1 හි ඇමුණුම XXV බලන්න - පිටුව 114 ) මෙහිදී එම රු.බිලියන 5 කින් රු.බිලියන 2ක් සෘජුවමත් රු.බිලියන 3 ක් වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු වූ ලංකා බැංකුව හරහා වක්‍රාකාරයෙනුත් ලබා ගැනීමට එම සමාගම කටයුතු කර තිබූ බවත් විගණකාධිපති වාර්තාව පෙන්වා දෙනු ලබයි.

## 5.6 2015 පෙබරවාරි 27 බැඳුම්කර වෙන්දේසියේදී මූල්‍ය වෙළඳපල තුල ලංකා බැංකුවේ හැසිරීම -

මෙදින බැඳුම්කර වෙන්දේසියේදී පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම මගින් කරන ලද ඉල්ලීමකට අනුව එම සමාගම වෙනුවෙන් රු.බිලියන 13 ක් දක්වා12.50%, 12.75% හා 13% අනුපාතයට ලංසු 3 ක් ලංකා බැංකුව විසින් ඉදිරිපත් කර ඇත. එක් ප්‍රාථමික ගැනුම්කරුවෙකු වෙනුවෙන් තවත් ප්‍රාථමික ගැනුම්කරුවෙකු මහ බැංකු බැඳුම්කර වෙනුවෙන් ලංසු තබන ලද ප්‍රථම අවස්ථාව මෙය වන බව කාරක සභාව විසින් කරන ලද විමර්ශනයන්හි දී අනාවරණය විය.

මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් තොරතුරු තමා නොදැන සිටි බවත් මෙම ගනුදෙනුවට ප්‍රධාන වශයෙන් සම්බන්ධ වී ඇති ලංකා බැංකුවේ මහ බැංකු බැඳුම්කර සම්බන්ධ ගනුදෙනු අංශයේ ප්‍රධාන ගනුදෙනුකරුගෙන්(Chief Dealer) මේ සම්බන්ධයෙන් විමසූ අවස්ථාවේදී ලබා දෙන ලද ලිඛිත පැහැදිලි කිරීම සම්බන්ධයෙන් තමා සෑහීමකට පත් නොවූ හෙයින් මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනයට පවරන ලද බව ලංකා බැංකුවේ සභාපති විසින් කාරක සභාවට කරුණු දක්වන ලදී.

ඒ අනුව අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනය විසින් ලංකා බැංකුව මෙම ගනුදෙනුව සඳහා දායකවීම සම්බන්ධයෙන් විමර්ශනය කොට ඉදිරිපත් කරන ලද වාර්තාව මෙම වාර්තාවෙහි **ඇමුණුම 18** වශයෙන් ඉදිරිපත් කර ඇත.

## 5.7 2015 පෙබරවාරි 27 බැඳුම්කර වෙන්දේසියේදී ටෙන්ඩර් කමිටුවේ ක්‍රියාකාරීත්වය

[18]දේශීය ණය කළමනාකරණ කමිටුව විසින් ප්‍රාථමික වෙන්දේසියෙන් නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණේ රු.බිලියන 1 බැඳුම්කර පමණි. එසේ වුවද එම ප්‍රමාණය මෙන් දස ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයක් එනම් රු.බිලියන 10.058 ක් දක්වා ලංසු පිළිගැනිමට 2015 පෙබරවාරි 27 වන දින වෙන්දේසිය පැවැත්වීමෙන් ද අනතුරුව පැය 1230 සිට පැය 1310 , දක්වා පැවැත්වුනු අංක 2/2015 දරන භාණ්ඩාගාර බැඳුම්කර ටෙන්ඩර් කමිටුව (Treasury Bond Tender Committee) විසින් තීරණය කර තිබුණි (ඇමුණුම 1 - xxiv ). මෙහිදී නිරීක්ෂණය වූ වැදගත්ම කරුණ වන්නේ ඉහත තීරණය ගෙන ඇත්තේ වෙන්දේසිය පැවැත්වීමෙන්ද අනතුරුව බවය. මෙය ඉහත 5.1.3 ඡේදයේ සඳහන් කර ඇති දේශීය ණය කළමනාකරණ කමිටුව විසින් රු.බිලියන 12.550 ක් සෘජු ක්‍රමයෙන් සපුරා ගැනිමට කර තිබූ තීරණයෙන් සම්පූර්ණයෙන්ම බැහැර විමකි.

[18] මෙදින ණය කමිටුවේ තීරණය වනුයේ බිලියන 1 ක් වෙන්දේසියෙන් ලබාගෙන ඉතිරි බිලියන 172 සෘජු ක්‍රමය මගින් සපුරා ගැනීමටයි. මෙහිදී නිරීක්ෂණය වූ වැදගත්ම පරස්පරය වනුයේ රු: බිලියන 1 ක් වෙන්දේසියෙන් කැඳවා වෙන්දේසිය අවසන් වූ පසු රු: බිලියන 10.058 ක් ලබා ගැනීමෙන් පසුව ණය දෙපාර්තමේන්තුව රැස්වී රු: බිලියන 1 ක් වෙන්දේසියෙන් ලබා ගැනිමට කලින් ගත් තීරණය තහවුරු කිරීමයි.

**6. 2015 පෙබරවාරි 27 දින බැදුම්කර නිකුත් කළ හැකිව තිබූ විකල්ප ක්‍රම තුනක් සහ ඒවායේ ඇස්තමේන්තුගත වාසි - අවාසි පිළිබඳ විශ්ලේෂණයක් 2015 – 2016 මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ විගණකාධිපතිවරයාගේ විශේෂ විගණන වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලබයි.** [19]

**6.1. බැදුම්කර නිකුතුව රු.බිලියන 1 කට සීමා කලේ නම් ඇස්තමේන්තුගත අවාසිය**

**(i).** 2015 පෙබරවාරි 27 දින බැදුම්කර නිකුත් කිරීම අපේක්ෂා කළ පරිදි රු.බිලියන 01 ට සීමා කලේ නම් එම වටිනාකම ආවරණය වන පරිදි ලබා තිබූ ලංසු ප්‍රමාණය අනුව බැදුම්කරයක ලංසු වටිනාකම රු.104.5073/- ක් දක්වා පමණක් බැදුම්කර නිකුත් කලේ නම් රු.මිලියන 1,403 ක් ලබා ගත හැකිව තිබුණි.

[19] මෙම ප්‍රශ්නය පිළබඳව සලකා බැලීමේදි ආචාර්ය අසිම් විසින් දිවුරුම් පිට දෙන ලද සාක්ෂි ඉතා වැදගත්ය. ( පාද සටහන් - 14 බලන්න )

එලෙස එම වටිනාකමට බැඳුම්කර නිකුත් කිරීම සිමා නොකිරිම නිසා පහත වගුවෙහි දැක්වෙන පරිදි රජයට රු.889,358,050/- ක ඇස්තමේන්තුගත අවාසියක් සිදුව තිබුණි.[20], [21]

| ගනුදෙනුකරුවන් | ලංසුමිල<br>රු. | බැඳුම්කරයේ මුහුණත වටිනාකම (රජයේ වගකීම)<br>රු. | ගෙවියයුතු සමුච්චිත වටිනාකම<br>රු. | අවාසිය<br>රු. |
|---|---|---|---|---|
| **සේවක අර්ථ සාධක අරමුදල** | **104.507** | **500,000,000.00** | **1,402,769,986.00** | **-** |
| Entrust Securities PLC | 103.116 | 50,000,000.00 | 1,454,327,886.00 | 695,750.00 |
| මහජන බැංකුව | 102.207 | 100,000,000.00 | 1,556,535,086.00 | 2,300,100.00 |
| NSB Fund Management Co. Ltd | 102.207 | 100,000,000.00 | 1,658,742,286.00 | 2,300,100.00 |
| සේවකඅර්ථසාධක අරමුදල | 102.207 | 1,000,000,000.00 | 2,680,814,286.00 | 23,001,000.00 |
| Natwealth Securities Ltd | 102.207 | 50,000,000.00 | 2,731,917,786.00 | 1,150,150.00 |
| NSB Fund Management Co. Ltd | 101.758 | 100,000,000.00 | 2,833,675,786.00 | 2,749,300.00 |
| Natwealth Securities Ltd | 99.999 | 50,000,000.00 | 2,883,675,286.00 | 2,254,150.00 |
| සේවකඅර්ථසාධක අරමුදල | 99.999 | 500,000,000.00 | 3,383,670,286.00 | 22,541,500.00 |
| Perpetual Treasuries Ltd | 97.878 | 250,000,000.00 | 3,628,365,286.00 | 16,573,250.00 |
| Perpetual Treasuries Ltd | 95.8394 | 250,000,000.00 | 3,867,963,786.00 | 21,669,750.00 |

[20] මෙම අවාසිය ගණනය කර ඇත්තේ ඍජු ක්‍රමය නිවැරදි ක්‍රමවේදයක් වශයෙන් භාවිතා කළයුතු පසුබිම තුල පමණි. නමුත් සියලු ලියකියවිලි සහ අත්පොත පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ 1997 න් පසුව බැඳුම්කර හඳුන්වා දීමෙන් පසුව වෙන්දේසි ක්‍රමය රීතිය වශයෙනුත් ඍජු ක්‍රමය හදිසි අවස්ථා වලදී ව්‍යතිරේකයක් වශයෙනුත් භාවිතා කළ හැකි බවත් ය. තවද ඍජු ක්‍රමය භාවිතා කිරීමේදී මුල්‍යා මණ්ඩල විශේෂ පත්‍රිකාවක් මගින් එය කළයුතු බවත් අනාවරණය වේ. තවද 2008 න් පසු එවැනි මුල්‍යා මණ්ඩල අවසරයක් ලැබුණු බවට කිසිම සාක්ෂියක් අප වෙත ලැබී නැත. තවද ඍජු ක්‍රමය භාවිතයේදී විශේෂයෙන්ම රජයේ අරමුදල් (Captive Sources) භාවිතා කළයුතු බවට පැහැදිලි සඳහනක් එම මුල්‍යා මණ්ඩල පත්‍රිකාවල ඇත. තවද එහිදී එම අරමුදල් ආරක්ෂා වන ලෙස කොන්දේසි කිහිපයක්ද එම පත්‍රිකාවල ඇතුලත් වී ඇත. 2008 ජනවාරි 07 NB/PD/ 01/26/2008 මුල්‍යා මණ්ඩල පත්‍රිකාවට අනුව ඍජු ක්‍රමය භාවිතයේදී ඇතිවිය හැකි අගතීන් පහක් " possible implications " යනුවෙන් අවදානම් තත්ත්වය එහි දක්වා ඇත. එනම් ඍජු ක්‍රමය රටේ පවතින අස්ථාවර තත්වයක් සහ අත්‍යාවශ්‍යා අවස්ථාවක පමණක් මුල්‍යා මණ්ඩල අවසරය ඇතිව භාවිතා කළ හැකි ව්‍යතිරේකයක් ලෙස ඉතාමත් පැහැදිලිවේ. එසේ නම් අවාසිය ගණනය කිරීමේදී ඍජු ක්‍රමය භාවිතා කළ හැකි හෝ යුතු බව උපකල්පනය කිරීම නිවැරදි නොවේ. අවාසිය ගණනය කිරීමේ පදනමක් ලෙස ඍජු ක්‍රමය නියමිත ක්‍රමය ලෙස සැලකීම නිවැරදි නොවේ.

[21] 2016.10.20 දින මෙම වාර්තාවේ 3.2 යටතේ බැඳුම්කර විකිණීමේදී රජයට විය හැකි අවාසිය ගණනය කිරීමේ මූලධර්මයට ඇතුලත් කළ සංශෝධනයට , ඒ අවස්ථාවේ කාරක සභාව ඇතුලු සියළු දෙනාගේ එකඟත්වය නොලැබු නමුත් 2016.10.21 වෙනි දින විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද මූලධර්මය දෝෂ සහගත බැවින්, පාද සටහන් අනුමත කරන මන්ත්‍රී කණ්ඩායම මගින් ඉදිරිපත් කරන ලද මූලධර්මයට විගණකාධිපතිවරයා එකඟ විය.

කෙසේ වෙතත්, මෙම බැඳුම්කර වෙන්දේසිය රු. බිලියන 1 කට සීමා වූයේ නම් රජයට වූ අවාසිය වනුයේ විගණකාධිපතිවරයාගේ මුල් ගණනය කිරීම යටතේ ගණනය කරන ලද උපකල්පිත අවාසියකි. ඊට අමතරව 2015 පෙබරවාරි 27 වන දින උදේ, දින 3 රීතිය වෙනස් කිරීම නිසා සමස්ථ වෙළඳපල පොලී අනුපාතය 1 1/2 % කින් වැඩිවිය. එම සිද්ධිය මෙම උපකල්පනයට ඇතුලත් කර නැත. එම නිසා ඇත්ත වශයෙන්ම ඍජු ක්‍රමය හරහා මෙම මුදල ලබා ගැනීමට ගෙවිය යුතු පොලී අනුපාතය කොපමණද යන්න ප්‍රකාශ කිරීම අතිශයින්ම අපහසු කාරණාවකි. ( වෙන්දේසිය කල සතියේ ඊට කලින් දිනවලදී ඍජු ක්‍රමයට ලබා ගත හැකිවූයේ රු. බිලියන 3 ක් බවත් සාක්ෂි මගින් හෙළිදරව් වී තිබුණි. )

| | | | | |
|---|---|---|---|---|
| Seylan Bank PLC | 95.8074 | 1,250,000,000.00 | 5,065,556,286.00 | 108,748,750.00 |
| Wealth Trust Securities Ltd | 93.879 | 50,000,000.00 | 5,112,495,786.00 | 5,314,150.00 |
| Perpetual Treasuries Ltd | 93.879 | 500,000,000.00 | 5,581,890,786.00 | 53,141,500.00 |
| Perpetual Treasuries Ltd | 91.9928 | 1,000,000,000.00 | 6,501,818,786.00 | 125,145,000.00 |
| Wealth Trust Securities Ltd | 90.177 | 50,000,000.00 | 6,546,907,286.00 | 7,165,150.00 |
| The Hongkong and Shanghai Banking Corporation Ltd | 90.177 | 100,000,000.00 | 6,637,084,286.00 | 14,330,300.00 |
| Pan Asia Banking Corporation PLC | 90.177 | 250,000,000.00 | 6,862,526,786.00 | 35,825,750.00 |
| Capital Alliance Ltd | 90.1769 | 100,000,000.00 | 6,952,703,686.00 | 14,330,400.00 |
| ලංකා බැංකුව | 90.1699 | 3,000,000,000.00 | 9,657,800,686.00 | 430,122,000.00 |
| එකතුව | | | | **889,358,050.00** |

## 6.2 ශ්‍රී ලංකා මහ බැංකු රාජ්‍ය ණය කළමනාකරණ කමිටුව නිර්දේශ කර තිබූ රු.බිලියන 2.608 ක් ඉක්මවීම නිසා සිදු වූ අවාසිය

දේශීය ණය දෙපාර්තමේන්තුව විසින් ටෙන්ඩර් කමිටුව වෙත ලබා දුන් විකල්ප ක්‍රම දැක්වෙන පත්‍රිකාවේ (Option Sheet) නිර්දේශ කර තිබූ රු.මිලියන 2,608 ක බැඳුම්කර (බැඳුම්කරයක ලංසු වටිනාකම රු.102.20720 ක් වන පරිදි) බැඳුම්කර නිකුත් කිරීමේ හැකියාව තිබුණි. එසේ නොකර රු.බිලියන 10.058 දක්වා බැඳුම්කර නිකුත් කිරීම නිසා රජයට පහත වගුවෙහි ගණනය කර ඇති පරිදි රු.688,538,600 ක ඇස්තමේන්තුගත අවාසියක් සිදුව තිබුණි.[22]

| ගනුදෙනුකරුවන් | ලංසු මිල රු. | බැඳුම්කරයේ මුහුණත වටිනාකම (රජයේ වගකීම) රු. | ගෙවිය යුතු සමුච්චිත වටිනාකම රු. | අවාසිය රු. |
|---|---|---|---|---|
| Natwealth Securities Ltd | **102.21** | **50,000,000.00** | **2,731,917,786.00** | - |
| NSB Fund Management Co. Ltd | 101.76 | 100,000,000.00 | 2,833,675,786.00 | 449,000.00 |
| Natwealth Securities Ltd | 100.00 | 50,000,000.00 | 2,883,675,286.00 | 1,104,000.00 |
| සේවක අර්ථසාධක අරමුදල | 100.00 | 500,000,000.00 | 3,383,670,286.00 | 11,040,000.00 |
| Perpetual Treasuries Ltd | 97.88 | 250,000,000.00 | 3,628,365,286.00 | 10,822,500.00 |
| Perpetual Treasuries Ltd | 95.84 | 250,000,000.00 | 3,867,963,786.00 | 15,919,000.00 |
| Seylan Bank PLC | 95.81 | 1,250,000,000.00 | 5,065,556,286.00 | 79,995,000.00 |
| Wealth Trust Securities Ltd | 93.88 | 50,000,000.00 | 5,112,495,786.00 | 4,164,000.00 |
| Perpetual Treasuries Ltd | 93.88 | 500,000,000.00 | 5,581,890,786.00 | 41,640,000.00 |
| Perpetual Treasuries Ltd | 91.99 | 1,000,000,000.00 | 6,501,818,786.00 | 102,142,000.00 |
| Wealth Trust Securities Ltd | 90.18 | 50,000,000.00 | 6,546,907,286.00 | 6,015,000.00 |
| The Hongkong and Shanghai Banking Corporation Ltd | 90.18 | 100,000,000.00 | 6,637,084,286.00 | 12,030,000.00 |
| Pan Asia Banking Corporation PLC | 90.18 | 250,000,000.00 | 6,862,526,786.00 | 30,075,000.00 |
| Capital Alliance Ltd | 90.18 | 100,000,000.00 | 6,952,703,686.00 | 12,030,100.00 |
| ලංකා බැංකුව | 90.17 | 3,000,000,000.00 | 9,657,800,686.00 | 361,113,000.00 |
| එකතුව | | | | **688,538,600.00** |

## 6.3 රු. බිලියන 20 ක් ලබා ගැනීම සඳහා මහ බැංකු අධිපතිගේ යෝජනාව ක්‍රියාත්මක කලේ නම් ඇතිවිය හැකිව තිබූ ඇස්තමේන්තුගත අවාසිය

[22] කෙසේ වෙතත්, මෙම බැඳුම්කර වෙන්දේසිය රු. බිලියන 26 කට සීමා වූයේ නම් රජයට වූ අවාසිය වනුයේ විගණකාධිපතිවරයාගේ මුල් ගණනය කිරීම යටතේ ගණනය කරන ලද උපකල්පිත අවාසියකි. ඉහත පාද සටහන් 20, 21 හි දැක්වූ කරුණු මෙම ගණනය කිරීමටත් අදාල වේ.

බැඳුම්කර නිකුත්කිරීම රු.බිලියන 1 ට සීමා නොකර මහ බැංකු අධිපති යෝජනා කළ රු.බිලියන 20 ක බැඳුම්කර නිකුත් කලේ නම් පහත වගුවෙහි ගණනය කර ඇති පරිදි රු.2,730,059,050 ක ඇස්තමේන්තුගත අවාසියක් රජයට සිදු වීමට ඉඩ තිබුණි.[23]

[23] රු. බිලියන 20 ක් නොගත් නිසා මෙය මනඃකල්පිත අදහසකි.

| ගනුදෙනුකරුවන් | ලංසු මිල<br>රු. | බැඳුම්කරයේ මුහුණත වටිනාකම (රජයේ වගකීම)<br>රු. | ගෙවිය යුතු සමුච්චිත වටිනාකම<br>රු. | අවාසිය<br>රු. |
|---|---|---|---|---|
| **සේවක අර්ථසාධක අරමුදල** | **104.5073** | **500,000,000** | **1,402,769,986** | **-** |
| Entrust Securities PLC | 103.1158 | 50,000,000 | 1,454,327,886 | 695,750 |
| මහජන බැංකුව | 102.2072 | 100,000,000 | 1,556,535,086 | 2,300,100 |
| NSB Fund Management Co. Ltd | 102.2072 | 100,000,000 | 1,658,742,286 | 2,300,100 |
| සේවක අර්ථසාධක අරමුදල | 102.2072 | 1,000,000,000 | 2,680,814,286 | 23,001,000 |
| Natwealth Securities Ltd | 102.207 | 50,000,000 | 2,731,917,786 | 1,150,150 |
| NSB Fund Management Co. Ltd | 101.758 | 100,000,000 | 2,833,675,786 | 2,749,300 |
| Natwealth Securities Ltd | 99.999 | 50,000,000 | 2,883,675,286 | 2,254,150 |
| සේවක අර්ථසාධක අරමුදල | 99.999 | 500,000,000 | 3,383,670,286 | 22,541,500 |
| Perpetual Treasuries Ltd | 97.878 | 250,000,000 | 3,628,365,286 | 16,573,250 |
| Perpetual Treasuries Ltd | 95.8394 | 250,000,000 | 3,867,963,786 | 21,669,750 |
| Seylan Bank PLC | 95.8074 | 1,250,000,000 | 5,065,556,286 | 108,748,750 |
| Wealth Trust Securities Ltd | 93.879 | 50,000,000 | 5,112,495,786 | 5,314,150 |
| Perpetual Treasuries Ltd | 93.879 | 500,000,000 | 5,581,890,786 | 53,141,500 |
| Perpetual Treasuries Ltd | 91.9928 | 1,000,000,000 | 6,501,818,786 | 125,145,000 |
| Wealth Trust Securities Ltd | 90.177 | 50,000,000 | 6,546,907,286 | 7,165,150 |
| The Hongkong and Shanghai Banking Corporation Ltd | 90.177 | 100,000,000 | 6,637,084,286 | 14,330,300 |
| Pan Asia Banking Corporation PLC | 90.177 | 250,000,000 | 6,862,526,786 | 35,825,750 |
| Capital Alliance Ltd | 90.1769 | 100,000,000 | 6,952,703,686 | 14,330,400 |
| ලංකා බැංකුව | 90.1699 | 3,000,000,000 | 9,657,800,686 | 430,122,000 |
| Pan Asia Banking Corporation PLC | 88.428 | 150,000,000 | 9,790,442,686 | 24,118,950 |
| ලංකා බැංකුව | 88.4074 | 5,000,000,000 | 14,210,812,686 | 804,995,000 |
| ලංකා බැංකුව | 86.769 | 5,000,000,000 | 18,549,262,686 | 886,915,000 |
| Commercial Bank of Ceylon PLC | 86.7428 | 50,000,000 | 18,592,634,086 | 8,882,250 |
| Pan Asia Banking Corporation PLC | 86.7425 | 100,000,000 | 18,679,376,586 | 17,764,800 |
| Acuity Securities Ltd | 86.74 | 100,000,000 | 18,766,116,586 | 17,767,300 |
| Commercial Bank of Ceylon PLC | 86.0851 | 50,000,000 | 18,809,159,136 | 9,211,100 |
| Union Bank of Colombo PLC | 76.4803 | 50,000,000 | 18,847,399,286 | 14,013,500 |
| Union Bank of Colombo PLC | 74.2125 | 50,000,000 | 18,884,505,536 | 15,147,400 |
| Seylan Bank PLC | 62.6216 | 100,000,000 | 18,947,127,136 | 41,885,700 |
| එකතුව | | | | **2,730,059,050** |

ඉහතින් දක්වා ඇති ඇස්තමේන්තුගත අවාසි එම දිනට ක්ෂණිකව ඇතිවූ / ඇතිවිය හැකි තත්ත්වය පමණක් වන අතර එමගින් දීර්ඝකාලීනව ඇතිවන බලපෑමද සලකා බැලුවහොත් එම විකල්ප අවාසි තවත් ඉහළ යාමට ඇති ඉඩකඩද බැහැර කළ නොහැකි වන බව විගණකාධිපති වාර්තාව මගින් තවදුරටත් පෙන්වා දෙනු ලබයි.

## 7. 2016 මාර්තු 10 හා මාර්තු 24 දිනවල පැවති බැඳුම්කර වෙන්දේසි 2 ප්‍රතික්ෂේප කිරීම

2016 මාර්තු 10 හා මාර්තු 24 දිනවල පැවති බැඳුම්කර වෙන්දේසි 2 කම අපේක්ෂා කරන ලද ඵලදා අනුපාතයන්ට වඩා වැඩි අනුපාතයන් දක්වමින් ලංසු ඉදිරිපත් වීම නිසා ප්‍රතික්ෂේප කර තිබූ බව විගණකාධිපති වාර්තාව පෙන්වා දෙනු ලබයි (ඇමුණුම 1 හි ඇමුණුම xxxi)

## 8. 2016 මාර්තු 29 දින මහ බැංකුව මගින් සිදුකළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම

2016 මාර්තු 29 දින රු.බිලියන 10 බැගින් වූ විවිධ පරිණත කාලයන් සහිත කල් පිරෙන බැඳුම්කර 04 ක් එනම් රු.බිලියන 40 ක බැඳුම්කර නිකුතුවක් සඳහා මිල ගණන් කැඳවා තිබූ බව විගණකාධිපති වාර්තාවේ පෙන්වා දෙනු ලබයි.

### 8.1 මෙම ගනුදෙනුවේදීද පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම මගින් 35% සිට 44 % දක්වා බැඳුම්කර මිලදී ගැනීම සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව පහත සඳහන් කරුණු පෙන්වා දෙනු ලබයි.

මෙහිදී රු. බි . 40 ක සීමාවකට කැඳවනු ලැබ ඇති අතර එම මිල ගණන් මත තවත් අමතර රු.බි. 37.732 (මුහුණත අගය) එනම් රු.බි. 77.732 ක් මුහුණත අගය දක්වා බැඳුම්කර නිකුත් කර ඇත. එලෙස මිල ගණන් කැඳවූ වටිනාකම ඉක්මවා නිකුත් කළ බැඳුම්කර වලින් 60%ක් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම හිමිකර ගෙන ඇත. එම ආයතනය විසින් අඩුම ඵලදා අනුපාතය යටතේ පළමු බැඳුම්කරයෙන් 0.5 % පමණක් හිමි කර ගන්නා අතර ඉහළ ඵලදා අනුපාතයන් යටතේ නිකුත් කර ඇති අනෙක් බැඳුම්කර 3න් 35 % සිට 44 % දක්වා ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් වී තිබුණි. එනම් වට්ටම් ප්‍රමාණය වැඩි වන විට වැඩි බැඳුම්කර ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. [24],[25]

[24] මෙම ගනුදෙනුවට අදාලව වෙන්දේසිය පවත්වන අවස්ථාවේ හෝ ටෙන්ඩර් කමිටුවේ තීරණ ගන්නා අවස්ථාවේදී හිටපු මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් හෝ නියෝජ්‍ය අධිපතිවරුන් වන ආචාර්ය නන්දලාල් වීරසිංහ සහ ආනන්ද සිල්වාගෙන් විමසීම් කළ බවක් හෝ මැදිහත් වූ බවක් ගැන කිසිදු සාක්ෂියක් මෙම කාරක සභාවට ඉදිරිපත් නොවීය. එය විශේෂයෙන් සැලකිය යුතු කරුණකි.

[25] කාරක සභාවට නිරීක්ෂණය වන පරිදි මෙම බැඳුම්කර නිකුත් කිරීමේදි කළ යුතුව තිබුනේ, රජය වැඩි පොලියක් ගෙවිය යුතු බැඳුම්කර අඩු ප්‍රමාණයකුත් අඩු පොලියක් ගෙවිය යුතු බැඳුම්කර වැඩි ප්‍රමාණයකුත් ගැනීමයි. නමුත් එසේ කළ බවට කරුණු අනාවරණය නොවේ. එම නිසා මෙම දිනයේදී බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණයක් අවශ්‍ය බව කාරක සභාවට පෙනී යයි.

මෙම බැඳුම්කර වෙන්දේසියට පෙර පැවති වෙන්දේසි දෙකම ප්‍රතික්ෂේප කර තිබූ පදනම වූ ඉහළ ඵලදා අනුපාත ඉදිරිපත් වීම මෙම වෙන්දේසියේද නිරීක්ෂණය වුවද 14.0742 වැනි ඉහළ ඵලදා අනුපාතයකට මෙම බැඳුම්කර නිකුත් කිරීම සිදු කර තිබුණි.

මෙහිදී බැඳුම්කර 4ක් මගින් රු.බි. 77.73 ක මුහුණත අගයක් ලැබෙන පරිදි බැඳුම්කර නිකුත් කිරීමට තීරණය කර තිබුණද වෙන්දේසියෙන් උපයාගෙන ඇත්තේ රු.බි. 59.325 පමණක් වන අතර රු.බි.18.407 වෙනත් කෙටි කාලීන ණය ප්‍රභවයන්ගෙන් සපුරා ගැනීමට සිදුව තිබුණි. එසේ සිදුව ඇත්තේ ඉහත තීරණය නිසා වූ අවාසියේ බලපෑම නිසා බව අනාවරණය විය.

2015 පෙබරවාරි මස 27 දිනැති බැඳුම්කර වෙන්දේසියෙන් ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවූ රු.බිලියන 1 ක ප්‍රමාණය ඉක්මවා රු.බි. 10.058 දක්වා ලංසු පිළිගෙන තිබීම හා 2016 මාර්තු 29 දින රු.බිලියන 40 ක් ලබා ගැනීම සඳහා මිල ගනන් කැඳවා රු.බිලියන 77.73 ක් දක්වා ලංසු පිළිගැනීම වැනි විශාල ලෙස අපේක්ෂිත සීමාවන් අභිබවා බැඳුම්කර නිකුත් කිරීම හේතුවෙන් එම එකිනෙක සිමාව ඉක්ම වූ කොටස හිමිකර ගැනීමේ අවස්ථාව බහුලව පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට හිමිව ඇති බව විගණකාධිපති වාර්තාව පෙන්වා දෙනු ලබයි.
ප්‍රාථමික ගනුදෙනුකරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කර ඒවා අසාර්ථක වූ අවස්ථා සහ අනෙකුත් ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ ටෙන්ඩර් අසාර්ථක වූ අවස්ථා සංසන්දනය කිරීමේදී පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ලංසු ප්‍රතික්ෂේප වීම සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම ද නිරීක්ෂණය විය.
2016 සැප්තැම්බර් 25 දින සන්ඩේ ඔබ්සවර් පුවත්පතේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම විසින් පළකර තිබූ දැන්වීමෙහි සඳහන් එම සමාගමෙහි විගණන මූල්‍ය ප්‍රකාශවලට අනුව (ඇමුණුම - 18) 2014/ 2015 සහ 2015/ 2016 වර්ෂ සඳහා එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 310.3 ක්ව තිබියදී එම වර්ෂ සඳහා වූ බදු පසු ලාභයන් පිළිවෙලින් රු.බිලියන 0.959 ක් හා රු.බිලියන 5.124 ක් ලෙස විශාල අගයන් ගෙන තිබීම අසාමාන්‍ය තත්ත්වයක් බව නිරීක්ෂණය කෙරේ.

පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ 2015.02.27 දින බැඳුම්කර ගනුදෙනුව අනුව මූල්‍ය වෙළඳපළ හැසිරීම පිළිබඳව විගණකාධිපති වාර්තාවේද පහත සඳහන් ආකාරයට සඳහන් කර ඇත.

(i). පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙන්දේසිය අවසන් කිරීමට ඉතා ආසන්න කාලය තුළ එනම් අවසන් මිනිත්තු 08 තුළ මුළු ලංසු ප්‍රමාණය වූ රු.බිලියන 20.708 කින් රු.බිලියන 13.60 ක ලංසු ලැබී තිබීම.

(ii). ඉහත සඳහන් රු. බිලියන.13.60 ක වටිනාකම තුළ රු. බිලියන 13.00 ක් පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය වෙනුවෙන් ඉදිරිපත් කර තිබීම.

(iii). රු.බිලියන 01 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලංසු කැඳවා තිබියදී රු.බිලියන 10.058 ක් දක්වා ලංසු පිළිගැනිම

(iv). පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය වෙනුවෙන් ලංකා බැංකුව රු. බිලියන 13 ක් වටිනා බැඳුම්කර සඳහා ලංසු ඉදිරිපත් කර තිබීම හා එලෙස ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලංසු ඉදිරිපත් කළ පළමු අවස්ථාව වීම

(v). රු. බිලියන 01 ක් සඳහා ලංසු කැඳවා තිබියදී, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය විසින් රු. බිලියන 2 ක් ඍජුවත් රු.බිලියන 13 ක් ලංකා බැංකුව හරහාත් වශයෙන් එකතුව රු.බිලියන 15 ක් සඳහා ලංසු ඉදිරිපත් කර තිබීම හා එලෙස ලංසු කැඳවා තිබූ වටිනාකම මෙන් 15 ගුණයක බැඳුම්කර ප්‍රමාණයකට ලංසු ඉදිරිපත් කර තිබීම අසාමාන්‍ය තත්ත්වයක් වීම.[26]

---

[26] පර්පෙචුවල් ට්‍රෙෂරිස් සමාගම මෙම විශාල ලාභය ලබාගත්තේ මෙම බැඳුම්කර ඔවුන් ප්‍රාථමික වෙළඳපලෙන් ලබාගත් බැඳුම්කර ද්විතීයක වෙළඳපලේ විකිණීම හරහාය. මෙවැනි අධික පොලියක් සහිත බැඳුම්කර ද්විතීයක වෙළඳපලේදී පර්පෙචුවල් ට්‍රෙෂරිස් සමාගමෙන් මිලදී ගත්තේ රජයට අයිති සේවක අර්ථ සාධක අරමුදල වැනි අරමුදල්ද යන්න සොයා බැලීම සඳහා සහ එවැනි ගනුදෙනුවකට ඔවුන්ට එළඹීමට හේතු වූ කරුණු සොයා බැලීම සඳහා පුළුල් පරීක්ෂණයක් කළ යුතු බව කාරක සභාවේ මතයයි. තවද සේවක අර්ථ සාධක අරමුදලට ප්‍රාථමික වෙළඳපලේ බැඳුම්කර මිලට ගැනීමට හැකිව ඇති බවත් ද්විතීයක වෙළඳපලේ වැඩි පොලී අනුපාතයකට ලබා ගැනීමට හේතු පරීක්ෂා කළ යුතු වේ.

## 8.2 2016 මාර්තු 29 දින පැවති බැඳුම්කර නිකුතුව හේතුවෙන් සිදුවී ඇති විගණකාධිපති විසින් පෙන්වා දෙනු ලබන රු. 784,898,755 ක ඇස්තමේන්තු ගත අවාසිය -

මෙම බැඳුම්කර නිකුත් කිරීමෙන් අපේක්ෂිත නාමික වටිනාකම වූ රු.බි. 40 ක් වෙනුවට රු.බි.77.732 ක් දක්වා පිළිගෙන තිබුණි. එහෙත් එසේ නොකර බැඳුම්කර නිකුතුව මුහුණත වටිනාකම වූ රු.බිලියන 40 කට සීමා කලේ නම් පහත වගුවේ ගණනය කර දක්වා ඇති රු.784, 898,755 ක ඇස්තමේන්තුගත අවාසිය වලක්වා ගත හැකිව තිබූ බව විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි. [27]

| ගනුදෙනුකරුවන් | ලංසු මිල රු. | බැඳුම්කරයේ මුහුණත වටිනාකම (රජයේ වගකීම) රු. | ගෙවියයුතු සමුච්චිත වටිනාකම - රු. | අවාසිය රු. |
|---|---|---|---|---|
| | 84.3512 | 800,000,000 | **8,733,875,000** | - |
| **එකතුව** | | | | **-** |
| **මහජන බැංකුව** | **75.57580** | **120,000,000** | 7,886,053,130 | **-** |
| Natwealth Securities Ltd | 75.4451 | 100,000,000 | 7,961,498,230 | 130,700 |
| මහජන බැංකුව | 75.4451 | 120,000,000 | 8,052,032,350 | 156,840 |
| මහජන බැංකුව | 75.3147 | 120,000,000 | 8,142,409,990 | 313,320 |
| Perpetual Treasuries Ltd | 75.2279 | 50,000,000 | 8,180,023,940 | 173,950 |
| මහජන බැංකුව | 75.2279 | 160,000,000 | 8,300,388,580 | 556,640 |
| Perpetual Treasuries Ltd | 75.2279 | 200,000,000 | 8,450,844,380 | 695,800 |
| මහජන බැංකුව | 75.1845 | 120,000,000 | 8,541,065,780 | 469,560 |
| මහජන බැංකුව | 75.0547 | 120,000,000 | 8,631,131,420 | 625,320 |
| මහජන බැංකුව | 74.9253 | 120,000,000 | 8,721,041,780 | 780,600 |
| Seylan Bank PLC | 74.8393 | 100,000,000 | 8,795,881,080 | 736,500 |
| Perpetual Treasuries Ltd | 74.7961 | 50,000,000 | 8,833,279,130 | 389,850 |
| Perpetual Treasuries Ltd | 74.7961 | 100,000,000 | 8,908,075,230 | 779,700 |
| Wealth Trust Securities Ltd | 74.7961 | 100,000,000 | 8,982,871,330 | 779,700 |
| මහජන බැංකුව | 74.7961 | 120,000,000 | 9,072,626,650 | 935,640 |
| Perpetual Treasuries Ltd | 74.7961 | 250,000,000 | 9,259,616,900 | 1,949,250 |
| Seylan Bank PLC | 74.7959 | 160,000,000 | 9,379,290,340 | 1,247,840 |
| Capital Alliance Ltd | 74.7959 | 200,000,000 | 9,528,882,140 | 1,559,800 |
| Perpetual Tresuries Ltd | 74.3678 | 50,000,000 | 9,566,066,040 | 604,000 |

[27] විගණකාධිපතිවරයා විසින් 2014 ජනවාරි සිට 2016 මැයි දක්වා බැඳුම්කර වෙන්දේසියෙන් මිලදී ගැනීම් 25ක් ගැන තොරතුරු ඉදිරිපත් කර තිබූ අතර එම වෙන්දේසි 25 න් 23 ක් ගැන මෙම කාරක සභාව මගින් කිසිදු සාක්ෂි විමසීමක් සිදු කර නැත. තවද 2016.03.29 දින බැඳුම්කරය පිළිබඳවද විස්තරාත්මක සාක්ෂි විමසීමක් කර නැත. විස්තරාත්මක විමසිමක් කර ඇත්තේ 2015 පෙබරවාරි 27 දින බැඳුම්කර නිකුතුව ගැන පමණකි. ඉතිරි වෙන්දේසි 23 ගැන කිසිදු සාක්ෂි විමසීමක් නොකිරීම මෙම පරීක්ෂණයේදී නිවැරදි තීරණයක් ගැනීමට අපහසු තත්ත්වයක් උදාකර ඇත. එම නිසා ඉදිරි පරීක්ෂණකදී මේ ගැන 2008 සිට 2016 දක්වා කාලය තුල සිදුවූ සියළුම බැඳුම්කර වෙන්දේසි ක්‍රමය සහ ඍජු ක්‍රමය අනුගමනය කිරිම පිළිබඳව විස්තරාත්මක පරික්ෂණයක් කළ යුතුව ඇත. විශේෂයෙන්ම එම සාක්ෂි විමසීමේදි ව්‍යවහාරික විගණනයක් (Forensic Audit) සිදු කිරීම අත්‍යවශ්‍ය වන බව පෙනේ. පාද සටහන් 20 සහ 21 හි සඳහන් කරුණු මෙහිදීද අදාළ වේ.

| | | | | |
|---|---|---|---|---|
| මහජන බැංකුව | 74.3678 | 200,000,000 | 9,714,801,640 | 2,416,000 |
| Perpetual Treasuries Ltd | 74.3678 | 250,000,000 | 9,900,721,140 | 3,020,000 |
| Perpetual Tresuries Ltd | 73.943 | 50,000,000 | 9,937,692,640 | 816,400 |
| Perpetual Treasuries Ltd | 73.943 | 500,000,000 | 10,307,407,640 | 8,164,000 |
| ලංකා බැංකුව | 73.9345 | 250,000,000 | 10,492,243,890 | 4,103,250 |
| Capital Alliance Ltd | 73.732 | 100,000,000 | 10,565,975,890 | 1,843,800 |
| Wealth Trust Securities Ltd | 73.7319 | 100,000,000 | 10,639,707,790 | 1,843,900 |
| Perpetual Treasuries Ltd | 73.5216 | 50,000,000 | 10,676,468,590 | 1,027,100 |
| මහජන බැංකුව | 73.5216 | 250,000,000 | 10,860,272,590 | 5,135,500 |
| Perpetual Treasuries Ltd | 73.5216 | 750,000,000 | 11,411,684,590 | 15,406,500 |
| Perpetual Treasuries Ltd | 73.1036 | 50,000,000 | 11,448,236,390 | 1,236,100 |
| Seylan Bank PLC | 73.1036 | 180,000,000 | 11,579,822,870 | 4,449,960 |
| Perpetual Tresuries Ltd | 73.1036 | 750,000,000 | 12,128,099,870 | 18,541,500 |
| Seylan Bank PLC | 72.6891 | 100,000,000 | 12,200,788,970 | 2,886,700 |
| Capital Alliance Ltd | 72.6891 | 100,000,000 | 12,273,478,070 | 2,886,700 |
| Wealth Trust Securities Ltd | 72.68902 | 100,000,000 | 12,346,167,090 | 2,886,780 |
| Perpetual Treasuries Ltd | 72.689 | 50,000,000 | 12,382,511,590 | 1,443,400 |
| First Capital Treasuries Ltd | 72.689 | 100,000,000 | 12,455,200,590 | 2,886,800 |
| Perpetual Tresuries Ltd | 72.689 | 750,000,000 | 13,000,368,090 | 21,651,000 |
| ලංකා බැංකුව | 72.656 | 180,000,000 | 13,131,148,890 | 5,255,640 |
| Perpetual Treasuries Ltd | 72.483 | 2,000,000,000 | 14,580,808,890 | 61,856,000 |
| Seylan Bank PLC | 72.2778 | 100,000,000 | 14,653,086,690 | 3,298,000 |
| Perpetual Treasuries Ltd | 72.2777 | 50,000,000 | 14,689,225,540 | 1,649,050 |
| මහජන බැංකුව | 72.2777 | 160,000,000 | 14,804,869,860 | 5,276,960 |
| Perpetual Treasuries Ltd | 72.2777 | 2,000,000,000 | 16,250,423,860 | 65,962,000 |
| එකතුව | | | | **258,828,050** |
| **Capital Alliance Ltd** | **75.91150** | **200,000,000** | 8,012,848,545.00 | |
| මහජන බැංකුව | 75.821 | 60,000,000 | 8,058,341,145 | 54,300 |
| මහජන බැංකුව | 75.6858 | 60,000,000 | 8,103,752,625 | 135,420 |
| Perpetual Treasuries Ltd | 75.6858 | 500,000,000 | 8,482,181,625 | 1,128,500 |
| Perpetual Treasuries Ltd | 75.2376 | 750,000,000 | 9,046,463,625 | 5,054,250 |
| Perpetual Treasuries Ltd | 74.7933 | 100,000,000 | 9,121,256,925 | 1,118,200 |
| Capital Alliance Ltd | 74.7933 | 200,000,000 | 9,270,843,525 | 2,236,400 |
| Perpetual Treasuries Ltd | 74.7933 | 750,000,000 | 9,831,793,275 | 8,386,500 |
| Perpetual Treasuries Ltd | 74.134 | 500,000,000 | 10,202,463,275 | 8,887,500 |
| Perpetual Treasuries Ltd | 74.0904 | 500,000,000 | 10,572,915,275 | 9,105,500 |
| Perpetual Treasuries Ltd | 74.0468 | 500,000,000 | 10,943,149,275 | 9,323,500 |
| Perpetual Treasuries Ltd | 74.0032 | 500,000,000 | 11,313,165,275 | 9,541,500 |
| Perpetual Treasuries Ltd | 73.9597 | 500,000,000 | 11,682,963,775 | 9,759,000 |
| Perpetual Treasuries Ltd | 73.9162 | 2,000,000,000 | 13,161,287,775 | 39,906,000 |
| එකතුව | | | | **104,636,570** |
| **Perpetual Treasuries Ltd** | **73.71470** | **1,000,000,000.00** | 8,185,426,680.00 | - |
| Seylan Bank PLC | 73.7146 | 50,000,000 | 8,222,283,980 | 50 |
| Wealth Trust Securities Ltd | 73.4701 | 100,000,000 | 8,295,754,080 | 244,600 |
| Perpetual Treasuries Ltd | 73.2268 | 25,000,000 | 8,314,060,780 | 121,975 |
| Wealth Trust Securities Ltd | 73.2268 | 50,000,000 | 8,350,674,180 | 243,950 |
| Wealth Trust Securities Ltd | 73.2268 | 100,000,000 | 8,423,900,980 | 487,900 |
| Perpetual Treasuries Ltd | 73.2268 | 1,000,000,000 | 9,156,168,980 | 4,879,000 |

| | | | | |
|---|---|---|---|---|
| Seylan Bank PLC | 73.2267 | 20,000,000 | 9,170,814,320 | 97,600 |
| Capital Alliance Ltd | 72.9849 | 100,000,000 | 9,243,799,220 | 729,800 |
| Wealth Trust Securities Ltd | 72.9848 | 150,000,000 | 9,353,276,420 | 1,094,850 |
| Wealth Trust Securities Ltd | 72.9848 | 500,000,000 | 9,718,200,420 | 3,649,500 |
| Wealth Trust Securities Ltd | 72.9848 | 600,000,000 | 10,156,109,220 | 4,379,400 |
| Perpetual Treasuries Ltd | 72.7441 | 25,000,000 | 10,174,295,245 | 242,650 |
| මහජන බැංකුව | 72.7441 | 40,000,000 | 10,203,392,885 | 388,240 |
| Wealth Trust Securities Ltd | 72.7441 | 100,000,000 | 10,276,136,985 | 970,600 |
| Perpetual Treasuries Ltd | 72.7441 | 1,000,000,000 | 11,003,577,985 | 9,706,000 |
| NSB Fund Management Co. Ltd | 72.744 | 10,000,000 | 11,010,852,385 | 97,070 |
| NSB Fund Management Co. Ltd | 72.2665 | 10,000,000 | 11,018,079,035 | 144,820 |
| Perpetual Treasuries Ltd | 72.2665 | 25,000,000 | 11,036,145,660 | 362,050 |
| Seylan Bank PLC | 72.2665 | 40,000,000 | 11,065,052,260 | 579,280 |
| Wealth Trust Securities Ltd | 72.2665 | 100,000,000 | 11,137,318,760 | 1,448,200 |
| Perpetual Treasuries Ltd | 72.2665 | 1,000,000,000 | 11,859,983,760 | 14,482,000 |
| Wealth Trust Securities Ltd | 72.0296 | 250,000,000 | 12,040,057,760 | 4,212,750 |
| NSB Fund Management Co. Ltd | 71.794 | 10,000,000 | 12,047,237,160 | 192,070 |
| මහජන බැංකුව | 71.794 | 60,000,000 | 12,090,313,560 | 1,152,420 |
| Seylan Bank PLC | 71.794 | 100,000,000 | 12,162,107,560 | 1,920,700 |
| Capital Alliance Ltd | 71.794 | 100,000,000 | 12,233,901,560 | 1,920,700 |
| Wealth Trust Securities Ltd | 71.794 | 550,000,000 | 12,628,768,560 | 10,563,850 |
| Wealth Trust Securities Ltd | 71.794 | 550,000,000 | 13,023,635,560 | 10,563,850 |
| Seylan Bank PLC | 71.3266 | 60,000,000 | 13,066,431,520 | 1,432,860 |
| Wealth Trust Securities Ltd | 71.3265 | 100,000,000 | 13,137,758,020 | 2,388,200 |
| Perpetual Tresuries Ltd | 71.0946 | 1,000,000,000 | 13,848,704,020 | 26,201,000 |
| Perpetual Treasuries Ltd | 71.0484 | 1,000,000,000 | 14,559,188,020 | 26,663,000 |
| Perpetual Treasuries Ltd | 71.0022 | 1,000,000,000 | 15,269,210,020 | 27,125,000 |
| Perpetual Treasuries Ltd | 70.9561 | 1,000,000,000 | 15,978,771,020 | 27,586,000 |
| Perpetual Treasuries Ltd | 70.9561 | 1,000,000,000 | 16,688,332,020 | 27,586,000 |
| මහජන බැංකුව | 70.864 | 80,000,000 | 16,745,023,220 | 2,280,560 |
| Wealth Trust Securities Ltd | 70.86395 | 100,000,000 | 16,815,887,170 | 2,850,750 |
| Wealth Trust Securities Ltd | 70.63451 | 500,000,000 | 17,169,059,720 | 15,400,950 |
| Wealth Trust Securities Ltd | 70.63451 | 500,000,000 | 17,522,232,270 | 15,400,950 |
| Capital Alliance Ltd | 70.6345 | 100,000,000 | 17,592,866,770 | 3,080,200 |
| Seylan Bank PLC | 70.4065 | 15,000,000 | 17,603,427,745 | 496,230 |
| Seylan Bank PLC | 70.4065 | 80,000,000 | 17,659,752,945 | 2,646,560 |
| Pan Asia Banking Corporation PLC | 70.4063 | 5,000,000,000 | 21,180,067,945 | 165,420,000 |
| එකතුව | | | | **421,434,135** |
| මුළු එකතුව | | | | **784,898,755** |

[28]

[28] කෙසේ වෙතත්, මෙම බැඳුම්කර වෙන්දේසිය රු. බිලියන 40 කට සීමා වූයේ නම් රජයට වූ අවාසිය වනුයේ විගණකාධිපතිවරයාගේ මුල් ගණනය කිරීම යටතේ ගණනය කරන ලද උපකල්පිත අවාසියකි. ඉහත පාද සටහන් 20, 21 හී දැක්වූ කරුණු මෙම ගණනය කිරීමටත් අදාල වේ.

## 9. 2015 -2016 කාලය තුල මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම් හේතුවෙන් මෙරට මූල්‍ය වෙළඳපල තුල ඇතිවූ බලපෑම හා වාසි - අවාසි පිළබඳ විගණකාධිපති වාර්තාවේ දැක්වෙන පහත සඳහන් කරුණු කාරක සභාවේ අවධානයට ලක්විය

### 9.1 සේවක අර්ථ සාධක අරමුදලට සිදුවූ මූල්‍යමය අවාසිය

මෙම බැඳුම්කර නිකුතුවේ තවත් විශේෂිත කරුණක් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන සහ ප්‍රාථමික වෙන්දේසියෙන් බැඳුම්කර මිලදී ගැනීමේ හැකියාවක් ඇති ආයතනයක් ලෙස සේවක අර්ථ සාධක අරමුදල වැඩි ඵලදා අනුපාතිකයන් සහිත ප්‍රාථමික වෙළඳපලෙන් සාපේක්ෂව අඩු බැඳුම්කර ප්‍රමාණයක් ලබාගෙන තිබූ අතර අඩු ඵලදා අනුපාතිකයක් සහිතව ද්විතීයික වෙළඳපලෙන් මිලදී ගැනීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ මූල්‍ය වාසිය අහිමි කරගෙන තිබූ බවයි.[29]

ඔවුන්ට අවශ්‍ය ඉතිරි බැඳුම්කර ප්‍රමාණය සෘජුවම ප්‍රාථමික වෙළෙඳපොළෙන් මිලදී ගැනීමට අයදුම්කර හෝ නොමැතිව, ද්විතියික වෙළඳපළෙන් මිලදී ගෙන තිබීම ප්‍රශ්නකාරි වන බවද විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි. මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ භාරකාරීත්වයේ පවතින ආයතනයක් වන සේවක අර්ථසාධක අරමුදල මෙලෙස කටයුතු කිරීම පිළිබඳ මහ බැංකුව විසින් අවධානය යොමු නොකිරීම ද ප්‍රශ්නකාරී තත්ත්වයක් බව විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි.

### 9.2 විදේශ ආයෝජකයන් මහ බැංකු බැඳුම්කර මිලදී ගැනීමට යොමු වෙතැයි පැවති අපේක්ෂාව ඉටු නොවීම

2015 පෙබරවාරි මස 27 දින සැලසුම් කර තිබුනේ වසර 30 කින් කල් පිරෙන බැඳුම්කර වන බවත් එවැනි දීර්ඝ කාලීන බැඳුම්කර මිලදී ගැනීම සඳහා විදේශ ආයෝජකයන්ගේ ඉදිරිපත් වෙතැයි මහ බැංකු මුදල් මණ්ඩලය අපේක්ෂා කළ ද එවන් ඉදිරිපත්වීමක් සිදුව නොතිබූ බව කාරක සභාව මගින් කරන ලද විමර්ශන වලදී අනාවරණය විය.

---

[29] සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ප්‍රාථමික ගණුදෙනු කරුවන්ට අයුතු වාසියක් ලබා ගැනීම පිණිස යොදා ගැනීමේ තත්ත්වයක් පසුගිය වසර 6 ක කාලය තුල නිරීක්ෂණය වී ඇත. එම තත්ත්වය තවදුරටත් සිදු වන බව පෙනේ. එසේ හෙයින් සේවක අර්ථසාධක අරමුදල සතු අරමුදල් වඩාත් ඵලදායී ලෙස ආයෝජනය කිරීම ගැන විශේෂ ප්‍රතිපාදන සකස් කළයුතුව ඇත. තවද සේවක අර්ථසාධක අරමුදල තුල ඇත්තේ මේ රටේ සේවකයන් විසින් ඔවුන්ගේ අනාගතය වෙනුවෙන් රටේ නීතිය ප්‍රකාරව ඉතිරි කරන මුදල්ය. ඒවා වඩා ඵලදායී ලෙස ආයෝජනය කරන ක්‍රමවේද සහ එම මුදල් වල ආරක්ෂාව ගැන වැඩි මනත් නීතිමය ප්‍රතිපාදන සැකසීමේ අවශ්‍යතාවය ඇත. මෙම ක්‍රියාවලිය 2010 සිට 2013 දක්වා කාල පරිච්ඡේදයේදී මෙවැනිම ආකාරයට කොටස් වෙළෙඳපොලේ සිදුවීම පිළිබඳව කාරක සභාවේ යම් මන්ත්‍රීන් පිරිසක් එවකට සෘජුවම චෝදනා එල්ල කළ බව සහ එයද පරීක්ෂා කළයුතු බව කාරක සභාවේ අදහසයි.

## 9.3 ඉහල පොළී අනුපාතයක් තීරණය කිරීම හේතුවෙන් මූල්‍ය වෙළඳපල තුල සිදු වූ බලපෑම

2015 පෙබරවාරි 27 දිනට ස්ථාවර පොලී අනුපාතිකයක් තීරණය කිරීමට පාදක කර ගන්නා ලද පෙර සතියේ පැවති ද්විතීයක වෙළඳපල සාමාන්‍ය ඵලදා අනුපාතය 9.48 ක් විය.[30] එලෙස තිබියදී අදාල වෙන්දේසිය සඳහා 12.5 % ක ස්ථාවර පොලී අනුපාතිකයක් ප්‍රකාශයට පත් කර තිබුණි. තවද වෙන්දේසියට දින දෙකකට පෙර එනම් 2015 පෙබරවාරි 25 දිනට පෙර අවසන් සතියේ ද්විතීයක වෙළඳපල සාමාන්‍ය ඵලදා අනුපාතය 10.03 ක් පමණක් විය. ඒ අනුව 2015 පෙබරවාරි 27 දින වෙන්දේසි සඳහා ස්ථාවර පොලී අනුපාතය ලෙස සියයට 12.5 තීරණය කළ ආකාරය අනාවරණය නොවිය. එසේම ඉහල පොළි අනුපාතිකයන් යටතේ වර්ෂ 30 ක් වැනි දිගු කාලයකදී රජයට දැරිය යුතු වන අමතර පිරිවැයද රජයට සිදුවන අවාසියක් ලෙස සැලකිය යුතු බවද නිගමනය කරනු ලැබේ. මෙහිදී නිරීක්ෂණය වූ ඉතා වැදගත් කරුණක් වන්නේ වර්ෂ 30 ක වැනි දිගු කාලීන බැඳුම්කරයක පොළී අනුපාතයේ සිදුවන ඉතා කුඩා වැඩි වීමකින් වුවද රජයට විශාල මූල්‍ය අවාසියක් සිදුවිය හැකි වීමය.

## 9.4 වෙන්දේසි ක්‍රමයට විතැන් වීමෙන් මූල්‍ය වෙළඳපල තුල ප්‍රාථමික ගනුදෙනුකරුවන්ට වැඩි වාසි දායක තත්ත්වයක් ලබා ගැනීමට හැකි වීම. [31]

ප්‍රාථමික වෙළඳපල ගනුදෙනු, වෙන්දේසි ක්‍රමයට විතැන් වීම නිසා ඵලදායිතා අනුපාතය පොලී අනුපාතයට වඩා ඉහල අගයක් ගැනීම නිසා රජයට අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව විගණකාධිපති වාර්තාව මගින් සවිස්තරව පෙන්වා දෙනු ලබයි. වට්ටම් කළ අගයකට බැඳුම්කර ප්‍රාථමික ගැනුම්කරුවන්ට අලෙවි කළද ඒවායේ ද්විතීයක වෙළඳපල මිල ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ප්‍රාථමික ගනුදෙනුකරුවන්ට මෙම බැඳුම්කර ද්විතීයක වෙළඳපල තුල විකිණීම මගින් වැඩි ලාභ ආන්තිකයක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙන බවත් එම තත්ත්වය තුල රජයට ලබා ගත හැකිව තිබූ වාසිදායක තත්වයක් ප්‍රාථමික ගනුදෙනු කරුවන් වෙත විතැන් වෙන බව විගණකාධිපති වාර්තාව නිරීක්ෂණය කරයි. [32]

---

[30] එකී වෙන්දේසිය ගැන 2015.12.25 දින ප්‍රකාශයට පත් කළ දැන්වීමේ 12.5% ක පොලී අනුපාතය සඳහන් කර තිබුනේ යම් සමීක්ෂණයක් සඳහා සමීකරණයක් අනුව බව මහ බැංකු නිලධාරීන් විගණකාධිපතිවරයාට පවසා තිබූ අතර, ඉහත කී පුවත් පත් දැන්වීමේ පල කළ 2015.02.25 දින මහ බැංකුව විසින් වසර 30 ක බැඳුම්කර සඳහා වූ ඵලදා අනුපාතය 10.14% ක් විය. ඒ ගැන විශේෂ අවධානයට ලක් විය යුතුව ඇත.

[31] බවට වූ කමිටුවේ අදහස ගැන විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තර්කය පිළිබඳව.

[32] කෙසේ වෙතත් ඉන් විස්තර කර ඇති පරිදි අත්පොතේ B1 පරිච්ඡේදයේ දැක්වෙන නීතියේ පිළිගත් කාර්ය පටිපාටිය අනුව වෙන්දේසිය රීතිය වන බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

## 9.5 බැඳුම්කර නිකුතු කිරීමේදී වෙන්දේසි ක්‍රමයට විතැන් වීම නිසා රජයට අයත් ආයතන මගින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම දුර්වල වී තිබූ බව

2015 පෙබරවාරි 27 සිදුවූ ක්‍රමවේදයේ වෙනස්කම් සමගම භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලදී ප්‍රාථමික ගනුදෙනුකරුවන් වූ සේවක අර්ථ සාධක අරමුදල ජාතික ඉතිරි කිරීමේ බැංකු අරමුදල් කළමනාකරණ සමාගම, මහජන බැංකුව, ලංකා බැංකුව වැනි රාජ්‍ය ආයතන බැඳුම්කර වෙන්දේසි වලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම දුර්වල වී තිබුණු බව විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි.

## 9.6 ඉහල පොලී අනුපාතයන් තීරණය වීම තුල බැඳුම්කර වෙන්දේසි ප්‍රතික්ෂේප වීම්

ඉහල පොලී අනුපාත සමග මිල ගණන් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් එම වෙන්දේසි සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප වූ අවස්ථා 5 ක් 2015-2016 මැයි දක්වා කාලය තුල වාර්තා වී තිබූ බවත් ප්‍රාථමික ගනුදෙනුකරුවන් විසින් මහ බැංකුව අපේක්ෂා කරන මිල ගණන්වලට වඩා ඉතා ඉහල මිල ගණන්වලටද මිල ගණන් ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් ඇතිවී තිබූ බවත් විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි.

## 10 2015 -2016 මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සකස් කරන ලද විශේෂ විගණන වාර්තාවේ නිර්දේශ -

**(i).** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලදී මෙන්ම පවතින ක්‍රමවේදයන් වෙනස්කම්වලට භාජනය කිරීමේදී සහ නව ක්‍රමවේදයන් හඳුන්වාදීමේ දී එමගින් රටේ ආර්ථිකයට සිදුවන ධන හෝ ඍණ බලපෑම් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණුවලට ඉන් සිදුවන බලපෑම දිගුකාලීන හා කෙටි කාලීන වශයෙන් සලකා බලා අදාළ තීරණවලට එළඹිය යුතු වන අතර එලෙස කටයුතු කල බවට පිළිගත හැකි සාක්ෂි අවශ්‍ය අවස්ථාවන් හි දී ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පවත්වාගෙන යාම.

**(ii).** ද්වීතියක වෙළඳපලද නියාමනය කිරීමට ප්‍රමාණවත් දත්ත ශ්‍රී ලංකා මහ බැංකුව සතු නොවන තත්ත්වයක් තුල මූල්‍ය වෙළඳපල හැසිරවීමේ හා නියාමනය කිරීමේ කාර්යය වඩාත් ඵලදායීව ඉටුකිරීම අඩපණවීම වලක්වනු වස් අවශ්‍ය සියලු දත්ත ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවත්වා ගැනීම.

**(iii).** මහ බැංකුව විසින් නිකුත් කල බැඳුම්කරයන් කල් පිරී මුදල් ලබා ගැනීම සඳහා තමන් වෙත ඉදිරිපත් වන අවස්ථාව දක්වා එම බැඳුම්කරයේ හිමිකාරීත්වය හා ගණුදෙනු වන ආකාරය පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගැනීම.

**(iv).** රටක මහ බැංකුව කෙරෙහි පවතින විශ්වාසය එහි නිලධාරීන් විසින් ගන්නාවූ තීන්දු තීරණවල අවංකභාවය මතද රඳා පවතින හෙයින් හා එම විශ්වාසය දේශීයව මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද නොකැලැල්ව පවත්වා ගත යුතු හෙයින් එම නිලධාරීන් ගන්නා වූ තීන්දු තීරණයන්ගේ අවංකභාවය කාල පමාවකින් තොරව ඒත්තු ගැන්විය හැකි පරිදි යම් යම් සීමාවන්ට යටත්ව හෝ විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම.

**(v).** නෛතික තත්ත්වයන් ගේ හා ගිණුම්කරණ ප්‍රමිතියන්ගේ විවිධ නිර්වචනයන් හා ව්‍යාතිරේඛයන් තිබිය හැකි වුවද ඒවාටම සීමා නොවී ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරණ තීරණයන්ට බලපෑම් කළ හැකි මට්ටමේ නිලධාරීන් හා ශ්‍රී ලංකා මහ බැංකුවට සම්බන්ධිත ආයතන අතර යම් බැඳියාවන්හි ගැටීම් පවතින්නේ නම් සද්භාවය පෙරදැරි කරගෙන සුදුසු අනාවරණයක්ද සහිතව සිය කාර්යයන් ඉටු කිරීමට මහ බැංකුවේ ඉහළ කළමනාකාරීත්වය කටයුතු කිරීම.

**(vi).** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලබන බොහෝ තීරණ සමස්ත ආර්ථිකයට දිගුකාලීනව බලපෑම් ඇති කරවන අතර එවැනි අතිශය වැදගත්, සංකීර්ණ හා සංවේදී තීරණයන් ගැනීමේදී නිවැරදි පදනමකින් එම තීන්දු තීරණ ගන්නේද යන්න ස්වාධීන පාර්ශ්වයකගේ පාරික්ෂාවන්ට සහ අධීක්ෂණයකට ලක්වීම ඉතා වැදගත් වනුයේ එකී තීරණයන්ගෙන් ජනිතවන යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵලවලටද සමස්ථ ජනතාවට මුහුණ දිමට සිදුවන හෙයිනි. ඒ අනුව එවැනි සංකීර්ණ තීරණ විධිමත් ඇගයීමකින් තොරව ඉතාමත් සරලව හා ක්ෂණිකව ගෙන එමගින් යම් අයහපත් ප්‍රතිඵල ඇති වී තිබේද යන්න පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු ඒ සඳහා බලවරමක් ඇති ආයතනයන්ට ලබා දීමට බාධා සිදුවන පරිදි මුදල් නීති පනතේ 45 වගන්තියේ සටහන් රහස්‍යතාවය සුරැකීමේ ප්‍රතිපාදන යොදා ගත නොහැකි වන පරිදි එම වගන්තිය සුදුසු පරිදි සංශෝධනයට ලක් කල යුතුය.

**(vii).** මෙම වාර්තාව සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා දුන් තොරතුරු අතර තිබූ රහස්‍ය හා සංවේදී තොරුතුරු නිවැරදිව හඳුන්වාදෙන ලෙස මහ බැංකු අධිපතිගෙන් ලිඛිතව ඉල්ලා සිටි අතර (ඇමුණුම 1 - හි ඇමුණුම xxxiv බලන්න)එයට ලබා දුන් පිළිතුරු (ඇමුණුම 1 - හි ඇමුණුම iii බලන්න ) අනුව ලබා දී ඇති තොරතුරු සියල්ලම රහස්‍ය තොරතුරු ලෙස සැලකීමට සිදුව තිබේ. එහෙයින් රාජ්‍ය විගණනය විසින් එවැනි තොරතුරුවලින් හඳුනාගනු ලැබූ තොරතුරු මෙම වාර්තාවට එලෙසම ඇතුළත් නොකර එම තොරතුරු පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා වෙත ලබා දෙන බවත් සඳහන් කළ යුතුව ඇත.

**(viii).** ප්‍රාථමික වෙළඳුන් අතර බැඳුම්කරවලට අදාළව සිදුවන අන්තර් ගනුදෙනු නියාමනය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් මාර්ගෝපදේශ මඟින් හඳුන්වා දිය යුතුය.

**(ix).** බැඳුම්කර වෙන්දේසියට අදාළව ප්‍රසිද්ධ කරනු ලබන වෙන්දේසිවල අවසාන දිනය හා වේලාව යම් යම් අවස්ථාවලදී දීර්ඝ කිරීම අනුමත කර තිබූ අතර එවැනි දීර්ඝ කිරීම් නොවැලැක්විය හැකි සාධාරණීකරණය කළ හැකි කරුණුවලට සීමා කළ යුතුය.

**(x).** සේවක අර්ථසාධක අරමුදල ලියාපදිංචි ප්‍රාථමික ගනුදෙනුකරුවකු නොවුවද ප්‍රාථමික ගනුදෙනු මෙන් ප්‍රාථමික වෙළඳපලෙන් බැඳුම්කර මිලදී ගැනීම සඳහා හැකියාව ලබා දී ඇත. එසේ වුවද සේවක අර්ථසාධක අරමුදල ප්‍රාථමික වෙළඳපලෙන් බැඳුම්කර මිලදී ගැනීමට විකල්පයන් ලෙස වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගෙන් ද්වීතියක වෙළඳපළෙන් බැඳම්කර මිලදී ගැනීමේ ප්‍රවණතාවයක් දක්වන බව නිරීක්ෂණය වේ. මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින අර්ථසාධක අරමුදල එම අධීක්ෂණයෙන් බැහැරව ස්වාධීනව කටයුතු කළ හැකි ප්‍රාථමික ගනුදෙනුකරුවකු බවට පත් කිරීම.

**(xi).** මේ වන විට ඉදිරි මාසයේ අවශ්‍යතාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගන්නා අතර අවම වශයෙන් එය ඉදිරි මාස තුනක කාලයක් දක්වා දීර්ඝ කිරීම.

**(xii).** ඉහත පරිදි මහ භාණ්ඩාගාරය ලබා ගන්නා ලද මුදල් අවශ්‍යතාවය රැස් කර ගන්නා ආකාරය කල් ඇතිව තීරණය කිරීම.

**(xiii).** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික ගනුදෙනුකරුවන් පිළිබඳ ප්‍රමාණවත් අධික්ෂණයක් කළ යුතු විම. එනම් පසුගිය කාලය තුළ එක් ප්‍රාථමික ගනුදෙනුකරුවකු බුන්වත්භාවයට පත්වීම හේතුවෙන් රජයද ඇතුළුව එම ගනුදෙනුකරුවකු සමග ගනුදෙනු කළ ආයෝජකයන් අසීරුතාවයට පත්ව ඇත. එවැනි තත්ත්වයන් වැලකෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඔවුන් මූල්‍ය ශක්තීන් ඇතුළු අදාල චර්යාවන් පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් කළ යුතු වීම.

**(xiv).** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති තොරතුරු අතර ඇති රහස්‍යභාවය සුරැකිය යුතු ලේඛන හඳුන්වාදෙන ලෙස මහ භාණ්ඩාගාර ලේකම්ගෙන් විමසන ලදී. ඒ සඳහා පිළිතුරු ලෙස මහා භාණ්ඩාගාර නියෝජිත ලේකම්වරයකු දන්වා තිබුණේ, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට අදාලව මහ භාණ්ඩාගාරයේ කාර්යයන් වර්ෂයේ විසර්ජන පනතින් අනුමත සීමාවන් තුළ රජයේ ණය අවශ්‍යතාවය මාසික පදනමින් ශ්‍රී ලංකාවේ මහ බැංකුව වෙත දැනුම් දිමට සීමා වන බවයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ අධීක්ෂණ කටයුතු භාර ප්‍රධාන ආයතනයක් ලෙස මහා භාණ්ඩාගාරයේ කාර්යභාරය ඉහතින් දක්වා ඇති සරල කාර්යයකට සීමා වන බවට විගණනයේදී එකඟ විය නොහැකි බව.

## 10.1 2015 -2016 මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සකස් කරන ලද විශේෂ විගණන වාර්තාවේ නිගමන -

**(i).** විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දෙනු ලැබූ වලක්වාගත හැකිව තිබූ රු.889,358,050 ක ඇස්තමේන්තුගත අවාසිය සහ එහි 5.2.3 ඡේදයේ දැක්වෙන වලක්වා ගත හැකිව තිබූ රු.784,898,755ත ඇස්තමේන්තු ගත අවාසිය ලෙස 2015 පෙබරවාරි 27 සහ 2016 මාර්තු 29 දින පැවති භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි දෙකේදී වලක්වා ගැනීමට හැකිව තිබූ එකතුව රු.1,674,256,805ක ඇස්තමේන්තුගත අවාසිය වලක්වා ගැනීමට කටයුතු නොකිරීම පිළිබඳව බලධාරීන් වගකිවයුතු බව නිගමනය කරනු ලබයි.

තවද, ඍජු ක්‍රමයට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය ගත් 2015 පෙබරවාරි 27 දින සිට 2016 මැයි මාසය දක්වා සිදුකර ඇති බැඳුම්කර නිකුත් කිරීම්වලට අදාලව ද ඇස්තමේන්තුගත වාසි හෝ අවාසි ගණනය කළහොත් ඉහතින් දක්වන ලද ඇස්තමේන්තුගත අවාසය තවදුරටත් ඉහළයාමේ හැකියාවක් පැවැතීමද බැහැර කළ නොහැකි බව නිගමනය කරනු ලබයි.

**(ii).** මෙම වාර්තාව සැකසීමේ දී විගණකාධිපති වෙත අනාවරණය වූ කරුණු සහ ඉහත සඳහන් ඡේද වලින් අවධාරණය කර ඇති කරුණු අනුව මහ බැංකු අධිපති විසින් ස්වකීය කාර්යය මෙහෙයවීමේ දී මහ බැංකු අධිපතිවරයෙකුගෙන් අපේක්ෂා කරනු ලබන මට්ටමේ වෘත්තීමය විචක්ෂණභාවයකින් (Professional Due Care) යුතුව කටයුතු කර ඇති බව තහවුරු නොවූ බව නිගමනය කරනු ලබයි.

**(iii).** මෙම වාර්තාව පිළියෙල කිරීමේදී විගණකාධිපති වෙත හිමි බලතල හා විෂය සීමාව තුල කටයුතු කර ඇති බව අවධාරණය කරනු ලැබේ. ඉන් ඔබ්බට සාපරාධී හෝ විගණකාධිපතිට නිගමනය කල නොහැකි මට්ටමේ නීති විරෝධී කටයුතු සිදු වී ඇත්දැයි යන්න මෙහිදී පරීක්ෂාවට ලක් නොවුනු හෙයින් එවන් පරීක්ෂාවක් අවශ්‍යය යැයි හැඟී යන්නේ නම් ඒ සඳහා විශේෂිත වූ ආයතනයන්හි සහය ලබා ගැනීම සුදුසු බව නිගමනය කරනු ලබයි. [33]

---

[33] ඉහත නිගමන පිළිබඳව මතු දැක්වෙන කරුනු කාරක සභාව මගින් නිරීක්ෂණය කෙරේ. මෙම විගණනය පිළිබඳ කටයුතු වලදී විගණකාධිපති දෙපාර්තමේන්තුවට තිබූ විෂය පථය සීමා වීම ගැන විගණකාධිපති වාර්තාවේ කරුණු දක්වා ඇති අතර ඒවා මෙසේය.

**3.** **<u>විෂය පථය සීමා වීම (</u>**විගණකාධිපති විසින් අනාවරණය කර ගත් තොරතුරු අනුව ඔහුගේ විශේෂ විගණන වාර්තාවට කරන ලද යාවත්කාලීන කිරීම් ඇතුලත් වාර්තාවේ අඩංගු පරිදි) මෙම වාර්තාවෙන් ඉස්මතු කර ඇති නිරීක්ෂණයන් තුළින් නිගමනයන්ට එළඹීමේදී මාගේ විෂය පථය මතු දැක්වෙන සීමා කිරීම්වලට යටත්ව තිබූ බව අවධාරණය කරනු ලැබේ.

3.1 විෂයගත ක්‍රියාවලියටඅදාළව මහ බැංකුව යම් මෙහෙයුම් අත්පොතක දැක්වෙන පිළිවෙත් අනුව කටයුතු කළ බව සඳහන් කර තිබුණද, එය එහි මුදල් මණ්ඩලය විසින් හෝ වෙනත් අධිකාරී බලයක් සහිත ආයතනයක් විසින් අනුමත කළ සමස්ථ මෙහෙයුම් අත්පොතක් නොවන බව මා වෙත වාර්තා වී තිබීම.

3.2 විෂයගත ක්‍රියාවලියපිළිබඳපරීක්ෂණයක්පැවැත්වීමේ කාර්යය විගණකාධිපති වෙත පැවරුනු දිනය හා අදාල සිද්ධීන් සිදු වූ දිනයන් අතර සැලකිය යුතු කාල පරතරයක් තිබීම.

3.3 අදාලවිෂයගතකරුණු පිළිබඳ විෂය බද්ධ පෘථුල දැනුමක් සහිත මූල්‍ය හා ආර්ථික විශේෂඥයින්ගේ සහය ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හා මෙම වාර්තාවේ පළමු ඡේදයේ දක්වා ඇති රහස්‍යභාවය පිළිබඳව ගැටළු සහගත තත්ත්වය නිසා එවැනි සහයක් ලබාගැනීම ප්‍රශ්ණකාරි වීම.

3.4 ඉහත 3.3 ඡේදයේ සඳහන් විශේෂඥයින් ශ්‍රී ලංකා මහ බැංකුව සතුව සිටියද එම නිලධාරීන්ගේ සහය අපක්ෂපාතී ලෙස ලබාගත හැකිද යන්න ප්‍රශ්ණකාරි වීම.

3.5 අදාලවිෂයටසම්බන්ධිතඉතාවැදගත්ද්විතිකවෙළඳපලපිළිබඳවතොරතුරුඑමතෙවනපාර්ශවයන්වෙතින් ඍජුව ලබාගැනීමට හෝ තහවුරු කරවා ගැනීමට අධිකාර බලයක් විගණකාධිපති වෙත නොතිබීම.

3.6 ශ්‍රී ලංකා මහබැංකුවට මෙම වාර්තාවේහි දක්වා ඇතිප්‍රාථමික ගනුදෙනුකරුවන් වෙත ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කිරීමේ හැකියාවක් තිබුණේ ද යන්න අනාවරණය කරගැනීමේ හැකියාවක් නොවීම.

3.7 ප්‍රාථමිකගනුදෙනුකරුවන් හා ප්‍රාථමික ගනුදෙනුකරුවන් අතරද, මහ බැංකු අධිපති සහ ප්‍රාථමික ගනුදෙනුකරුවන් අතරද එකිනෙක පුද්ගලයන් අතර ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කිරීමේ හැකියාවක් තිබුණේද යන්න අනාවරණය කර ගැනීමේ හැකියාවක් නොවීම.

3.8 ශ්‍රී ලංකා මහබැංකු නිලධාරීන් හා ප්‍රාථමික ගනුදෙනුකරුවන් අතර සිදුවන දුරකථන සංවාදපටිගත කර නොතිබීම නිසා එම තොරතුරු පරීක්ෂා කළ නොහැකි වීම.

3.9 2015 පෙබරවාරි 27 දිනවෙන්දේසියසිදු වූ අවස්ථාවට අදාල පටිගත කළ සජීවි දර්ශණ භෞතිකව පරික්ෂා නොකිරීම.

3.10 මෙම වාර්තාව සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා දුන් තොරතුරු අතර තිබූ රහස්‍ය හා සංවේදී තොරතුරු නිවැරදිව හඳුන්වාදෙන ලෙස මහ බැංකු අධිපතිගෙන් ලිඛිතව ඉල්ලා සිටි අතර එයට ලබා දුන් පිළිතුර අනුව ලබා දී ඇති තොරතුරු සියල්ලම රහස්‍ය තොරතුරු ලෙස සැලකීමට සිදුව තිබීමහේතුවෙන් වාර්තා කිරීමට සීමා පැවතීම.

- ඉහත කී විෂය පථය සීමාවීම් මෙන්ම මෙම පරීක්ෂණයේදී ඉදිරිපත් වූ බැඳුම්කර හා සම්බන්ධ ක්‍රියාවලියේ ඇති අනෙකුත් දුර්වලතාද එලෙසම මෙම ක්‍රියාවලියට අදාලව ව්‍යවහාරික විගණනය නොපැවැත්වීමද යන කරුනු අනුව විගණකාධිපතිවරයාගේ විශේෂයෙන්ම බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පවතින රීතිය වෙන්දේසි ක්‍රමය බවත් ව්‍යතිරේකය සෘජු නිකුතු ක්‍රමය බවත් යන මූලධර්මය ඉහත කී වාර්තාව සකසන අවස්ථාවේ විගණකාධිපතිවරයා වෙත එම අවස්ථාවේදී අවශ්‍ය සියලුම ලිපි ලේඛන නොමැතිවීම නිසා ඉහත i, ii, iii යන සාවද්‍ය නිගමන වලට එළඹී ඇත. තවද මෙම කෙටුම්පත සාකච්ඡා කරන අවස්ථාවේදී මතුවූ කරුණු පැහැදිලි කර ගැනීමට මේ පරීක්ෂණය අතර දී ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරීවරයා මගින් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ගෙන්වා ගන්නා ලදි. 2016.10.21 , 2016.10.24 දරන ලිපි දෙකේ සඳහන් කරුණු ගැනද විගණකාධිපතිවරයා වෙත ප්‍රවේශයක් නොතිබුණු බව පෙනේ. එම කරුණු අලුත්ම කරුණු වේ. එම ලිපි දෙක මෙම වාර්තාවේ ඇමුනුම් ලෙස ඇතුලත් කළයුතුව ඇත. ඒ අනුව ප්‍රශ්නගත බැඳුම්කර ගැන විගණකාධිපතිවරයා වෙත තිබූ සීමාවන්ද නිවැරදි තොරතුරු ඉහත කී වාර්තාව සකසන විට විගණකාධිපතිවරයා වෙත මහ බැංකුව මගින් ලබා නොදීම මගින් ඉහත i, ii, iii ගැන නිගමන වලට එළඹී ඇති බව මනාව පැහැදිලි වේ. මෙය විගණකාධිපතිවරයා වෙත කරනු ලබන දෝෂාරෝපණයක් නොව නිවැරදි, සත්‍ය තොරතුරු මත නිවැරදි නිගමනයකට එළඹීමට විගණකාධිපතිවරයා වෙත අවශ්‍ය සාධක මුල් අවස්ථාවේ නොතිබුණ බව කාරක සභාවේ අදහසයි.

- 2016.10.21 දින ලිපියේ සඳහන් කරුණ සහ 2016.10.24 දින සඳහන් කරුණු එලෙසින්ම වාර්තාවේ උපුටා දැක්වීම සුදුසු වේ. ඒ අනුව අත්පොතේ සඳහන් සෘජු ක්‍රමයට ලබා ගන්නා බැඳුම්කර වලට සම්බන්ධ වන ක්‍රියාවලිය 2008 වසර අවසානයෙන් පසු මහ බැංකුව විසින් දීර්ඝ කර නොමැති බව පැහැදිලිය. එනම් 2008 වසර අවසානයේ සිට 2009 -2014 දක්වා වසර වල සෘජු ක්‍රමයට නිකුත් කරන ලද බැඳුම්කර නිකුත් කර ඇත්තේ නීතියෙන් පරිබාහිරව බව කාරක සභාවේ අදහසයි. එම නීති විරෝධී සෘජු බැඳුම්කර මගින් රටට සිදුවූ බලපෑම ගැන විධිමත්ව පරීක්ෂණයක් පැවැත්වීම අතවශ්‍ය වේ.

- එසේ හෙයින් ඇස්තමේන්තුගත අවාසිය ගැන විගණකාධිපතිවරයාගේ නිගමනය නිසි කරුණු සහ අදාල නීතිමය තත්ත්වයට සහ ඉදිරිපත් වූ සාක්ෂිවලට පටහැනි බව කාරක සභාවේ අදහසයි.

- තවද ඉහත විස්තර කළ පරිදි 2008 - 2016 දක්වා සම්පූර්ණ කාලයට අදාලව නිසි විගණනයක් ඉදිරියේදී කරන්නේ නම් බැඳුම්කර ගැන සහ ඊට අදාලව රටට සිදුවී ඇති බලපෑම ගැන වඩා නිවැරදි නිගමනයක් කළහැකි බව කාරක සභාවේ හැඟීමයි.

- රජ හා සම්බන්ධ මූල්‍ය කටයුතු හා සම්බන්ධවන පෞද්ගලික ආයතන ගැන විස්තරාත්මක නිගමනයක් කිරීමට විගණකාධිපතිවරයාට අවශ්‍ය බලය ලබා දීම ඉතා වැදගත්ය. විශේෂයෙන්ම ප්‍රාථමික ගණුදෙනු කරුවන්ගේ සහ ද්විතීයික වෙළෙඳපොල තුල ක්‍රියාත්මක වන ආයතන වල ගණුදෙනු ගැන සොයා බැලීමේ පූර්ණ බලයක් විගණකාධිපතිවරයාට තිබිය යුතුය. ඊට අදාල නව නීති සැකසීම සුදුසු බව කාරක සභාවේ අදහසයි.

- එලෙසම මෙම බැඳුම්කර සිදුවීම ගැන මතුවන තවත් වැදගත් කරුණක් වන්නේ මහ බැංකුවේ එක් නිලධාරියෙකු පමණක් නොව මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ සියලුම නිලධාරීන් එක්ව සහ හෝ වෙන් වෙන්ව මෙම ක්‍රියාවලිය ගැන වගකිවයුතුව ඇති බව. ඉහත කී පරිදි මතුවී ඇති අවාසිය ගැන ප්‍රශ්නයක් එක් පුද්ගලයෙකුගේ තනි තීරණයකට වඩා කණ්ඩායමකගේ තීරණයක් බව අතිරේක ණය අධිකාරී ආචාර්ය ඒ. ඉසඩ් එම්. අසීම් මහතා ඔහුගේ සාක්ෂි වල දක්වා ඇත.
- මහ බැංකුව තුල ඇති බැඳුම්කර වෙළෙඳාම හා සම්බන්ධ රහසිගත තොරතුරු දරා සිටින පුද්ගලයන් එම තොරතුරු කෙතරම් දුරට ආරක්ෂා කරන්නේද යන්න ගැන මෙම පරීක්ෂණයේදී හෙලිවූ සාක්ෂි අනුව සැකයක් ඇති වී ඇත. විශේෂයෙන්ම මෙම ප්‍රශ්නගත 2015.02.27 දිනට අදාල බැඳුම්කර වෙන්දේසිය හා සම්බන්ධ ප්‍රාථමික ගණුදෙනු කරුවන්ට අමතරව වෙනත් බාහිර පුද්ගලයන්ද දැන සිටි අතර, මහ බැංකුවේම සේවකයෙකු ලක්ෂ 7 1/2 ක මුදලක් සඳහා බැඳුම්කර සඳහා ඉල්ලීමක් කර ඇති බවද එම තැනැත්තා මහ බැංකුවේ අනෙකුත් සේවකයන් සමග කළ සාකච්ඡා අනුව රහසිගතව තිබිය යුතු බවට සාධාරණව අපේක්ෂා කළ තොරතුරු බොහෝ දෙනෙකු අතර ප්‍රචාරය වී ඇති බව පෙනේ.එම තොරතුරු හෙලිදරව් කිරීම කළ නිලධාරීන් කවුද , මෙම එක් එක් නිලධාරියා විසින් එම තොරතුරු බැහැර කරන ලද්දේද යන්න විශේෂයෙන්ම පරීක්ෂා කළයුතුව ඇත. එසේ සොයා ගැනීම සඳහා අවශ්‍ය කරන සංඛ්‍යාංක පා සටහන් ( digital foot prints) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සංඛ්‍යාංක පා සටහන් නිරීක්ෂණය කළයුතුය. ඉතිහාසයේ සිදුවූ සිදුවීම් මෙන්ම අනාගතයේ මහ බැංකුවේ බැඳුම්කර ක්‍රියාවලිය ගැන විශ්වාසය තහවුරු කිරීම සඳහා එම පියවර ගතයුතුව ඇත.
- අභ්‍යන්තර තොරතුරු පිටට ගලා යාම හරහා පුද්ගලික ගැණුම්කරුවන් එයින් ලාභ ගෙන ඇත. පර්පචුවෙල් ට්‍රෙෂරීස් ආයතනයට එවැනි අභ්‍යන්තර තොරතුරු ලැබුන බවට සාධාරණ සැකයක් මතුවේ.
- බැඳුම්කර ක්රියාදාමය තුල අයුතු ලෙස වාසි ලබා ගැනීම සඳහා ප්රාථමික වෙළෙඳුන් මහ බැංකුවේ ඇතැම් නිලධාරීන්ද සේවක අර්ථ සාධක අරමුදල , ලංකා බැංකුව ඇතුලු බැංකුවල ඇතැම් නිලධාරීන් අයතා ලෙස කටයුතු කරන බවත් ඒ හරහා එම නිලධාරීන් සොර එකමුතුවක් ( Rogue ring) ලෙස කටයුතු කර ඇති බව කාරක සභාවේ නිරීක්ෂණයයි. මෙය වැලැක්වීමට ගතයුතු පියවර ඉතා ඉක්මණින්ම නොගතහොත් බැඳුම්කර ක්‍රියාවලිය වෙන්දේසියෙන් සිදු වුවද ඍජු ක්‍රමය අනුව සිදුව වුවද රටට පාඩු සිදුවීම වැලැක්විය නොහැක. ඒ අනුව අනාගතයේදී සිදුවූ වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන විට වෙන්දේසි ක්‍රමය මෙන්ම ඍජු ක්‍රමයට අදාලව පියවර ගතයුතුව ඇත.
- 2015.02.27 දින පෙරවරුවේ දින 3 රීතිය ලෙස හඳුන්වනු ලැබූ පොලී අනුපාතය පාලනය කිරීමට පවත්වාගෙන යන ලද එම වෙනස හේතුවෙන් වෙළෙඳපොල තුල 5% සිට 6.5% දක්වා එනම් 1.5% කින් ඉහල යන ලදි. මෙය වෙළෙඳපොල පොලී අනුපාතය ගැන ඉතා බරපතල ලෙස බලපාන කරුණකි. මෙම තොරතුරු ප්‍රසිද්ධ කලේ 2015.02.27 සවසයි. එනම් ප්‍රශ්නයට ලක්වූ වෙන්දේසියෙන් පසුවයි. මෙම තොරතුරු සියලුම ප්‍රාථමික වෙළෙඳුන්ට වෙන්දේසියට ප්‍රථම ලබා දී තිබුනේ නම් වඩාත් සාධාරණ අවස්ථාවක් සියලුම ප්‍රාථමික වෙළෙඳුන්ට ලැබෙන අතර මතුවූ ප්‍රශ්නය ඇති නොවන්නට ඉඩ තිබුණි.
- එලෙසම 2016.03.29 දින ජාත්‍යන්තර වෙළෙඳපොලෙන් ඇමරිකන් ඩොලර් බිලියන 3 ක ස්වෛරී බැඳුම්කර ගැනීමට ගත් තීරණය එදින වෙන්දේසිය අවසන් වූවායින් පසු නිවේදනය කිරීම වෙනුවට වෙන්දේසියට කලින් නිවේදනය කර තිබුණා නම් සියලුම ගැණුම් කරුවන්ට එම තොරතුරු දැන ගැනීමේ හැකියාව තිබුණි. එසේ වූවා නම් පොලී අනුපාතය බොහෝ දුරට පහත වැටීමට ඉඩ තිබුණි.

- රුපියල් බිලියන 1 ක් සඳහා බැඳුම්කර වෙන්දේසිය පවත්වන දිනය අවසානයේ බිලියන 10 ක් ලබා ගැනීම විවේචනයට ලක්වී ඇත. මෙයට හේතුවී ඇත්තේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය හැර අනෙක් ප්‍රාථමික වෙළෙඳුන් එවැනි තත්වයක් අපේක්ෂා නොකරන බවට ඇතිවී ඇති හැඟීමයි. එසේ අනෙකුත් ප්‍රාථමික වෙළෙඳුන් ඒ තොරතුරු දැන සිටියේ නම් වඩාත් සාධාරණ තරඟයක් අපේක්ෂා කළ හැකිව තිබුණි. මෙවැනි තත්ත්වයක් වැලැක්වීමට නිර්දේශ මෙම වාර්තාවේ නිර්දේශ කොටසේ අන්තර්ගතව ඇත. ඒ අනුව ඉහත කී ආකාරයට දැන්වීමෙන් ඉල්ලා සිටින ලද ප්‍රමාණයට වඩා ඉතා අසාමාන්‍ය මුදලක් වෙළෙඳපොලෙන් ලබා ගැනීම නිසා ඇතිවී ඇති ප්‍රශ්නය ගැන ටෙන්ඩර් කමිටුවද වගකිවයුතුව ඇත.

  2016.03.29 වන දින වෙන්දේසියේදී පර්පචුවෙල් ට්‍රෙෂරීස් ආයතනය විසින් ලබා ගන්නා ලද බැඳුම්කරවලට ගෙවීම සඳහා ඔවුන් සතුව මුදල් නොතිබූ හෙයින් ඒ සඳහා මහ බැංකුවෙන් ඍජුවම මුදල් සැපයීම සිදුවූයේ කෙසේද යන්න ගැන නිසියාකාර පැහැදිලි කිරීමක් නැත. ඒ ගණුදෙනුව සිදුවූයේ කෙසේද යන්න ගැන මහ බැංකුවෙන් කිසිම ඉදිරිපත් කිරීමක් සිදුවී නැත. 2016.03.29 වන දින වෙන්දේසියට ඉදිරිපත් වූ රු: බිලියන 29 ක මුදලකට වටිනා බැඳුම්කර ලබා ගත් පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම එම බැඳුම්කර සඳහා මහ බැංකුවෙන්ම අඩු පොලියකට ණයක් ලබාගෙන ඇත. එම තත්ත්වය තුල පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම යම් අයුතු වාසියක් මෙම ක්‍රියාවලිය තුලදී ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ. මෙම නිශ්චිත කරුණ ගැන විමර්ෂණය කොට එයට අදාලව වගකිවයුතු නොවන්නේ නම් නිශ්චය කොට ඉන් රටට සිදුවී ඇති අලාභය වගකිවයුතු අයගෙන් අයකර ගැනීමද ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමද කළයුතුය.

විගණකාධිපති වාර්තාවේ සියලු නිර්දේශ හා නිගමන පිළිගන්නා කාරක සභාව එම නිර්දේශ සහ නිගමන අනුමත කොට ක්‍රියාවට නඟන ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි.

## 11 කාරක සභාවේ නිර්දේශ

2015-2016 යන වසර දෙක තුලදී ශ්‍රී ලංකා මහ බැංකුවේ සිදු කරන ලද බැඳුම්කර නිකුත් කිරීම්වලදී, අප පරික්ෂාවට භාජනය කල 2015පෙබරවාරි 27වන දින ගනුදෙනුවේදි එවකට මහ බැංකුවේ අධිපතිව සිටි අර්ජුන මහේන්ද්‍රන් මහතා මැදිහත්වීමක් හෝ බලපෑමක් සිදුකළ බවට සාධාරණ සැකයක් ඇතිවිය හැකි ආකාරයේ සාක්ෂි හා කරුණු කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

කාරක සභාව විසින් කරන ලද පරික්ෂණ හා සාක්ෂි විභාග කිරීම්වලදී, ඇතැම් ගනුදෙනුවල උපරිම පාරදෘශ්‍යභාවය නොමැති බවද, එහිදී කටයුතු කළ ආකාරයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්වාසනියත්වය පළුදු වී ඇති බවද යන්න පිළිබඳව සාධාරණ සැකයක් ඇතිවිය හැකි ආකාරයේ සාක්ෂි හෝ කරුණු කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

එසේම, ඒ කාලයේ සිදුවී ඇති බැඳුම්කර ගනුදෙනු හරහා ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගෙන් එක් ආයතනයක් වන පර්පෙචුවල් ට්‍රෙෂරිස් ඉතා විශාල මූල්‍යමය ලාභ උපයාගෙන ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

එබැවින්, -

- එසේ මෙම ගනුදෙනු වලට වගකිව යුතු මහ බැංකුවේ නිලධාරින් හා ආයතනයන්ට එරෙහිව පැනවිය යුතු දණ්ඩනයන් හා වෙනත් නියමයන් නිර්දේශ කිරීම සඳහාත්,
- එකී අයථා කටයුතු හේතුවෙන් රජයට හා මහජනතාවට සිදුවී ඇති අලාභය හෝ පාඩුව එකී වගකිව යුතු පුද්ගලයන්ගෙන් හෝ ආයතනවලින් අයකර ගතයුතු බව නිර්දේශ කරන අතර ඒ සඳහා අවශ්‍ය අධිකරණමය ක්‍රියා මාර්ග ගත යුතු බව කාරක සභාව අවධාරණය කරයි.
- එසේම, නිර්දේශිත දණ්ඩනයන් හෝ වෙනත් නියමයන් අවශ්‍ය අයුරින්ම ක්‍රියාත්මක වන බව සොයාබැලීම සහ සහතික කිරීම සඳහාත්, ඒ පිළිබඳව පසු විපරම් කිරීම සඳහාත්,
- එමෙන්ම, එබඳු ආකාරයේ කටයුතු මින් ඉදිරියට සිදු නොවීම සඳහා අවශ්‍යයෙන්ම ගත යුතු සියළු පියවර, ආවේක්ෂණ හා තුලනයන් ක්‍රියාත්මක කිරීම සඳහාත්,
- එකී ආවේක්ෂණ හා තුලනයන් මහ බැංකුව විසින් නිසි පරිදි ක්‍රියාවේ යොදවන බවට සොයා බැලීම සහ සහතික කිරිම සඳහාත්, ඒ පිළිබඳව පසු විපරම් කිරීම සඳහාත්, පාර්ලිමේන්තුව සෘජුව මැදිහත් විය යුතු අතර එය පාර්ලිමේන්තුව සතු රාජ්‍ය මූල්‍ය පාලනයට අදාල මූලික වගකීම බව කාරක සභාව අවධාරණය කරයි.

එසේ ක්‍රියාත්මක කිරීමෙන් රජයට සිදුවූ අලාභයන් අය කර ගැනීම සහ පවතින නීති යටතේ ක්‍රියාත්මක වීම පාර්ලිමේන්තුව සතු වගකීමක් ලෙස ඉතා ඕනෑකමින් කාරක සභාව නිර්දේශ කරයි. එසේම යලි මෙවැනි තත්ත්වයක් ඇති වීම වැලැක්වීමට පියවර ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුව තුල සහ ඊට අනුශාංගික අනෙකුත් ආයතන තුල සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වීම එම ආයතන විසින් පාර්ලිමේන්තුවට සහතික විය යුතු බව කාරක සභාව අවධාරණය කරයි.

එසේම,
රටේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වගකිව යුතු ප්‍රධානතම ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ටෙන්ඩර් නිකුත්කිරීම් හා ප්‍රදානය කිරීම්වලදී ඒ පිළිබව කටයුතු අධික්ෂණය කිරිම සඳහාත් අවශ්‍ය සියලු පසු විපරම් කිරීම සඳහාත් විධායකය මගින් විශේෂ නිරීක්ෂණ කණ්ඩායමක් වහාම පත් කළ යුතු යයිද කාරක සභාව නිර්දේශ කරයි.

1. මහ බැංකුවේ නිලධාරීන් විසින් එක් තනි ආයතනයක් ලෙස පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනයට අයථා වාසියක් ඉපයීමට හැකි වන ලෙස කටයුතු කිරීමටත් එසේම ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස අදාල ආයතනයද එම වාසි ලබා ගැනීමේ අරමුණ සහිතව ක්‍රියාත්මක වීමත් මහ බැංකුවේ මූල්‍ය පාලනයේ විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය සඳහා බරපතල ලෙස අහිතකර තත්ත්වයක් වන බැවින් එම තත්ත්වය පිළිබඳව නීතිමය බලය සහිත පිළිගත් ආයතනයකින් පුළුල් විමර්ශනයක් කිරීමත් නැවත එවැනි තත්ත්වයක් ඇති වීම වැලැක්වීමට ගතහැකි සියළු පියවර ගැනීමත් නිර්දේශ කරයි.

2. බැඳුම්කර ක්‍රියාවලිය හරහා රටට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමේදී රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි රාජ්‍ය මූල්‍ය ආයතන සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව නිර්දේශ කරන කාරක සභාව, ඒ සඳහා ප්‍රතිපාදන සලසන වගන්ති මහ බැංකුවේ මෙහෙයුම් අත්පොත ඇතුළු අනෙකුත් අදාල ලේඛන වලට ඇතුලත් කළයුතු යැයි මහ බැංකුවට නිර්දේශ කරයි.

3. මෙම ප්‍රශ්නගත බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස ඉතා කෙටි කාලයක් තුල අධික ලාභයක් උපයා ඇති අතර එසේ ලාභ ඉපයීමේ ක්‍රියාවලිය පිළිබඳ පූර්ණ බලැති යාන්ත්‍රණයක් මගින් පරීක්ෂණයක් කළ යුතු අතර එමගින් ඔවුන්ගේ කටයුතු හරහා මහ බැංකුවට හා රජයට මූල්‍යමය පාඩුවක් සිදුවී ඇත්දැයි ඉතා කඩිනමින් අනාවරණය කර ගැනීම මහ බැංකුවේ වගකීමක් ලෙස කාරක සභාව තරයේ විශ්වාස කරයි.

4. ඉදිරියේදී මෙවැනි මූල්‍ය අක්‍රමිකතා ඇතිවීම වැලැක්වීම සඳහා ප්‍රාථමික වෙළෙඳුන්ගේ වෙළඳපොළ කටයුතු සහ ද්විතියික වෙළඳපොළ ක්‍රියාකාරීත්වය පිළිබඳ පසු විවරණය කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම නිර්දේශ කරන අතර එමගින් මහ බැංකුව රජයේ මූල්‍ය අවශ්‍යතා සඳහා මූල්‍ය සම්පාදනය සිදුකරන ආකාරය පසු විපරම් කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

5. මේ දක්වා යාවත්කාලීන නොකරන ලද රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තු මෙහෙයුම් අත්පොත වහාම යාවත්කාලීන කළ යුතු අතර, එහි බැඳුම්කර හරහා රජයට මූල්‍ය සම්පාදනය කිරීමේදී එසේ මූල්‍ය සම්පාදනය කළ හැකි රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛතාවය දීමේ ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු බව නිර්දේශ කරයි.

6. මෙම ප්‍රස්තුත බැඳුම්කර ගනුදෙනුව සඳහා හිටපු මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා ඍජුවම වගකිව යුතු අතර ඔහුට සහ මහ බැංකුවේ අදාල නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කරයි.

7. මෙවැනි ගනුදෙනු වලදී විනිවිදභාවය සහ මහ බැංකුවේ විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සැකසීම සහ දැනට පවත්නා විනිමය කොමිෂන් සභා පනත ඇතුළු අදාල නීතිරීති අණ පනත් කඩිනමින් සංශෝධනය කළයුතු බව නිර්දේශ කරයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පාලනය සම්පූර්ණයෙන්ම පැවරී ඇති මෙම උත්තරීතර පාර්ලිමේන්තුව වෙත, කාරක සභාවට මෙතෙක් ඉදිරිපත් වී ඇති සියළු ලේඛන, තොරතුරු හා සාක්ෂි (එකී ඇතැම් තොරතුරු සංවේදී යයි ප්‍රකාශ වුවද) ඉතා ඉක්මනින් ඉදිරිපත්කිරීම කාරක සභාවේ දැඩි වගකීමක් බවද කාරක සභාව විශ්වාස කරයි.

එම වගකීමට අනුව මෙම නිර්දේශ සහ විගණකාධිපතිවරයාගේ නිර්දේශ හා නිගමන සහිත වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අතර මෙම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු පාර්ලිමේන්තුව තුල ඒ පිළිබඳව විවෘත සංවාදයක් ඇතිකළ යුතු බවටත් කාරක සභාව නිර්දේශ කරයි.